

# 12 ශ්‍රේණිය

# බෞද්ධ ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශය

(2017 වසරේ සිට ක්‍රියාත්මක වේ.)






ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**ජාතික අධ්‍යාපන ආයතනය**

මහරගම, ශ්‍රී ලංකාව


**Web**| www.nie.lk **Email**| info@nie.lk

# බෞද්ධ ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)




ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව



වෙබ් අඩවිය : **www.nie.lk**

විද්‍යුත් තැපැල : **info@nie.lk**

# බෞද්ධ ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)


**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

බෞද්ධ ශිෂ්ටාචාරය

12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2017

C ජාතික අධ්‍යාපන ආයතනය

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :

මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය සම්බන්ධීකරණය** : පූජ්‍ය උඩුගම සුදස්සී හිමි,
දෙපාර්තමේන්තු ප්‍රධාන,
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

**විෂය විශේෂඥ උපදෙස් :**

**අතිපූජ්‍ය ගන්තුනේ අස්සජී මහානායක මාහිමිපාණන් වහන්සේ** - විශ්‍රාමික කථිකාචාර්ය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි** - විශ්‍රාමික මහාචාර්ය,
කැලණිය විශ්වවිද්‍යාලය.

**ලේඛක මණ්ඩලය :**

**මහාචාර්ය පූජ්‍ය තැඹිලේ ධම්මරතන හිමි** - මහාචාර්ය,
කැලණිය විශ්වවිද්‍යාලය.

**පූජ්‍ය උඩුගම සුදස්සී හිමි** - දෙපාර්තමේන්තු ප්‍රධාන,
ආගම් හා සාරධර්ම
අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

**උදිත ගරුසිංහ මහතා** - මහාචාර්ය,
කැලණිය විශ්වවිද්‍යාලය.

**ආචාර්ය කේ.ජී. විරසේන මහතා** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**ආර්.ජී. ගුණවර්ධන මහතා** - ගුරු උපදේශක,
කලාප අධ්‍යාපන කාර්යාලය,
ගිරිඋල්ල.

**ජී.ආර්.එම්.ජී. ගම්ලත් මහතා** - ගුරු සේවය,
ධර්මපාල මහා විද්‍යාලය,
ඇරැව්වල, පන්නිපිටිය.

**ජී. ඩබ්ලිව්. එම්. අනුරා වීරසූරිය මහත්මිය** - ගුරු සේවය,
කො/ ගෝතමී බාලිකා විද්‍යාලය,
කොළඹ 10.

**විෂය සංස්කරණය :**

**පූජ්‍ය උඩුගම සුදස්සී හිමි** - දෙපාර්තමේන්තු ප්‍රධාන,
ආගම් හා සාරධර්ම
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**එස්.බී.එම්. නිමල් ධර්මසිරි මහතා** - අධ්‍යාපන අධ්‍යක්ෂ,
ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
බත්තරමුල්ල.

**භාෂා සංස්කරණය :**

**ශ්‍රීනාත් ගණේවත්ත මහතා** - භාෂා සංස්කාරක

**පරිගණක වදන් සැකසුම :**

**මංගලිකා විජේරත්න මහත්මිය** - ජාතික අධ්‍යාපන ආයතනය

**විවිධ සහය :**

**එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය** - ජාතික අධ්‍යාපන ආයතනය

**ඩයස් අමරසිංහ මහතා** - ජාතික අධ්‍යාපන ආයතනය

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කාලීන අවශ්‍යතා පදනම් කොට 2009 වසරේ දී අ.පො.ස. (උ.පෙළ) පන්තිවල අදාළ විෂයමාලා වෙනස්කම්වලට අනුකූල ව තව දුරටත් නවීකරණයට භාජනය කරමින් 2017 වර්ෂයේ සිට පද්ධතිය තුළ ක්‍රියාත්මක වන 12 ශ්‍රේණිය සඳහා වූ විෂයමාලා වෙනස් වීම් සහිත මෙම ගුරු මාර්ගෝපදේශය ඔබ අතට පත් වනු ඇත.

නව සහස්‍රයේ අභියෝග ජය ගැනීමට වැර දරන සිසුන් තුළ ගුරු පරපුර විසින් සාර්ථක ජීවන ගමනක් සඳහා මඟපෙන්වීම උදෙසා ප්‍රගුණ කළ යුතු නිපුණතා හා නිපුණතා මට්ටම් නිවැරදි පෙළ ගැස්වීමකට හා සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමකට මෙම මාර්ගෝපදේශය මඟින් භාජනය කරනු ලැබ තිබේ. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදක ව ඉටු කිරීම සඳහා පෙර අත්දැකීම් ද ප්‍රබල ලෙස සැලකිල්ලට ගෙන මෙම විෂයමාලා සම්පාදකවරු විසින් ගුරු මාර්ගෝපදේශය ඔබ වෙත සංග්‍රහ කොට ඇත. මෙම විෂයධාරාවට අදාළ ව තමන්ගේ නව නිර්මාණාත්මක හැකියාව එක් කොට ගනිමින්, අනුමත කොට ඇති විෂය නිර්දේශය නිපුණතා පාදක ව අනාගත අපේක්ෂණ කරා දරුවන් පෙළ ගැස්වීමට ඉගෙනුම්- ඉගැන්වීම් කාර්ය සඳහා යොදා ගැනීම ගුරු භවතුන්ගේ කාර්යයකි.

මෙය ඔබ අතට පත් වූ වහා ම මෙහි ඇති විෂය නිර්දේශයෙහි වැදගත්කම හා පෙළගැස්ම පළමු ව මනා ව වටහා ගත යුතු ය. අනුමත කාලච්ඡේද සියල්ල සැලැකිල්ලට ගෙන වාරයට නියමිත විෂය කොටස් හඳුනා ගනිමින් වාර සටහන් හා දින සටහන් ක්‍රමානුකූල ව නිවැරදි ව සකස් කර ගැනීමට වගබලා ගැනීම ඔබ සතු යුතුකමක් බව සිහිපත් කරමි.

පැවති ගුරු මාර්ගෝපදේශය හා සැසඳීමේ දී සැම නිපුණතා මට්ටමක් ම ඉටු කර ගැනීම සඳහා අදාළ ඉගනුම් පල කීපයක් හඳුන්වා දී ඇත. මෙය මෙම විෂය නිර්දේශයට නව ප්‍රවණතාවකින් යුතු එක් කිරීමක් ලෙස හඳුන්වා දිය හැකි ය. එම ඉගෙනුම් පල ඉටු කර ගැනීමටත් ඒ මඟින් නිපුණතා මට්ටම සාක්ෂාත් කර ගැනීමටත් අවැසි පහසුව සැලසීම උදෙසා උපදෙස් ලබා දී ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී ගුරු භවතුන්ට තම අභිමතය පරිදි නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීම සඳහා නිපුණතා පාදක ක්‍රමවේදයට ගැළපෙන නිදහස් විකල්ප ඉගෙනුම් ක්‍රමවේද භාවිත කිරීමට අවස්ථාව සැලසේ. ඔබ යොදා ගන්නා ඉගෙනුම් ප්‍රවේශය සිසු මනසට ගැළැපෙන, කුතුහලය උපදවන, පෙර අත්දැකීම් ද සැලකිල්ලට ගත් සතුටුදායක කාර්යක්ෂම ක්‍රමවේදයක් වීම ඉතා වැදගත් වේ.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා ලබා දී ඇති උපදෙස් අනිවාර්ය වූවක් නොවන අතර අදාළ කටයුත්ත නිසි පරිදි ඉටු වේ දැයි මැන බලා ගැනීම සඳහා ඔබේ අභිමතය පරිදි වෙනස්කම් සිදු කර ගැනීමට අවකාශ සැලසේ. එසේ වුව ද නිපුණතාව හා නිපුණතා මට්ටම් පිළිබඳ ව දක්වන

සැලැකිල්ල වෙනස් නොවිය යුතු ය. සැම නිපුණතා මට්ටමක් අවසානයේ දී ම ලබා දී ඇති පරිශීලන පිළිබඳ ව මනා මඟපෙන්වීමක් සිසුන් වෙත දැක්වීම අතිශයින් වැදගත් වේ.

මෙම ගුරු මාර්ගෝපදේශය ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදක ව සිදු කිරීම සඳහා අත්පොතක් වේවා යි ප්‍රාර්ථනා කරන අතර, නව සහස්‍රය ජය ගැනීමට දරුවාගේ මනස නිවැරදි ම මාවතට යොමු කිරීම සඳහා මඟපෙන්වන ධර්මානුකූල අත්වැලක් වේවා යි ප්‍රාර්ථනා කරමි.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය උඩුගම සුදස්සී හිමි,**
**දෙපාර්තමේන්තු ප්‍රධාන,**
**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | v |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | viii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-71 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම | 72-73 |
| ඇගයීම | 74-82 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# හැඳින්වීම

ජාතික අධ්‍යාපන ක්‍රියාවලියේ දී විෂයමාලාවට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. ජාතික අවශ්‍යතාවලට සරිලන අයුරින් විෂයමාලා සංශෝධනය කිරීම කාලීන ව සිදුවන්නකි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6-11 ශ්‍රේණිවල සිසුන්ට 2015 වර්ෂයේ සිට හඳුන්වා දෙනු ලැබූ බුද්ධ ධර්මය නව විෂය නිර්දේශය ඉගෙනීම මඟින් බුදු සමයේ මූලික ඉගැන්වීම්, ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය ආදි ක්ෂේත්‍ර පිළිබඳ නිපුණතා පාදක කරගනිමින් ප්‍රමාණාත්මක ව, ගුණාත්මක ව හා ප්‍රයෝජනවත් ව කරුණු අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දී ඇත.

ඒ අනුව අ.පො.ස. සාමාන්‍ය පෙළ කඩඉම පසු කර උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය විෂය අධ්‍යයනයට පිවිසෙන දරුවන්, බුද්ධ කාලීන භාරතීය ආගමික, සංස්කෘතික, සමාජ, ආර්ථික හා දේශපාලන පසුබිමට සාපේක්ෂ ව බෞද්ධ ඉගැන්වීම්වල අර්ථාන්විත බව ද, ත්‍රිවිධ රත්නය, බෞද්ධ ආචාර ධර්ම, ශාසන ඉතිහාසය, කලාශිල්ප, බෞද්ධ ආර්ථික හා දේශපාලන දර්ශනය, බෞද්ධ සංස්කෘතියේ අන්තර්ජාතික ව්‍යාප්තිය ආදි ක්ෂේත්‍ර පිළිබඳ විස්තරාත්මක, විචාරාත්මක හා තුලනාත්මක ගවේෂණයකට මෙමඟින් යොමු කරනු ලැබේ. ඒ මඟින් ද්වීතීය මට්ටමේ දී අධ්‍යයනය කරනු ලැබූ බුද්ධ ධර්මය විෂයය, නිපුණතා පාදක ව වඩාත් පුළුල් හා ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයා යොමු වන අයුරින් මෙම විෂය අන්තර්ගතය ඉදිරිපත් කිරීමට මෙහි දී උත්සාහ ගෙන ඇත.

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයට මුල් තැන දෙමින් ශිෂ්‍යයාට වඩාත් රුචිකත්වයෙන් විෂය කරුණු අධ්‍යයනය කිරීමට මෙමඟින් අවකාශ සැලසේ. වනපොත් කිරීමට හෝ අසා දැන ගැනීමට හෝ වඩා දැනුම තමා විසින් ම එක්රැස් කොට ස්වාධීන ව විශ්ලේෂණය කරමින් ජීවිතාවබෝධය සඳහා යොදා ගැනීමට ශිෂ්‍යයා පෙලඹවීමත්, ජීවන යහපුරුදුවලින් හා සමබර පෞරුෂයකින් හෙබි අනාගත පරපුරක් ජාතියට දායාද කිරීමත් මෙහි අපේක්ෂාව යි.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා  වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන්  සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන  සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** — සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** — භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** — රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** — පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවි ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ  වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂය අධ්‍යයනයේ අරමුණු

බෞද්ධ ශිෂ්ටාචාරයෙහි මෙන් ම එහි පදනම වන බුද්ධ ධර්මයෙහි ද මූලික අරමුණ වන්නේ හුදෙක් පාරලෞකික සුගතියක් හෝ විමුක්ති ප්‍රතිලාභයක් හෝ උදෙසා මඟ පෙන්වීම ම නොවේ. මානව වර්ගයාට ඓහලෞකික වශයෙන් පෞද්ගලික ව හා සාමූහික ව තෘප්තිමත් සාමකාමී ජීවිතයක් ගත කිරීම සඳහා වන ප්‍රායෝගික මාර්ගය පෙන්වාදීම ද මූලික අරමුණක් බව ඊට අදාළ බුද්ධ දේශනාවන්ගෙන් මෙන් ම ශාසන ඉතිහාසයෙන් ද සනාථ වේ.

මෙහි ඇතුළත් නිපුණතා මාලාව මඟින් මූලික වශයෙන් ම පහත දැක්වෙන අරමුණු සාධනය කරගැනීමට අපේක්ෂා කෙරේ.

- සමානාත්මතාවාදී, විචාරපූර්වක හා ප්‍රගතිශීලී ආකල්ප ශිෂ්‍ය ප්‍රජාව තුළ සංවර්ධනය කිරීම.
- සිවුබඹ විහරණයෙන් පෝෂිත සමාජානුයෝගී චරිත ගොඩනැඟීමට දායක වීම.
- ස්ව ශක්තිය කෙරෙහි විශ්වාසය තබන, හේතුඵලවාදී ව සිතා කටයුතු කරන දරු පරපුරක් බිහි කිරීම.
- බෞද්ධ පදනමක් ඇති චාරිත්‍ර වාරිත්‍රාදිය ප්‍රායෝගික ව ප්‍රගුණ කරන මිනිසුන් ඇති කිරීම.
- අතීත ආදර්ශයන් මඟින් අනාගතය ගොඩනඟා ගැනීමට මඟ පෙන්වීම.
- වඩාත් ප්‍රබුද්ධ, සංවේදී හා නිර්මාණශීලී දරුවන් සමාජයට දායාද කිරීම.
- හරවත් හා සමබර පෞරුෂයකින් හෙබි මනු පරපුරක් බිහි කිරීම.

බෞද්ධ ශිෂ්ටාචාරය විෂය ඉගෙනීම යනු ආගමික හා දාර්ශනික වටිනාකම් සහිත දැනුම් සම්භාරයක් එකතු කර ගැනීම පමණක් නොවන බව ද, එය පුද්ගලයාගේ හා සමාජයේ ආධ්‍යාත්මික හා ලෞකික අභිවෘද්ධිය උදෙසා මඟ සලසා ගැනීමක් විය යුතු බව ද ගුරු සිසු දෙපක්ෂය විසින් ම වටහා ගැනීමත්, ඒ අනුව ක්‍රියා කිරීමත් මෙහි ඇතුළත් සියලු නිපුණතාවන්ගේ පොදු අර්ථය බව සැලකිය යුතු ය.

# විෂය නිර්දේශය
## 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0<br>ප්‍රාග් බෞද්ධ හා බුද්ධ කාලීන ආගමික සාමාජික දේශපාලනික හා ආර්ථික පසුබිම විමර්ශනාත්මක ව දකියි. | 1.1<br>භාරතීය බ්‍රාහ්මණ සමාජ ධර්ම අධ්‍යයනය කර ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය විමසා බලයි. | • වර්ණ ධර්ම<br>• ස්වධර්ම<br>• ආපද්ධර්ම<br>• ආශ්‍රම ධර්ම<br>• යාගය<br>• එම ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ විචාරය<br>• කාන්තාව පිළිබද බ්‍රාහ්මණ ඉගැන්වීම්<br>• කාන්තාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • භාරතීය සමාජ ධර්ම පිළිබඳ විචාරාත්මක දැනුමක් ලබා ගනියි.<br>• බ්‍රාහ්මණ සමාජ ධර්මවල නිසරු බව පිළිගනියි.<br>• මිනිස් සංහතියේ ඒකත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල විශිෂ්ටත්වය ප්‍රකට කරමින් විවිධ ක්‍රියාකාරකම්වල නිරත වෙයි.<br>• සමාජ ජීවිතයේ දී සමානාත්මතාවෙන් කටයුතු කරයි. | 26 |
| | 1.2<br>බුද්ධ කාලීන භාරතීය ශ්‍රමණ ගුරුකුල හඳුනා ගනිමින් ශ්‍රමණ බ්‍රාහ්මණ සම්ප්‍රදායවල විශේෂතා අධ්‍යයනය කරයි. | • නිගණ්ඨ, ආජීවක, ජටිල, පරිබ්‍රාජක යන ශ්‍රමණ ගුරුකුල<br>• බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායයේ සුවිශේෂතා<br>• ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් සහ ඒ පිළිබඳ බෞද්ධ විචාරය<br>• ශ්‍රමණ සංස්කෘතියෙහි අනන්‍යතා ලක්ෂණ<br>• බ්‍රාහ්මණ සංස්කෘතියෙහි අනන්‍යතා ලක්ෂණ | • භාරතීය ශ්‍රමණ ගුරුකුලවල ඉගැන්වීම් විචාරාත්මක ව හා තුලනාත්මක ව පැහැදිලි කරයි.<br>• භාරතීය ශ්‍රමණ ඉගැන්වීම්වල ඌනතා ඇති බව පිළිගනියි.<br>• ශ්‍රමණ සංස්කෘතිය හා බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ වගුගත කරයි.<br>• නිසරු දේ බැහැර කොට සරු දේ ක්‍රියාවට නඟයි. | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3<br>බුද්ධ කාලීන භාරතීය දේශපාලනික ව්‍යූහය හා ක්‍රියාකාරිත්වය ගවේෂණය කරයි. | • සොළොස් මහා ජනපද<br>• රාජාණ්ඩු ක්‍රමය හා සමූහාණ්ඩු ක්‍රමය (ගණ තන්ත්‍ර)<br>• බුද්ධ කාලීන භාරතීය පාලකයන් හා බුදු රජාණන් වහන්සේ අතර පැවති සම්බන්ධතා | • බුද්ධ කාලීන භාරතීය දේශපාලන පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගනියි.<br>• රාජාණ්ඩු හා සමූහාණ්ඩු ක්‍රමවල සාධනීය ලක්ෂණ මෙන් ම ගැටලු ද අවබෝධ කර ගැනීමට පෙලඹෙයි.<br>• පාලකයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.<br>• පරිපාලන කටයුතුවල දී නොගැටී ක්‍රියා කරයි. | 21 |
| | 1.4<br>ක්‍රි.පූ. හවැනි සියවසේ ආර්ථික පසුබිම හැඳින ගනියි. | • වාණිජ්‍යකරණය හා නාගරීකරණය<br>• කෘෂිකර්මය, වෙළෙඳාම හා වෙනත් කර්මාන්ත | • ක්‍රි.පූ. හයවැනි සියවසේ ආර්ථික පසුබිම විස්තර කරයි.<br>• සමාජ අවශ්‍යතා මත විවිධ වෘත්ති බිහි වන බව පිළිගනියි.<br>• බුද්ධ කාලීන ජීවන වෘත්තිවල නාමාවලියක් පිළියෙළ කරයි.<br>• අදාළ වෘත්තිවල කාර්යක්ෂම ව කටයුතු කරයි. | 21 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 02.<br>බුදු රජාණන් වහන්සේගේ හා පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ විශිෂ්ට චරිත ලක්ෂණ අධ්‍යයනය කර ආදර්ශයට ගනියි. | 2.1<br>බුදු රජාණන් වහන්සේගේ සුවිශේෂ ගුණ හා විශිෂ්ට චරිත ලක්ෂණ අධ්‍යයනය කරයි. | • නව අරහා දි බුදු ගුණ<br>• මහා කරුණාව<br>• මහා ප්‍රඥාව<br>• ආදර්ශවත් නායකත්වය<br>• විශිෂ්ට ශාස්තෘත්වය<br>• තාදි ගුණය<br>• පද්මාකාර ජීවිතය<br>• නිදහස් චින්තනය හා ආගමික සහනශීලී බව<br>• බුදු රජාණන් වහන්සේ පිළිබඳ සමකාලීන හා නූතන ඇගයීම් | • බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ටත්වය හඳුනා ගනියි.<br>• විශිෂ්ට බුදුගුණ චරිතායනයට පෙලඹෙයි.<br>• බුදුගුණ ප්‍රකට වන නිර්මාණකරණයෙහි යෙදෙයි.<br>• සැදැහැ සිතින් ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්හි නියැළෙයි. | 30 |
| | 2.2<br>බුද්ධ කාලීන පරමාදර්ශී ගිහි පැවිදි ශ්‍රාවක -ශ්‍රාවිකා චරිත ඇගයීමට ලක් කරයි. | • ආනන්ද මහ රහතන් වහන්සේ<br>• සැරියුත් මහ රහතන් වහන්සේ<br>• මහා ප්‍රජාපතී ගෝතමී රහත් මෙහෙණින් වහන්සේ<br>• ඛේමා රහත් මෙහෙණින් වහන්සේ<br>• අනාථපිණ්ඩික උපාසකතුමා<br>• චිත්ත ගහපති උපාසකතුමා<br>• විශාඛා මහෝපාසිකාව<br>• නකුල මාතාව | • පරමාදර්ශී චරිතයක විශිෂ්ට ලක්ෂණ පැහැදිලි කරයි.<br>• පරමාදර්ශී ජීවිතයක් ගත කිරීමට අධිෂ්ඨාන කර ගනියි.<br>• ධර්මානුකූල ජීවිතයක් ගත කරයි.<br>• පරමාදර්ශී චරිතවලින් පිළිබිඹු වන යහගුණ විවිධ නිර්මාණ මඟින් සමාජයට සම්ප්‍රේෂණය කරයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 03.<br>පුද්ගලයා, සමාජය හා දේශපාලන සංවිධාන පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වටහාගෙන ඒ අනුව පෞරුෂය ගොඩනගා ගනියි. | 3.1<br>පුද්ගලයාගේ ස්වාමිත්වය හා ශක්‍යතා පිළිබඳ විමර්ශනය කරයි. | • පුද්ගල ස්වාමීත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම පිළිබඳ සමකාලීන ඉගැන්වීම්<br>• පුද්ගල ස්වාමීත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • පුද්ගල ස්වාමිත්වය, ශක්‍යතාව හා වගකීම පිළිබඳ තුලනාත්මක ව අවබෝධ කර ගනියි.<br>• සදාචාරාත්මක ශික්ෂණයට පෙලඹෙයි.<br>• අභියෝග ජය ගනිමින් ක්‍රියා කරයි.<br>• ආත්ම විශ්වාසයෙන් කටයුතු කිරීමේ වැදගත්කම ප්‍රදර්ශනය කරයි. | 16 |
| | 3.2<br>සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ විග්‍රහය අධ්‍යයනය කරයි. | • සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • සමාජ ප්‍රභවය හා විකාශය පාරභෞතික ප්‍රස්තුතවලින් බැහැර වූවක් බව ප්‍රත්‍යක්ෂ කර ගනියි.<br>• සමාජ ප්‍රභවය හා විකාශය හේතුඵලවාදී ව සිදු වූවක් බව පෙන්වා දෙයි.<br>• සමාජ විවිධත්වය හා විචිත්‍රත්වය අවබෝධ කොටගෙන ක්‍රියා කරයි.<br>• සමාජ සංකීර්ණතා මඟින් පැන නඟින අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි. | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3<br>බෞද්ධ දේශපාලන මූලධර්ම විචාරශීලී ව අධ්‍යයනය කරයි. | • පංචශීල ප්‍රතිපදාව<br>• දස රාජ ධර්ම<br>• දස සක්විති වත්<br>• සප්ත අපරිහානීය ධර්ම<br>• සතර සංග්‍රහ වස්තු<br>• සතර අගති විරතිය<br>• ලෝක පාලන ධර්ම<br>• කූටදන්ත සූත්‍රාගත දේශපාලන මූලධර්ම<br>• පාලන තන්ත්‍රය විෂයයෙහි ප්‍රජා වගකීම් | • පරමාදර්ශී පාලන තන්ත්‍රයක් සඳහා වූ බෞද්ධ දේශපාලන මූලධර්ම විශ්ලේෂණය කරයි.<br>• බෞද්ධ දේශපාලන මූලධර්ම මත පදනම් ව යහපාලනයක් ගොඩ නැඟීමට උත්සුක වෙයි.<br>• ආදර්ශවත් ප්‍රජා නායකයකු ලෙස ක්‍රියා කරයි.<br>• සමාජ සුභසාධනය හා සාධාරණත්වය උදෙසා කැප වෙයි. | 20 |
| 04.<br>පුද්ගලයාගේ හා සමාජයේ යහපැවැත්මට උපයෝග වන බෞද්ධ ආචාර ධර්ම අධ්‍යයනය කර උභයාර්ථ සාධනයට ක්‍රියා කරයි. | 4.1<br>පින් පව් කුසල් අකුසල් හැඳින ගනිමින් හොඳ නරක විනිශ්චය කිරීමෙහි ලා භාවිත බෞද්ධ නිර්ණායක පැහැදිලි කරයි. | • හොඳ නරක විනිශ්චය කිරීමෙහි ලා භාවිත බෞද්ධ නිර්ණායක<br>• දස පින්කිරිය වත්<br>• දස කුසල් හා දස අකුසල් | • හොඳ නරක විනිශ්චය කිරීමෙහි ලා භාවිත නිර්ණායක නිරවුල් ව හඳුනා ගනියි.<br>• සදාචාරාත්මක ව ජීවත්වීමට අධිෂ්ඨාන කර ගනියි.<br>• පව් බැහැර කොට කුසල් දහම් වඩයි.<br>• කුසල් දහම් සඳහා සමාජය පොලඹවයි. | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2<br>පුද්ගල හා සමාජ සංවර්ධනයට අදාළ බෞද්ධ ආචාර ධර්ම හැඳින ගනියි. | • ශ්‍රද්ධාව<br>• පන්සිල් හා අටසිල්<br>• සිවුබඹ විහරණ<br>• සතර සංග්‍රහ වස්තු<br>• හිරි ඔතප්<br>• අල්පේච්ඡතාව, සන්තුෂ්ටිතාව, සුභරතාව<br>• නීතිගරුකත්වය හා සහජීවනය | • බෞද්ධ සාරධර්ම නිවැරදි ව විස්තර කරයි.<br>• සහජීවනයෙන් ජීවත් වීමට හුරු වෙයි.<br>• බෞද්ධ සාරධර්මානුකූල ව දිවි ගෙවයි.<br>• යහගුණ වර්ධනයට අනුබල දෙයි. | 18 |
| 05.<br>පරිසරය, ආර්ථිකය හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගික ව භාවිත කරමින් අර්ථවත් හා තෘප්තිමත් ජීවිතයක් ගත කරයි. | 5.1<br>පරිසරය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරයි. | • බුදු සමය හා පරිසරය<br>• පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්<br>• සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • පරිසරය හා සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය අනාවරණය කර ගනියි.<br>• පරිසර සංරක්ෂණයට හා සෞන්දර්ය රසාස්වාදයට පෙලැඹෙයි.<br>• ජීවිතය සංවේදී ව හා යථාර්ථවාදී ව ගත කරයි.<br>• සත්ත්ව ප්‍රජාවගේ යහපැවැත්ම උදෙසා කටයුතු කරයි. | 19 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2<br>ආර්ථිකය පිළිබඳ බෞද්ධ චින්තනය විමර්ශනය කරයි. | • ධනෝපායනය, ධන පරිහරණය හා ආර්ථික සුරක්ෂිතතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්<br>• ශ්‍රමය, ධනය සහ සමාජ සුභසිද්ධිය අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • ආර්ථිකය සම්බන්ධ බෞද්ධ ආකල්පය මූලාශ්‍රයානුසාරයෙන් පැහැදිලි කරයි.<br>• විධිමත් ආර්ථික සමෘද්ධියක් ඇති කර ගැනීමට උනන්දු වෙයි.<br>• ධාර්මික ආර්ථික ප්‍රතිපදාවකට අනුගත ව ක්‍රියා කරයි.<br>• විධිමත් හා දැහැමි ආර්ථික සංවර්ධන සැලසුම් සකස් කරයි. | 17 |
| | 5.3<br>භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ චින්තනය අධ්‍යයනය කරයි. | • භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනය කරයි.<br>• භෞතික සම්පත් ඵලදායි ලෙසත්, කාර්යක්ෂම ලෙසත් යොදගැනීමට හුරු වෙයි.<br>• විධිමත් කළමනාකාරිත්වයකින් යුතු ව දෛනික ජීවිතය ගත කරයි.<br>• භෞතික සම්පත් විධිමත් ව කළමනාකරණය කිරීමේ අගය පෙන්වා දෙයි. | 15 |
| | 5.4<br>ලෞකික සැප පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හැඳින ගනියි. | • ඉඳුරන් පිනවීම හා පංචකාම සම්පත්තිය<br>• ඉඳුරන් පිනවීම් සීමා හා දැහැමි කම්සුව<br>• අත්ථි සුඛ, භෝග සුඛ, අනණ සුඛ, අනවජ්ජ සුඛ | • ලෞකික සැපය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විස්තර කරයි.<br>• ඉඳුරන් පිනවීම සීමා කළ යුතු බව පිළිගනියි.<br>• ධාර්මික ව කම්සැප විඳිමින් තෘප්තිමත් ගෘහ ජීවිතයක් ගත කරයි.<br>• අන්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. | 13 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

නිපුණතාව 1.0 : ප්‍රාග් බෞද්ධ හා බුද්ධ කාලීන ආගමික, සාමාජික, දේශපාලනික හා ආර්ථික පසුබිම විමර්ශනාත්මක ව දකියි.

නිපුණතා මට්ටම 1.1 : භාරතීය බ්‍රාහ්මණ සමාජ ධර්ම අධ්‍යයනය කර ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය විමසා බලයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 16 යි.

ඉගෙනුම් පල :

- භාරතීය සමාජ ධර්ම පිළිබඳ විචාරාත්මක දැනුමක් ලබා ගනියි.
- බ්‍රාහ්මණ සමාජ ධර්මවල නිසරු බව පිළිගනියි.
- මිනිස් සංහතියේ ඒකත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල විශිෂ්ටත්වය ප්‍රකට කරමින් විවිධ ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- සමාජ ජීවිතයේ දී සමානාත්මතාවෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු රජාණන් වහන්සේ ලොව පහළ වීමට පෙර තිබූ ආගමික, සාමාජික, දේශපාලනික හා ආර්ථික පසුබිමෙහි ස්වභාවය විචාරාත්මක ව අධ්‍යයනය කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය**

**වර්ණ ධර්ම**

- බ්‍රාහ්මණයන් වර්ණ ධර්ම පදනම් කොටගෙන සමාජ ප්‍රභවය ඉගැන්වූ බව.
- එම ඉගැන්වීම් ඍග්වේදයේ 10 වන මණ්ඩලයේ 90 වන පුරුෂ සූක්තයේ සඳහන් වන බව.

'' බ්‍රාහ්මණෝස්‍ය මුඛමාසිද්
බාහු රාජන්‍යඃ කෘතඃ
ඌරුතදස්‍ය යද් වෛශ්‍යඃ
පද්භ්‍යාම් ශුද්‍රෝ අජායත"
(ඍග් 10.90)

- මෙම ඉගැන්වීම වර්ණ ධර්ම නමින් හැඳින්වූ බව.
- බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර යන සමාජ සංස්ථා හතර චතුර් වර්ණය නම් වන බව.

**ස්වධර්ම**

- ඒ ඒ වර්ණයන්ට අයත් කාර්යයන් ස්වධර්ම නමින් හැඳින්වූ බව.
- මෙම ඉගැන්වීම් මනුස්මෘතියේ සඳහන් වන බව.

බ්‍රාහ්මණ

'' අධ්‍යාපනමධ්‍යයනං
යජනං යාජනං තථා
දානං ප්‍රතිග්‍රහණංචෛව
බ්‍රාහ්මණානාමකල්පයත් "
(මනු 1.88)

- ඉගැන්වීම, ඉගෙනීම, යාග කිරීම, යාග කරවීම, දන් දීම, දන් පිළිගැනීම බ්‍රාහ්මණයාගේ කාර්යයන් බව.

ක්ෂත්‍රිය

'' ප්‍රජානං රක්ෂණං දාන
මිජ්‍යාධ්‍යයනමේවච
විෂයේශ්ච ප්‍රශක්තිශ්ච
ක්ෂත්‍රියස්‍ය සමාසතඃ"

(මනු 1:89)

- ප්‍රජා රක්ෂණය, දන් දීම, යාග කිරීම, ඉගෙනීම, කාමයෙහි නො ඇලී ක්‍රියා කිරීම, ක්ෂත්‍රියයන්ගේ කාර්යයන් බව.

වෛශ්‍ය

'' පශුනං රක්ෂණං දාන
මිජ්‍යාධ්‍යයනමේවච
වණික්පථං කුසීදංච
වෛශ්‍යස්‍ය කෘෂිමේවච"

(මනු 1.90)

- පශු පාලනය, දන් දීම, යාග කිරීම, ඉගෙනීම, වෙළෙඳාම, මුදල් පොළියට දීම, කෘෂි කර්මාන්තය වෛශ්‍යයන්ගේ කාර්යයන් බව.

ශුද්‍ර

''ඒකමෙවතු ශුද්‍රස්‍ය
ප්‍රභුඃ කර්ම සමාදිශත්
ඒතේසාමේව වර්ණානං
ශුශ්‍රෑසාමනුසූයසා''

(මනු 1.91)

- ඉහත දක්වන ලද ඒ ඒ වර්ණවලට අයත් ප්‍රභූ ජනයාට මෙහෙවර කිරීම.

**ආපද් ධර්ම**

- ආපදා අවස්ථාවක දී බ්‍රාහ්මණයාට ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණවලට අයත් කටයුතුවල නිරත විය හැකි බව.
- සෙසු වර්ණවල ජනයාට පහළ ශ්‍රේණිවලට අයත් කටයුතු කිරීමට හැකි වන අතර ශුද්‍රයනට අයත් කාර්යයන් කිසි සේත් ම වෙනස් නොවන බව.
- පහළ වර්ණවල ජනයාට, ඉහළ වර්ණවල ජනයාගේ කටයුතු කිරීමට නොහැකි බව.

**ආශ්‍රම ධර්ම**

- ජීවිතය බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, හා සන්‍යාසි යනුවෙන් අවස්ථා හතරකට බෙදා තිබුණු බව.

බ්‍රහ්මචාරී

- ශිෂ්‍යයකු වශයෙන් උගත මනා ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම.

ගෘහස්ථ

- විවාහ ජීවිතයට ඇතුළත් ව අඹුදරුවන් පෝෂණය කිරීම හා පස්කම් සුව අනුභව කරමින් සාර්ථක ගෘහ ජීවිතයක් ගත කරන අතර පිරිමි දරුවකු ප්‍රාර්ථනා කිරීම.

වානප්‍රස්ථ

- තවුස් දම් රැකීම සඳහා වනගත වීම. එහි දී සිය අභිමතය පරිදි බිරිය ද කැටිව යා හැකි බව.

සන්‍යාසි

- බ්‍රහ්මසහව්‍යතාව අපේක්ෂාවෙන් අනගාරික ව, හුදෙකලා, සංචාරක ජීවිතයක් ගත කළ යුතු බව.

**යාගය**

- බ්‍රහ්මසහව්‍යතාව සඳහා ඇති එක ම මාර්ගය ලෙස යාගය ඉගැන්වූ බව.
- එය ඉහළ වර්ණවලට පමණක් සීමා වූ බව හා ලෞකික අපේක්ෂා සාධනය ද එමඟින් අපේක්ෂා කළ බව.
- ඍග්, යජුර්, සාම යන වේදත්‍රයයෙහි ම යාගය සඳහන් වන බව.
- හෝතෘ (ආරාධනා කරන්නා) අධ්වර්යු (යාගයේ අධ්‍යක්ෂ) උද්ගාතෘ (වේද පාඨ ගායනා කරන්නා) සහ යඥ කාරක (යාග කරන්නා) යන බ්‍රාහ්මණ පූජකවරුන් නිසි පරිදි යාගයන් පැවැත්වීම අත්‍යවශ්‍ය වන බව.
- යාග ක්‍රම ගණනාවක් බ්‍රාහ්මණයන් අනුගමනය කළ බව.
- අශ්වමේධ, පුරුෂමේධ, සම්මාපාය, වාජපෙය්‍ය හා නිරග්ගල එයින් ප්‍රමුඛ යාග බව.

**බ්‍රාහ්මණ ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ විචාරය**

- වර්ණ ධර්මය පිළිබඳ බෞද්ධ විචාරය සූත්‍ර දේශනා රැසකින් ප්‍රකට වන බව.
- ඓතිහාසික සාධක, ජීව විද්‍යාත්මක සාධක, සමාජ විද්‍යාත්මක සාධක, ආචාර විද්‍යාත්මක සාධක හා මනෝවිද්‍යාත්මක සාධක ආදි වශයෙන් එම කරුණු වර්ගීකරණය කළ හැකි බව.
- ස්වධර්ම පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් විවේචනය කරන බුදුසමය වර්ණවලට උපතින් හිමි වන ජීවිකා වෘත්ති නැතැයි පෙන්වාදෙන බව.
- බෞද්ධ බ්‍රහ්මචරියාව ජීවිතයේ එක් සමයකට පමණක් සීමා නොවන බව.
- බ්‍රහ්ම සහව්‍යතාව හා යාගය බුදුසමයෙන් විචාරයට ලක් වන බව.

**කාන්තාව පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම්**

- බුද්ධ කාලීන භාරතීය සමාජය පුරුෂාධිපත්‍යයෙන් යුක්ත වූ බව.
- බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව කාන්තාවට ආගමික, සාමාජික, ආර්ථික හා දේශපාලන නිදහස සීමා කර තිබූ බව.
- සැමියා මළ කල්හි භාර්යාව සති පූජාව නම් ආගමික කාර්ය කළ යුතු යැයි පිළිගත් බව.
- ස්ත්‍රිය බාල වියේ දී දෙමාපියන් යටතේ ද, තරුණ වියේ දී ස්වාමිපුරුෂයා යටතේ ද, මහලු වියේ දී වැඩිමහල් පිරිමි දරුවා යටතේ ද ජීවත් විය යුතු යැයි සැලකුණු බව.
- ස්ත්‍රිය විශ්වාස නොකටයුතු, පහත්, චපල දුසිරිත්හි ම යෙදෙන තැනැත්තියක ලෙස සැලකූ බව.
- ඉඩ ලද සැම මොහොතේ ම කාන්තාව වරදෙහි බැදෙන තැනැත්තියක ලෙස පිළිගත් බව.

**කාන්තාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්**

- දියණියන් පහත් කොට නො සැලකූ බව.
- බිරියක වශයෙන් ඇයට නිසි සමාජ තත්ත්වය ලබා දී ඇති බව.
- මවක වශයෙන් ස්ත්‍රිය පූජනීයත්වයෙන් සලකා ඇති බව.
- උපාසිකාවක වශයෙන් බෞද්ධ සමාජයෙහි ස්ත්‍රියට උසස් තැනක් හිමි වී ඇති බව.
- භික්ෂුණියක ලෙස පැවිද්දෙහි උපරිම ඵල නෙළා ගැනීමට අවස්ථාව සලසා ඇති බව.
- ප්‍රඥා ප්‍රතිලාභයට සහ ආධ්‍යාත්මික ප්‍රගතියට ස්ත්‍රී භාවය බාධාවක් නොවන්නේ යැයි උගන්වා ඇති බව.
- ගුණ නුවණින් හෙබි කාන්තාව සමහර පුරුෂයන්ට වඩා ශ්‍රේෂ්ඨ යැයි බුදු වදනෙහි දැක්වෙන බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. භාරතීය සමාජයේ පැවති වර්ණ ධර්ම පිළිබඳ සංවාදයක් ගොඩනගන්න.
2. බ්‍රාහ්මණ වර්ණ ධර්ම, ස්වධර්ම, ආශ්‍රම ධර්ම බෞද්ධ ඉගැන්වීම් සමග තුලනය කරමින් වගුවක් නිර්මාණය කරන්න.
3. කාන්තාව පිළිබඳව බ්‍රාහ්මණයන් දැක්වූ ආකල්පය බුදුසමයෙන් විචාරයට ලක් වන ආකාරය අගයමින් කරන කතාවක පිටපතක් සකස් කරන්න.
4. ''බුදු සමයෙන් කාන්තාව ලද නිදහස'' යන මැයෙන් ප්‍රස්තුතීකරණයක් (presentation) ඉදිරිපත් කරන්න.
5. බ්‍රාහ්මණ සංස්කෘතියෙන් කාන්තාව පීඩාවට ලක් ව සිටි බව ථේරීගාථාවල ද දැක්වෙයි. එම ථේරීගාථා ඇතුළත් ලැයිස්තුවක් සකස් කරන්න.
6. තැනට උචිත පරිදි ස්ත්‍රිය ද විචක්ෂණ බුද්ධියෙන් ක්‍රියා කර ඇති බවට නිදසුන් බෞද්ධ සාහිත්‍යයෙන් සෙවීමට සිසුන් පෙලඹවීමක් කරන්න.

**පරිශීලනයට :**

- මනුස්මෘතිය
- පුරුෂ සූක්තය - ඍග් 10 මණ්ඩලය
- අම්බට්ඨ සූත්‍රය - දීඝ නිකාය
- අග්ගඤ්ඤ සූත්‍රය - දීඝ නිකාය
- සිගාලෝවාද සූත්‍රය - දීඝ නිකාය
- අස්සලායන සූත්‍රය - මජ්ඣිම නිකාය
- කණ්ණකත්ථල සූත්‍රය - මජ්ඣිම නිකාය
- වාසෙට්ඨ සූත්‍රය - මජ්ඣිම නිකාය
- මධුර සූත්‍රය - මජ්ඣිම නිකාය
- ථෙරි ගාථා - ඛුද්දක නිකාය

- භික්ඛුණී සංයුක්තය - සංයුක්ත නිකාය
- ධීතු සූත්‍රය - සංයුක්ත නිකාය
- කුණ්ඩලකේසි කථා වස්තුව - ධම්මපදට්ඨ කථා

- තෙරණියෝ - එච්.එම්. මොරටුවගම (1994)
  එස්. ගොඩගේ ප්‍රකාශන, කොළඹ

- බෞද්ධ ශිෂ්ටාචාරය
  මූලධර්ම හා වංශ කථාව - චන්ද්‍රිම විජයබණ්ඩාර
  එච්.එම්. මොරටුවගම (2011) කර්තෘ ප්‍රකාශන

- බෞද්ධ සංස්කෘතිය
  (පසුබිම හා මූලධර්ම) - දේවාලේගම මේධානන්ද හිමි
  තැරැලේ ධම්මරතන හිමි
  ඩබ්. ඒ. ගාමිණී වීජේසිංහ

- කාන්තාව හා සමාජය - කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර හිමි (1961), කැලණිය
  විද්‍යාලංකාර මුද්‍රණාලය

**නිපුණතාව 1.0** : ප්‍රාග් බෞද්ධ හා බුද්ධ කාලීන ආගමික, සාමාජික, දේශපාලනික හා ආර්ථික පසුබිම විමර්ශනාත්මක ව දකියි.

**නිපුණතා මට්ටම 1.2** : බුද්ධ කාලීන භාරතීය ශ්‍රමණ ගුරුකුල හඳුනා ගනිමින් ශ්‍රමණ බ්‍රාහ්මණ සම්ප්‍රදායවල විශේෂතා අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 32 යි.

**ඉගෙනුම් පල** :

- භාරතීය ශ්‍රමණ ගුරුකුලවල ඉගැන්වීම් විචාරාත්මක ව හා තුලනාත්මක ව පැහැදිලි කරයි.
- භාරතීය ශ්‍රමණ ඉගැන්වීම්වල ඌනතා ඇති බව පිළිගනියි.
- ශ්‍රමණ සංස්කෘතියේ හා බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ වගුගත කරයි.
- නිසරු දේ බැහැර කොට සරු දේ ක්‍රියාවට නඟයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පැරණි භාරතීය ශ්‍රමණ හා බ්‍රාහ්මණ සංස්කෘතිවල අනන්‍යතා ලක්ෂණ අධ්‍යයනය කර ඒ අතර බෞද්ධ ශ්‍රමණ සංස්කෘති යේ සුවිශේෂ අනන්‍යතා ලක්ෂණ පැහැදිලි කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

- ක්‍රිස්තු පූර්ව හයවන සියවස වන විට විවිධ ශ්‍රමණ ගුරුකුල පැවති බව.
- නිගණ්ඨ, ආජීවක, ජටිල, පරිබ්‍රාජක, ආදීන් ඉන් ප්‍රමුඛ වන බව.
- බ්‍රාහ්මණ සම්ප්‍රදා යේ ඉගැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම් වශයෙන් ශ්‍රමණ ගුරුකුල බිහි වූ බව.

**නිගණ්ඨ** :

- තමන් කෙලෙස් ගැටවලින් තොර යැයි කියා සිටි සාධුවරුන් නිගණ්ඨ නම් වූ අතර, ශ්වේතාම්බර හා දිගම්බර යනුවෙන් දෙයාකාර වූ ඔවුන් දුෂ්කර ව්‍රත අනුගමනය කළ පිරිසක් බව.

**ආජීවක** :

- අතින් දණ්ඩක් දරා සිටි අත්තකිලමථානුයෝගී ව උග්‍ර තපස් ව්‍රත අනුගමනය කළ ශ්‍රමණයන් ආජීවකයන් වූ බව.

**ජටිල** :

- මොවුන් හිසෙහි ජටාවක් දැරූ බව, ඇතැමුන් සංචාරක පැවිදි දිවියක් ගත කළ බව, ඇතැමුන් ස්ථිර ආරාමවල ජීවත් වූ බව හා ගිනි දෙවියන් පිදීමට ද උදක ශුද්ධියට ද ප්‍රමුඛත්වයක් ලබාදුන් බව.

**පරිබ්‍රාජක** :

- අත්තකිලමථානුයෝගී ව දුෂ්කර ව්‍රතවල යෙදුණු මොවුන් සාධුවරුන් වූ බව.

**බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායයේ සුවිශේෂතා**

- සන්සුන් ඉඳුරන් ඇති, පිරිසිදු කසාවත් දරන, සංවර ඉරියවුවලින් යුතු , ශීලාදී ගුණ ධර්මයන්ගෙන් යුතු, බිමට හෙළන ලද ඇස් ඇති, හිස රැවුළු මුඩු කළ, සන්සුන් ව ගමන් කරන, සුපටිපන්න ශ්‍රමණ පිරිසක් බව.
- පිණ්ඩපාතික ව එක් වේලේ පමණක් ආහාර ගන්නා, සරල දිවි පෙවෙතක් ගත කරන පිරිසක් බව.

- අට ලෝ දහමින් කම්පා නොවන අත්තකිලමථානුයෝගයෙන් හා කාමසුඛල්ලිකානුයෝගයෙන් බැහැර වූ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන පිරිසක් බව.
- අතීතය හා අනාගතය පිළිබඳ ශෝක නොඋපදවන, වර්තමානයෙන් යැපෙන, ප්‍රසන්න පෙනුමෙන් යුතු ශ්‍රමණ පිරිසක් බව. (සමිද්ධි සූත්‍රය)
- පුද්ගල ස්වාමිත්වය අගය කළ පිරිසක් බව.
- පාරිශුද්ධ වූ කාය, වාක්, මනඃ කර්ම ඇති බව.
- අභ්‍යන්තර හා බාහිර පාරිශුද්ධත්වයෙන් යුක්ත වූ බව.
- නිවන මූලික පරමාර්ථය කොට ගෙන ඊට අදාළ ප්‍රතිපත්ති පිරූ පිරිසක් බව.
- සියලු දෘෂ්ටි ග්‍රහණයන්ගෙන් සහ උපාදානයන්ගෙන් තොර නිදහස් චින්තනය අනුව ක්‍රියා කළ පිරිසක් බව.

**ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් සහ ඒ පිළිබඳ බෞද්ධ විචාරය.**

- ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ භාරතයේ ශ්‍රමණ සම්ප්‍රදායයට අයත් ප්‍රකට ශාස්තෘවරුන් හයදෙනෙකු විසූ බව.
- ඔවුන් පිළිබඳ ව දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේත්, වෙනත් සූත්‍රවලත්, ජෛන මූලාශ්‍රයවලත් දැක්වෙන බව.
- පූරණ කස්සප, මක්ඛලීගෝසාල, අජිතකේසකම්බලී, පකුධ කච්චායන, සංජය බෙල්ලට්ඨිපුත්ත හා නිගණ්ඨනාතපුත්ත යන නම්වලින් ඔවුන් හැඳින්වූ බව.

**පූරණ කස්සප** :

- මෙතුමා පින් පව් ප්‍රතික්ෂේප කරන අකිරියවාදියකු ලෙස සාමඤ්ඤඵල සූත්‍රයේ විස්තර වන බව.
- කරන්නකු, කරවන්නකු, සිඳින්නකු, සිඳවන්නකු නැතැයි උගන්වන පූර්ණ කාශ්‍යපගේ දර්ශනය අකිරියවාදයක් ලෙස දැක්වෙන බව.
- සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එක ම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් උපදනා පාපයක් නැතැයි ඉගැන්වූ බව.
- දන් දෙමින්, දන් දෙවවමින්, යදිමින්, යදවමින්, ගංගා තීරයේ උතුරු කෙළවර තෙක් ගියේ වී නමුදු එයින් වන පිනක් නැතැයි ඉගැන්වෙන බව.
- දානයෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, සංවරයෙන්, සත්‍ය වචනයෙන්, සිදු වන පිනක් නැතැයි ද උගන්වන බව.

කරොතෝ බෝ මහරාජ කාරයතෝ ඡින්දතෝ

ඡේදාපයතෝ පචතෝ පචායතො ......න කරියති පාපං,

ඛුර පරියන්තේන චේපි චක්කේන

යෝ ඉමිස්සා පඨවියා පාණේ ඒකමංසඛලං

ඒකමංසපුඤ්ජං කරෙය්‍ය නත්ථි තතෝ නිදානං පාපං

නත්ථි පාපස්ස ආගමෝ දක්ඛිණං චේපි ගංගාය තීරං

ගච්ඡෙය්‍ය හනන්තෝ ඝාතෙන්තෝ ඡින්දන්තෝ

ඡේදාපෙන්තෝ පචන්තො පාචෙන්තෝ නත්ථි
තතො නිදානං පාපං නත්ථි පාපස්ස ආගමෝ
උත්තරං චෙපි ගංගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තෝ
දාපෙන්තෝ යජන්තෝ යජාපෙන්තෝ නත්ථි තතෝ
නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමෝ.
දානේන දමේන සංයමේන සච්චවජ්ජේන,
නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමෝ

- මිනිසා විසින් සචේතන කරනු ලබන හොඳ නරක ක්‍රියාවේ වගකීම පුද්ගලයාට නො පැවරෙන බැවින් මිනිසාට අවශ්‍ය ඕනෑ ම දුරාචාර ක්‍රියාවක යෙදීමට මෙමඟින් ඉඩ සැලසෙන බව.
- එහෙයින් සමාජය තුළ ආචාර ධර්ම අර්ථවත් කිරීමට නොහැකි වී සමස්ත සමාජය ම සදාචාරමය වශයෙන් මහත් පරිහානියට පත්වන බව.
- බුදුදහම කම්මවාදී, කිරියවාදී, විරියවාදී දහමක් බැවින් සචේතන ක්‍රියාවේ වගකීම කරන්නා විසින් ම දැරිය යුතු යැයි උගන්වන බව.
- පුනර්භවය හෙවත් සත්ත්වයාගේ සාංසාරික ප්‍රවෘත්තිය පිළිගන්නා බුදුසමය කර්ම විපාක සිද්ධාන්තය අවධාරණය කරන බව.
- සචේතනව සිදු කරනු ලබන පින් පව්, කුසල් අකුසල් අදාළ පුද්ගලයාට දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරිය වේදනීය වශයෙන් මෙලොව දී හෝ මතු ආත්මවල දී හෝ පලවිපාක ලබාදීමට ඉදිරිපත් වන බව.
- තමාට මෙරමාට හා උභය පක්ෂයට අනර්ථය පිණිස හේතු වන ප්‍රාණඝාතාදි සියලු දුසිරිත් අසාධු, අකරණීය, පාප අකුසල ලෙස හඳුන්වා ඒවායින් වැළකෙන ලෙස උපදෙස් දෙන බුදුසමය තමාට මෙරමාට හා උභය පක්ෂයට හිතසුව පිණිස පවතින දානාදි සත්ක්‍රියා සාධු, පුඤ්ඤ, කුසල ලෙස ඉහළින් අගය කරන බව.
- දානය, ඉන්ද්‍රිය දමනය, සීල සංවරය, සත්‍ය වචනය ආදි ක්‍රියා මෙලොව පරලොව ජීවිතය සුවපත් කිරීමට පමණක් නොව සාංසාරික දුක් කෙළවර කොට නිවන් පසක් කිරීමට ද ඉවහල් වන මහානිසංසදායක සදාචාරමය සත් ක්‍රියා ලෙස බුදුසමය මඟින් අගය කරනු ලබන බව.
- මේ අනුව පූර්ණ කස්සප අකිරියවාදී ශාස්තෘවරයකු ලෙස බුදුසමය මඟින් හඳුන්වනු ලැබ ඇති බව.

**මක්ඛලී ගෝසාල :**

- සත්ත්වයාගේ කෙලෙසීමට හෝ විශුද්ධියට හෝ හේතු ප්‍රත්‍යයයක් නැතැයි ඉගැන් වූ මොහු අහේතු අප්‍රත්‍යයවාදියකු බව.
- ස්වභාව නියතියකට අනුව සත්ත්වයාගේ සසර ගමන හා විමුක්තිය සිදු වේ යැයි පවසන මක්ඛලී ගෝසාල ශාස්තෘතුමා නියතිවාදියකු ලෙස ද අධිච්ච සමුප්පන්නවාදියකු ලෙස ද හැඳින්වෙන බව.
- උත්සාහය, වීර්යය, අධිෂ්ඨානය, පුරුෂ බලය, පුරුෂ පරාක්‍රමය ප්‍රතික්ෂේප කරන මොහු සියලු සත්ත්වයන්, සියලු ප්‍රාණීන් විර්යය රහිත, බල රහිත, ස්ව කැමැත්තට අනුව කටයුතු කළ නොහැකි පිරිසක් ලෙස දක්වන බවත්, එනිසා ම මොහුගේ ඉගැන්වීම මඟින් කර්ම මෙන් ම සත්ත්වයාගේ කෙලෙසීමට හෝ විශුද්ධියට හෝ හේතු ප්‍රත්‍යයක් නැතැයි ඉගැන්වූ නිසා මොහු අහේතු අප්‍රත්‍යවාදියකු බව.
- මක්ඛලී ගෝසාල ආචාර්යවරයාගේ ඉගැන්වීම් නත්ථිකම්ම, නත්ථිකිරිය, නත්ථිවිරිය යන පදවලින් හැඳින්වෙන බව.
- මෙම ඉගැන්වීම් මඟින් කර්ම විපාක බැහැර කෙරෙන නිසා මක්ඛලී ගෝසාල ද අකිරියවාදියකු ලෙස හැඳින්විය හැකි බව.
- සත්ත්වයාගේ කෙලෙසීම හා පිරිසිදු වීම හේතු ප්‍රත්‍යය රහිත ව සිදු වේ යයි මක්ඛලි ගෝසාල ප්‍රකාශ කළ ද බුදු රජාණන් වහන්සේ සංයුක්ත නිකායේ මහාලි සූත්‍රයේ දී ''අත්ථි මහාලි හේතු අත්ථි පච්චයෝ සත්තානං සංකිලේසාය, සහේතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්ති ආදි වශයෙන් සත්ත්වයාගේ කෙලෙසීමට හා පිරිසිදු වීමට බලපාන කරුණු පැහැදිලි ව දක්වා ඇති බව.
- අහේතු අප්‍රත්‍යයවාදය හෙවත් අධිච්චසමුප්පන්නවාදය මෙන් ම සියලු ආකාරයේ නියතිවාදී ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරමින් ''ඉමස්මිං සති ඉදං හෝති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති ..... ''යනාදී පටිච්චසමුප්පාද සිද්ධාන්තය ඉදිරිපත් කරමින් ලෝකයේ සියල්ල හේතුප්‍රත්‍යය සහිත ව, පටිච්චසමුප්පන්න ව ඇති වන නැති වන අයුරු විද්‍යාත්මක ව තහවුරු කොට ඇති බව.
- ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය, අහේතුඅප්‍රත්‍යවාදය වැනි සියලු ආකාරයේ පාරභෞතික සංකල්ප බැහැර කරන බුදුසමය ස්වච්ඡන්දතාව අනුව හොඳ නරක මැනවින් තෝරා බේරාගෙන නිදහසේ ක්‍රියා කිරීමට ඇති හැකියාව අවධාරණය කරමින් සියලු සචේතන ක්‍රියාවල වගකීම කර්තෘ වෙත ම පැවැරූ බව.
- අත්තකාර, පරකාර, පුරිසථාම, පුරිසබල, පුරිසවීරිය, පුරිසපරක්කම ආදි ශක්තීන් උභයාර්ථ සංවර්ධනය පිණිස පුද්ගලයකු තුළ පැවතිය යුතු ධනාත්මක උත්තේජනයක් සේ දක්වන බුදුසමය සම්මා වායාම ආරම්භධාතු, නික්කමධාතු, පරක්කමධාතු, අප්පමාද, අධිට්ඨාන ආදි ආකල්ප මඟින් පුද්ගල පෞරුෂය ගොඩනැඟීමට උත්සාහ දරා ඇති බව.
- විවිධ වූ හුයෙන් වියන ලද වස්ත්‍ර අතර දුර්වර්ණ, දුර්ගන්ධ, දුක්ඛස්පර්ශ ඇති කේසකම්බලයක් ඉතා පහත් තත්ත්වයේ ලා සැලකෙන්නාක් මෙන් විවිධ ශ්‍රමණවාද අතර මක්ඛලීවාදය පහත් ම වාදය ලෙස බුදු රදුන් විසින් ම දක්වනු ලැබ ඇති බව.

- ගංගා මුවෙහි ගිල්වා තබන ලද කෙමිණ බොහෝ මත්ස්‍යයන්ගේ විනාශය පිණිස හේතු වන්නා සේ මක්ඛලී වනාහි බොහෝ මිනිසුනට අහිත, අවැඩ, ව්‍යසනය පිණිස ලෝකයෙහි උපන් මිනිස් කෙමිණ ලෙස හඳුන්වා ඇති බව.
- නත්ථි මහාරාජ හේතු, නත්ථි පච්චයෝ සත්තානං සංකිලේසාය, අහේතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති, නත්ථි හේතු නත්ථි පච්චයෝ සත්තානං විසුද්ධියා, අහේතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති, නත්ථි අත්තකාරේ, නත්ථි පරකාරෙ, නත්ථි පුරිසකාරෙ, නත්ථිබලං, නත්ථි විරියං, නත්ථි පුරිස ථාමෝ, නත්ථි පුරිස පරක්කමෝ සබ්බේ සත්තා, සබ්බේ පාණා සබ්බේ භූතා, සබ්බේ ජීවා, අවසා, අබලා, අවිරියා නියතිසංගතභාවපරිණතා ඡස්සේවාභිජාතීසු, සුඛදුක්ඛං, පටිසංවේදෙන්ති.... සෙය්‍යථාපි නාම සුත්ත ගුළෙ ඛිත්තේ නිබ්බේඨියමානමේව පලේති, ඒවමේව බාලේච, පණ්ඩිතේච, සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්තීති.

**අජිත කේසකම්බලි** :

- දුන් දීහි එල නැත. යාගයෙහි එල නැත. කුසලා කුසල කර්මයන්ගේ එල විපාක නැතැයි දක්වන මොහුගේ ඉගැන්වීම අකිරියවාදී ඉගැන්වීමක් බව.
- දානය, යාගය, හෝමය, මව, පියා, මෙලොව, පරලොව ආදි සියල්ල ප්‍රතික්ෂේප කරන මොහු සතර මහා භූතයන් පමණක් ස්ථිර පදාර්ථ ලෙස පිළිගන්නා බැවින් භෞතිකවාදියකු බව.
- මරණින් පසු සත්ත්වයාගේ සතර මහා භූත විශ්වයේ සතර මහා භූතවලට එකතු වන බවත්, දානාදියෙන් යහපතක් නැති බවත් බාල, පණ්ඩිත සියලු දෙනා මරණයෙන් විනාශයට, කෙළවරට පත්වන බවත් දැක්වෙන මෙම ඉගැන්වීම උච්ඡේදවාදයක් බව.

නත්ථි මහරාජ දින්නං නත්ථි යිට්ඨං, නත්ථි හුතං
නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං
විපාකෝ, නත්ථි අයං ලෝකෝ, නත්ථි
පරොලොකො, නත්ථි මාතා, නත්ථි පිතා
නත්ථි සත්තා, ඕපපාතිකා නත්ථි ලෝකේ
සමණ බ්‍රාහ්මණා, සම්මග්ගතා සම්මාපටිපන්නා
යේ ඉමඤ්ච ලෝකං, පරඤ්ච ලෝකං සයං
අභිඤ්ඤා සච්ජිකත්වා පවේදෙන්ති, චාතුම්මහා
භූතිකො අයං පුරිසෝ යදා කාලංරෝති
පඨවි පඨවි කායං අනුපේති අනුපගච්ඡති
ආපෝ ආපෝකායං අනුපේති අනුපගච්ඡති
තේජෝ තේජෝකායං අනුපේති අනුපගච්ඡති
වායෝ වායෝ කායං අනුපේති අනුපගච්ඡති
ආකාසං ඉන්ද්‍රියානි සංකමන්ති ආසන්දිපඤ්චමා
පුරිසා මතං ආදාය ගච්ඡන්ති
යාව අළහනා පදානි පඤ්ඤායන්ති කාපෝතකානි

අට්ඨීනි භවන්ති, භස්සන්තා, ආහුතියෝ
දත්තු පඤ්ඤත්තං යදිදං දානං
තෙසං තුච්ඡං මුසා විලාපෝ යේ කේචි
අත්ථික වාදං වදන්ති බාලේච පණ්ඩිතේච
කායස්ස භේදා උච්ඡිජ්ජන්ති විනස්සන්ති
න හොන්ති පරං මරණාති

- පුඤ්ඤපාප, කුසලාකුසල ක්‍රියාවන්ගේ ඵලවිපාක ද ප්‍රතික්ෂේප කරන අජිත කේසකම්බලි ශාස්තෘවරයා මරණින් මතු සියල්ල අවසන් වේ ය යන උච්ඡේදවාදයක් ඉදිරිපත් කොට ඇති බව.
- ''ලෝකසමුදයං ඛෝ කච්චාන සම්මප්පඤ්ඤාය පස්සතෝ යා ලෝකේ නත්ථිතා සා න හෝති '' යනුවෙන් පටිච්චසමුප්පන්න ව සත්ත්වයාගේ, ලෝකයේ හටගැනීම හා පැවැත්ම මනාවූ නුවණින් දකින්නාට නාස්තික දෘෂ්ටිය හෙවත් උච්ඡේද දෘෂ්ටිය ඇති නොවන බව.
- සත්ත්වයාගේ පැවැත්ම මරණයෙන් අවසන් නොවන්නේ යැයි අවධාරණය කරන බුදුසමය පුනර්භවය පිළිගන්නා බව.
- කර්ම විපාක සිද්ධාන්තය පිළිගන්නා බුදුසමය පුද්ගලයා විසින් සචේතනව කරනු ලබන කුසලාකුසල කර්මයන්ගේ ඵලවිපාක දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය වශයෙන් සංසාරගත ජීවිතය තුළ දී විඳීමට සිදුවෙති යි පවසන බව.
- නත්ථි දින්නං නත්ථි යිට්ඨං ..... ආදි දසවස්තුව මිථ්‍යාදෘෂ්ටියක් ලෙස බැහැර කරන බුදුසමය අත්ථි දින්නං අත්ථි යිට්ඨං අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං ඵලං විපාකෝ .... යනාදි දසවස්තුක සම්මා දිට්ඨියක් මහාචත්තාරීස ආදි සූත්‍රයන්හි දක්වා ඇති බව.
- දානා දි සත්ක්‍රියාවල ඵල විපාක ප්‍රතික්ෂේප කිරීම හා සත්ත්වයාගේ සාංසාරික පැවැත්ම බැහැර කිරීම යන අජිතකේසකම්බලි ශාස්තෘවරයාගේ ඉගැන්වීම් සමාජ සදාචාරයෙහි පැවැත්මට ප්‍රබල බාධකයක් බව.

**පකුධ කච්චායන :**

සත්තිමේ මහාරාජ කායා අකටා, අකටවිධා
අනිම්මිතා අනිම්මාතා ..... කතමේ සත්ත පඨවි කායෝ
ආපෝ කායෝ, තේජෝ කායෝ, වායෝ කායෝ
සුඛේ, දුක්ඛේ, ජීවේ සත්ත මේ ......තේ න ඉඤ්ජන්ති
න විපරිණමන්ති න අඤ්ඤමඤ්ඤං ඛ්‍යාබාධෙන්ති
නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා
තත්ථ නත්ථි හන්තා වා ඝාතේතා වා
සෝතා වා සාවේතා වා විඤ්ඤාතා වා විඤ්ඤාපේතා වා යෝපි
තින්හේන සත්ථේන සීසං ඡින්දති න කෝචි කඤ්චි, ජීවිතා වෝරෝපේති,
සත්තන්නං යේව කායේ න මන්තරේන සත්ථං විවරමනුපතතීති

- යනුවෙන් දැක්වෙන පරිදි කිසිවකු විසින් නිර්මාණය නො කරන ලද නො උපදවන ලද පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යනුවෙන් නිත්‍ය පදාර්ථ හතක් පමණක් ඇතැයි මෙතුමා ඉගැන්වූ බව.

- එම කාය සතෙහි නසන්නකු, නසවන්නකු, ඝාතනය කරන්නකු, කරවන්නකු නැති බවත්, තියුණු සැතකින් යමෙක් යමකුගේ හිස සිඳින්නේ නම් එයින් කිසිවකු විසින් කිසිවකු ඝාතනය නො කරන ලද බවත්, හුදෙක් සප්ත කාය අතරින් සැත (ආයුධය) විවරයට වැද ගැනීම පමණක් සිදුවන බවත් උගන්වන බැවින් කුසලාකුසල කර්ම විපාක නො පිළිගන්නා මොහුගේ ඉගැන්වීම ද අකිරියවාදී වන බව.
- සප්ත පදාර්ථය පිළිගනිමින් සත්ත්වයාගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරන මොහුගේ ඉගැන්වීම එක් අතකින් භෞතික වාදයක් ලෙස සැලකිය හැකි බව හා අනෙක් අතට මෙම සප්ත පදාර්ථයන්ට නිත්‍ය, අවිපරිණාමී, ස්ථිර පැවැත්මක් ආරෝපණය කර ඇති හෙයින් නිත්‍ය ආත්මයක් පිළිගැනීම ලෙස ද හැඳින්විය හැකි බව.
- ඒ අනුව මොහු ශාස්වතවාදියකු ලෙස ද හැඳින්විය හැකි බව.
- බෞද්ධ ඉගැන්වීමට අනුව අවිපරිණාමීය නිත්‍ය වූ කිසි ම දෙයක් ස්ථිර ව නොපවතින බව.
- ලෝකයේ සැම දෙයක් ම හේතුප්‍රත්‍යය සංකලනයෙන් හටගෙන ඇති බැවින් සප්ත පදාර්ථයන් ද එයට අයත් වන හෙයින් ඒවායේ ද ස්ථිර පැවැත්මක් නොමැති බව.
- තියුණු සැතකින් යමෙක් යමකුගේ හිස සිඳින්නේ නම් එයින් කිසිවකු විසින් කිසිවකු ඝාතනය නොකෙරෙන්නේ යැයි මෙතුමා කරන ඉගැන්වීම් මඟින් ක්‍රියාවෙහි වගකීම පුද්ගලයා වෙතින් මුළුමනින් ම ඉවත් වන බව.
- තමා විසින් සිදු කරනු ලබන සැම සචේතන ක්‍රියාවක ම වගකීම තමා සතු වන බව පෙන්වා දෙන බුදුසමය වැරදි ක්‍රියාවලට පුද්ගලයා නොපොලොඹවමින් සමාජ සදාචාර වර්ධනයන් සඳහා යොමු කරවන බව.
- පකුධ කච්චායනගේ දර්ශනය ද අකිරියවාදයක් බැවින් පුද්ගලයා දුරාචාරයට යොමු කරන, ජන සමාජය තුළ නොයෙක් ගැටලු නිර්මාණය කරන ඉගැන්වීමක් ලෙස දැක්විය හැකි බව.

**සංජය බෙල්ලට්ඨිපුත්තඃ**

- බ්‍රහ්මජාල සූත්‍රයට අනුව මොහුගේ ඉගැන්වීම අමරාවික්ඛේපවාදය ලෙස හැඳින්වෙන බව.

  එවන්තිපි මේ නෝ

  තථාතිපි මේ නෝ

  අඤ්ඤථාතිපි මේ නෝ

  නෝ තිපි මේ නෝ

  නෝ නෝ තිපි මේ නෝ...... යනාදි ලෙසින් එය දැක්වෙන බව

- සංජය බෙල්ලට්ඨිපුත්තගේ දර්ශනයෙන් මහජනයා වික්ෂිප්තියට (වික්ඛේපං) පත් වන බැවින් මෙය සාමඤ්ඤ ඵල සූත්‍රයේ වික්ඛේපවාදය ලෙස හැඳින්වෙන බව.
- අමරා වික්ඛේපවාදය සංසයවාදය ලෙස ද හැඳින්වෙන බව
- සත්ත්වයාගේ මරණින් මතු පැවැත්ම, පරලොව, කුසලාකුසල කර්මයන්ගේ ඵල විපාක ආදිය පිළිබඳ විමසන ලදුව නිශ්චිත පිළිතුරක් නො දීම සංජයගේ පිළිවෙත වූ බව.
- මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු නො දීමේ හේතු හතරක් බුදුසමය පෙන්වාදී ඇති බව.
- "මුසාවාදභයා මුසාවාද පරිජේගුච්ඡා" යනුවෙන් දැක්වෙන පරිදි පිළිතුරු නිවැරදි නොවුවහොත් ඉන් මුසාවාදයක් සිදු වන බැවින් ඊට ඇති භය හා අකමැත්ත නිසා පිළිතුරු නො දුන් බව.

- "උපාදාන භයා උපාදාන පරිජේගුච්ඡා" යනුවෙන් දැක්වෙන පරිදි පිළිතුරු කරණ කොට ගෙන යම් උපාදානයක් වේ නම් ඊට ඇති භය හා අකමැත්ත නිසා පිළිතුරු නො දුන් බව.
- අනුයෝග භයා අනුයෝග පරිජේගුච්ඡා" පිළිතුරු දෙනු ලබන කල්හි යමෙක් ප්‍රශ්න විචාරන්නේ නම්, එසේ ප්‍රශ්න කරනු ලැබීමට ඇති භය හා අකමැත්ත නිසා පිළිතුරු නො දුන් බව.
- "මන්දන්තා මොමූහත්තා" නුවණ මඳ බැවින්, බෙහෙවින් ම මෝඩ බැවින් එවැනි ප්‍රශ්නවලට පිළිතුරු දීමේ ශක්තියක් නැති නිසා පිළිතුරු නො දුන් බව.
- මෙම කරුණු සතරින් කිනම් හෝ කරුණක් නිසා පිළිතුරක් නො දීම. මේ කාරණය මෙසේ යැයි මට අදහසක් නැත, (ඒවන්තිපි මේ නෝ) මේ කාරණය එසේ ම යැයි ද මට අදහසක් නැත, (තථාතිපි මේ නෝ) මේ කාරණය වෙන සැටියකින් යැයි ද මට අදහසක් නැත, (අඤ්ඤථාතිපි මේ නෝ) මේ කාරණය නැතැයි ද මගේ අදහසක් නැත, (නෝ තිපි මේ නෝ ) මේ කාරණය නැත්තේ නැතැයි ද මට අදහසක් නැත (නෝ නෝ තිපි මේ නෝ......) යනුවෙන් වාචාවික්ෂේපයක් හෙවත් පැටලිලි සහගත වචන හරඹයක් පෑමක් පමණක් බව.
- ප්‍රශ්නවලට නිසි පිළිතුරු නො දීම අඥෙයවාදියකුගේ ලක්ෂණයක් බව.
- සංජයගේ දර්ශනය බෙහෙවින් අපැහැදිලි වූත් බුද්ධිගෝචර නොවූත් ඉගැන්වීමක් බව.
- කිනම් විමුක්තියක් පිණිස කිනම් ප්‍රතිපදාවක් වඩන්නේ දැයි අපැහැදිලි බැවින් ශ්‍රාවකයන් මුළාවට හෙළන ඉගැන්වීමක් බව.
- විචිකිච්ඡාව, සැකය, විමතිය, සංශය, විමුක්ති සාධනයෙහි ලා නීවරණය යන්න බෞද්ධ ඉගැන්වීම බව.
- සදාචාර ධර්ම සංරක්ෂණය පිණිස මෙම ඉගැන්වීමෙන් කිසි දු පිටිවහලක් නො ලැබෙන බව.
- අරමුණක් නැති, පැහැදිලි අවසානයක් නැති, ආගම දහමක් උදෙසා ප්‍රතිපදාවක් වැඩීම අනවශ්‍ය නිරර්ථක කටයුත්තක් බව.

**නිගණ්ඨනාතපුත්ත :**

- ජෛන මහාවීර යනුවෙන් ද මෙම ශාස්තෘවරයා හඳුන්වන බව.
- චතුයාම සංවරවාදය, පුබ්බේකත හේතුවාදය, කායදණ්ඩ වාදය හා ආත්මවාදය ඔහුගේ මූලික ඉගැන්වීමක් වන බව.

සබ්බවාරි වාරිතෝච හෝති
සබ්බවාරි යුතෝච හෝති
සබ්බවාරි ධුතෝච හෝති
සබ්බවාරි ඵුටෝ ච හෝති

- යනුවෙන් සියලු ඇල්දියෙන් වැළකීම, සියලු ම සංවරයෙන් යුක්ත වීම, සියලු ම පව් වළකාලීම හා මෝක්ෂය ස්පර්ශ කිරීම යනු මොහුගේ චතුයාම සංවරය බව.
- සියලු සැප දුක් පෙර කරන ලද කර්මයට අනුව සිදු වේ ය යන්න පුබ්බේකතහේතුවාදය බව.
- පෙර කළ කර්ම ගෙවා දැමීමෙන් සහ නව කර්ම නො කිරීමෙන් දුකින් නිදහස් වන බව.
- කායදණ්ඩ, වචීදණ්ඩ, මනෝදණ්ඩ යනුවෙන් ත්‍රිවිධ දණ්ඩයක් ඇති අතර කායදණ්ඩය වඩාත් ප්‍රබල යයි මෙතුමා ඉගැන්වූ බව.
- නිත්‍ය වූ නව සාංක්‍රමික ආත්මයක් ඇති බව.

- බුදුසමය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම සිද්ධාන්ත මඟින් ආත්මීය නිත්‍ය අවිපරිණාමී පදාර්ථවල පැවැත්ම බැහැර කරන බැවින් ජෛන නිත්‍ය ආත්මවාදය බිඳවැටෙන බව.
- චතුයාම සංවරය, පරම අවිහිංසාවාදය ආදි ජෛන ප්‍රතිපදාව ප්‍රායෝගික ජීවන දර්ශනයක් හෝ විමුක්ති මාර්ගයක් හෝ නො වන බව.
- සියලු කායික, වාචසික, මානසික ක්‍රියා සඳහා චේතනාව ප්‍රමුඛ වේ ය යන බුදුදහමේ ඉගැන්වෙන මිනිස් ක්‍රියාකාරකම්වල මානසික පදනම මඟින් ජෛන කායදණ්ඩ වාදය බිඳවැටෙන බව.
- සියල්ල පෙර කරන ලද කර්මයට අනුව සිදු වන්නේ නම් ජෛන ප්‍රතිපදාවේ එන අත්තකිලමථානුයෝගය ද පූර්වකෘත කර්මඵල ලෙස බුදුදහම මඟින් ඉගැන්වෙන බව.
- බුදුසමය කර්ම විපාක සිද්ධාන්තය පිළිගත්ත ද පුබ්බේකතහේතුවාදය සපුරා ප්‍රතික්ෂේප කරන බව.
- අත්තකිලමථානුයෝගය "දුක්ඛෝ අනරියෝ අනත්ථ සංහිතෝ " යනුවෙන් දුක්ඛ, අනාර්ය, නිවනට හේතු නොවන ප්‍රතිපදාවක් ලෙස බුදුසමය මඟින් බැහැර කෙරෙන බව.
- පටිච්චසමුප්පාදය මඟින් ජෛන ආත්මවාදයත්, මධ්‍යම ප්‍රතිපදාව මඟින් අත්තකිලමථානුයෝගයත් බැහැර වන බව.

**ශ්‍රමණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ:**

- සත්ත්වයා හා ලෝකය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදය බැහැර කළ බව.
- වේදය පරම සත්‍යය ලෙස පිළිගත් බ්‍රාහ්මණ ඉගැන්වීම බැහැර කළ බව.
- සියලු ලෞකික ලෝකෝත්තර සැප පිණිස යාගය අර්ථ සම්පන්න සංස්කාරයක් ලෙස පිළිගත් බ්‍රාහ්මණ මතය බැහැර කළ බව.
- විමුක්තිය පිණිස ඵලදායී ප්‍රතිපදාව කර්ම මාර්ගය නොව ඥාන මාර්ගය වැඩීම ලෙස පිළිගත් බව.
- බ්‍රහ්මචර්යාව හා අනගාරික ප්‍රතිපදාව පිළිගත් බව.
- චින්තන නිදහස ගරු කිරීම, කාන්තා නිදහස අගය කිරීම, උපත පදනම් කරගත් සමාජ වර්ගීකරණයන් බැහැර කිරීම ආදිය ශ්‍රමණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ ලෙස සැලකිය හැකි බව.

**බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ:**

- සත්ත්වයා හා ලෝකය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදය පිළිගත් බව.
- ඒ අනුව මහබ්‍රහ්ම, මහා පුරුෂ සංකල්පය හා එය පදනම් කොට ගෙන නිර්මාණය කරන ලද වර්ණාශ්‍රම ධර්ම ආදිය දිව්‍යමය ප්‍රභවයක් ලෙස දැක්වූ බව.
- වේද ග්‍රන්ථ පරම සත්‍ය ලෙස පිළිගත් බව.
- යාගය, පුදසත්කාර, ගීතිකා ගායනය ආදිය මුල් කරගත් කර්ම මාර්ගය ලෞකික ලෝකෝත්තර සැප පිණිස ඒකායන මාර්ගය ලෙස පිළිගත් බව.
- අගාරික ප්‍රතිපදාව පිළිගත් බව.
- පුද්ගල ස්වච්ඡන්දතාව, ස්වාධීනත්වය දේව නිර්මාණවාදයට යටපත් කළ බව.
- ජන්මීය සාධක මත පුද්ගලයා උසස් හා පහත් යනුවෙන් තීරණය වූ බව.
- කාන්තාවගේ දේශපාලන, ආර්ථික, සාමාජික, ආගමික නිදහස අහුරා තැබූ බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. භාරතීය ශ්‍රමණ ගුරුකුලවල ඉගැන්වීම් ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න.
2. 'ශ්‍රමණ ගුරුකුල, බෞද්ධ ශ්‍රමණයන්ගේ ඉගැන්වීම් හා සමාජ සංස්කෘතිය' යන මැයෙන් විවාදයක් පවත්වන්න.
3. සියලු ම ශ්‍රමණ සම්ප්‍රදායවල ඉගැන්වීම් ඇතුළත් වන සේ කෙටි ප්‍රශ්නාවලියක් නිර්මාණය කරන්න.
4. 'බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායයේ සුවිශේෂතා' යන මාතෘකාව යටතේ මිනිත්තු 20 ක දී විචාරයක් ලියන්න.
5. බ්‍රාහ්මණ සංස්කෘතියේ හා ශ්‍රමණ සංස්කෘතියේ පැවති විශේෂතා පිළිබඳ වගුවක් පිළියෙළ කරන්න.

| බ්‍රාහ්මණ සංස්කෘතිය | ශ්‍රමණ සංස්කෘතිය |
|---|---|
| | |

6. නිගණ්ඨනාතපුත්ත තුමාගේ ඉගැන්වීම්වල ඇති අර්ථ විරහිත බවත් බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම්වල පවත්නා අර්ථාන්විත බවත් වෙන් වෙන් ව පැහැදිලි කරන්න.

**පරිශීලනයට**

- සාමඤ්ඤඵල සූත්‍රය - දීඝ නිකාය
- ධම්මචේතිය සූත්‍රය - මජ්ඣිම නිකාය
- උපාලි සූත්‍රය - මජ්ඣිම නිකාය
- දේවදහ සූත්‍රය - මජ්ඣිම නිකාය
- යඤ්ඤ සූත්‍රය - සංයුත්ත නිකාය
- සත්තජටිල සූත්‍රය - සංයුත්ත නිකාය
- සමිද්ධි සූත්‍රය - සංයුත්ත නිකාය
- මක්ඛලී සූත්‍රය - අංගුත්තර නිකාය
- ඒකකනිපාතය - අංගුත්තර නිකාය
- කේසකම්බල සූත්‍රය - අංගුත්තර නිකාය
- නානාතිත්ථිය සූත්‍රය - උදාන පාලිය
- චූල සුභද්දා කතා වස්තුව - ධම්මපදට්ඨ කතාව
- සේඛියා ධර්ම - භික්ෂු ප්‍රාතිමෝක්ෂය
- භාරතීය සංස්කෘතික ඉතිහාසය - රෝලින්සන් (1959) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- බුද්ධ ධර්මය - සමාජය හා සංස්කෘතිය - අත්තුඩාවේ රාහුල හිමි

**නිපුණතාව 1.0** : ප්‍රාග් බෞද්ධ හා බුද්ධ කාලීන ආගමික, සාමාජික, දේශපාලනික හා ආර්ථික පසුබිම විමර්ශනාත්මක ව දකියි.

**නිපුණතා මට්ටම 1.3** : බුද්ධ කාලීන භාරතීය දේශපාලන ව්‍යූහය හා ක්‍රියාකාරිත්වය ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 21 යි.

**ඉගෙනුම් පල** :

- බුද්ධ කාලීන භාරතීය දේශපාලන පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගනියි.
- රාජාණ්ඩු හා සමූහාණ්ඩු ක්‍රමවල සාධනීය ලක්ෂණ මෙන් ම ගැටලු ද අවබෝධ කර ගැනීමට පෙලඹෙයි.
- පාලකයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.
- පරිපාලන කටයුතුවල දී නොගැටී ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ප්‍රාග් බෞද්ධ දේශපාලන ව්‍යූහය සකස් වී තිබූ ආකාරය හා බුදුසමය පහළ වූ ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ භාරතීය දේශපාලන තත්ත්වය හඳුන්වාදෙමින් බුදු රදුන් සමකාලීන පාලකයන් සමඟ පැවති සබඳතා ගවේෂණය කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**සොළොස් මහා ජනපද**

- ක්‍රි.පූ. 8 වන සියවසේ පෞර රාජ්‍ය බිඳ වැටීම හා අග නගරය මාරුවීම නිසා ද ප්‍රාදේශික රජවරු විසින් කුඩා කුඩා රාජ්‍ය පිහිටුවා ගැනීම නිසා ද ජනපද සොළොසක් ඇති වූ බව.
- අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේති, වත්ස, කුරු, පංචාල, මත්ස්‍ය, සූරසේන, අස්සක, අවන්ති, ගන්ධාර, කාම්බෝජ ඒ ජනපද සොළොස වන බව.

**රාජාණ්ඩු ක්‍රමය**

- මගධ, කෝසල, වත්ස, අවන්ති ලෙස ප්‍රබල රාජාණ්ඩු සතරක් පැවති බව.
- එම රාජ්‍යවල පැවති මූලික ලක්ෂණ පහත සඳහන් ඒවා බව.
  මහරජ කෙනකු විසින් පාලනය කිරීම.
  බොහෝ විට පිය පුතු පරපුරෙන් රජ පදවිය උරුම වීම.
  ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල රජුට හිමි වීම. රජතුමා නීති පැනවීම, නීති ක්‍රියාත්මක කරවීම හා දඬුවම් පැමිණවීම.
  යුවරජ, පුරෝහිත, අධිකරණ නායක, සේනාධිපති මඟින් බලය ක්‍රියාත්මක වීම.
  දුර්වල අසල්වැසි රාජ්‍යවල පාලකයන් පරදවා තම බලය පුළුල් කර ගැනීමට 'මත්ස්‍ය න්‍යාය' ක්‍රියාත්මක කිරීම.
- ඒ අනුව රාජ්‍යය, මහාරාජ්‍යය, මහා අධිරාජ්‍ය නිර්මාණය වූ බව.

**මගධ රාජ්‍යය :**

- උතුරෙන් ගංගා නදිය ද නැගෙනහිරින් චම්පා නදිය ද නිරිතෙන් වින්ධ්‍යා කඳුවැටිය ද බටහිරින් සෝණ නදිය ද සීමා කොටගත් ප්‍රදේශය මගධ දේශයට අයත් වූ බව.
- රජගහ නුවර මගධයෙහි අගනුවර වූ අතර, බිම්බිසාර හා අජාසත් යන රජවරුන් බුද්ධ කාලීන පාලකයන් වූ බව.
- වේභාර, වේපුල්ල, ගිජ්ඣකූට, ඉසිගිලි, පාණ්ඩව යන පර්වත පහකින් වට වී පිහිටීම නිසා එය 'ගිරිබ්බජ' යන නමින් ද ප්‍රකට ව පැවති බව.
- විවිධ ක්‍රම මඟින් සමීප රාජ්‍ය යටත් කොට ගෙන සිය බලය පුළුල් කරගැනීම සඳහා ක්‍රියා කළ බිම්බිසාර රජ අධිරාජ්‍යයක් ගොඩනගා ගැනීමට වෑයම් කළ පැරණි ම භාරතීය පාලකයා ලෙස ද සැලකෙන බව.

**කෝසල රාජ්‍යය :**

- බටහිරින් පඤ්චාල රට ද දකුණින් ගංගා නදිය ද නැගෙනහිරින් සදානීරා (ගණ්ඩකී) නදිය ද උතුරින් නේපාලිය කඳුකර පෙදෙස ද සීමා කොටගත් ප්‍රදේශය කෝසලයට අයත් වූ බව.
- මුල් අවධියේ දී දුර්වල රාජ්‍යයක් ව පැවැති කෝසලය පසු කාලීන ව වඩාත් ප්‍රබල වූ බව
- එය බරණැස හා සාකේත රාජ්‍යය ද ඇතුළත් විශාල ප්‍රදේශයක් පුරා පැතිර ගිය බව හා එහි අගනුවර සාවත්ථි වූ බව.
- පසේනදී කොසොල් රජතුමා එහි බුද්ධ කාලීන පාලකයා වූ බව.

**වත්ස රාජ්‍යය:**

- වත්ස ජනපදය අවන්ති රටට උතුරෙන් යමුනා නදී තීරයේ පිහිටා තිබූ බව.
- කෝසම්බිය හෙවත් කොසඹෑ නුවර එහි අගනගරය වූ බව.
- පරන්තප රජුගේ පුත් උදේන රජු එහි බුද්ධ කාලීන පාලකයා වූ බව.

**අවන්ති රාජ්‍යය :**

- දඹදිව මධ්‍ය ප්‍රදේශයෙන් දකුණු දිශාවෙහි පිහිටි බුද්ධ කාලීන රාජ්‍යයක් බව.
- බුද්ධ කාලීන පාලකයා වූයේ චණ්ඩප්පජ්ජෝත රජු බව.
- උදේනිය එහි අගනුවර වූ බව.
- උත්තර අවන්තිය හා දක්ෂිණ අවන්තිය වශයෙන් මෙය කොටස් දෙකකට බෙදී පැවති බව.

**සමූහාණ්ඩු ක්‍රමය :**

- මෙය එකල හැඳින්වූයේ ගණතන්ත්‍ර රාජ්‍ය වශයෙන් බව.
- ව්‍යවස්ථාදායක, විධායක. අධිකරණ යන ත්‍රිවිධ බලතල, කණ්ඩායමක් මඟින් ක්‍රියාත්මක කිරීම සමූහාණ්ඩුවක ලක්ෂණය බව.
- බුද්ධ කාලීන භාරතයේ වජ්ජි හා මල්ල වශයෙන් ප්‍රධාන ගණතන්ත්‍ර රාජ්‍ය දෙකක් පැවති බව.
- ප්‍රාදේශීය පාලකයන් සමූහයක් එක් ව සාමූහික ව සාකච්ඡා කොට, සාමූහික ව තීරණ ගෙන, ක්‍රියාත්මක කිරීම ගණතන්ත්‍ර පාලනයක විශේෂ ලක්ෂණයක් බව.
- සප්ත අපරිහානීය ධර්ම පදනම් කොටගත් සාර්ථක ගණතන්ත්‍ර පාලන ක්‍රමයක් බුද්ධ කාලීන වජ්ජි රාජ්‍යයෙහි ක්‍රියාත්මක වූ බව හා එය බුදු රදුන්ගේ ප්‍රශංසාවට ලක් වූ බව.

**වජ්ජි රාජ්‍යය :**

- ගංගා නදියට උතුරින් පිහිටි රාජ්‍යයක් ලෙස සැලකෙන මෙහි දේශසීමා පැහැදිලි ව සඳහන් නොවන බව.
- වජ්ජි, ලිච්ඡවි, විදේහ, ඥාතක, උග්‍ර, භෝග, ඓස්වත, කෞරව යන වංශ අටකින් සමන්විත ජනතාවක් විසූයේ යැයි වියතුන් පිළිගෙන ඇති බව.
- මෙහි අග නගරය විශාලා මහනුවර වූ බව.
- කූටාගාර ශාලාව, උදේන, ගෝතමක, සත්තම්බ, සාරන්දද, චාපාල හා බහුපුත්ත ආදි චෛත්‍යයන් ද ගෝසිංගසාල හා අම්බපාලී වනෝද්‍යාන ද බුදුන් වහන්සේ අවසන් වස විසූ බේලුව ග්‍රාමය ද මෙහි පිහිටා තිබූ බව.

**මල්ල රාජ්‍යය :**

- බටහිරින් ශාක්‍ය ජනපදය ද දකුණින් වජ්ජි රට ද මෙහි සීමාව වන බව.
- මල්ල රාජ්‍ය, කෝසිනාරකා හා පාවෙයියක යන කොටස් දෙකකින් යුක්ත ව පැවති බව.
- කෝසිනාරාවේ අගනුවර කුසිනාරා වන අතර පාවෙයියෙහි අගනුවර පාවා බව.
- ඔක්කාක වාංශික රාජාණ්ඩුවක් ව පැවති මෙහි පසු ව සමූහාණ්ඩුවක් ඇති වූ බව.
- උපවත්තන සල් උයන හා අනුපිය අඹ වනය මෙහි පිහිටා තිබෙන බව.

**බුද්ධ කාලීන භාරතීය පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර පැවැති සම්බන්ධතා**

- බුද්ධ කාලීන මගධ දේශයේ පාලකයා වූ බිම්බිසාර රජු බුදුරජාණන් වහන්සේ සමඟ බුද්ධත්වයට පෙර සිට ම මිත්‍රත්වයක් පැවැත් වූ බව.
- බුද්ධත්වයෙන් පසු ව බිම්බිසාර රජුට දහම් දෙසීම සඳහා බුදු රජාණන් වහන්සේ වැඩම කළ බව.
- තිරෝකුඩ්ඩ සූත්‍රය සේනිය බිම්බිසාර රජු සඳහා දේශනා කළ බව.
- වේළුවන උයන බිම්බිසාර රජු විසින් බුදු රජාණන් වහන්සේ වෙත පූජා කරන ලද අතර, එය ප්‍රථම ආරාම පූජාව ලෙස සැලකෙන බව.
- බිම්බිසාර රජුගේ ඉල්ලීම මත රාජ භටයන් පැවිදි නො කළ යුතු යැයි අනුදැන වදාළ බව.
- බිම්බිසාර රජතුමාගේ ඉල්ලීම පරිදි උපෝසථ කර්මය අනුදැන වදාළ බව අදත්තාදාන පාරාජිකාව පැනවූ බව.
- සාමඤ්ඤඵල සූත්‍රය අජාසත් රජු අරභයා දේශනා කළ බව.
- සුනීධ හා වස්සකාර ඇමතිවරුන් උපදෙස් ලබා ගැනීම සඳහා අජාසත් රජු විසින් බුදු රජාණන් වහන්සේ වෙත යොමු කරන ලද බව.
- බුදු රජාණන් වහන්සේ වස්සාන කාල විසිපහක් කෝසලයේ ගත කළ බව.
- තමන් බුදු රජාණන් වහන්සේ සමඟ කරුණු කිහිපයකින් සමාන යැයි කොසොල් රජු පවසා ඇති බව.
- කොසොල් රජු අරභයා සූත්‍ර රාශියක් දේශනා කර ඇති බව.
- කොසොල් රජු නිතර නිතර බුදු රජාණන් වහන්සේ සමඟ ධර්ම සාකච්ඡාවන්හි නිරත වූ බව.
- රජුගේ පෞද්ගලික ප්‍රශ්න විසඳා ගැනීමට පවා බුදු රජාණන් වහන්සේ පිහිට වූ බව.
- පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ගෙන් ධර්මය අසා උදේන රජු තෙරුවන් සරණ ගිය බව.
- උදේන රජතුමාගේ භද්‍රවතිකා ඇතින්න අරභයා කළගුණ සැලැකීමේ අගය දේශනා කළ බව.
- මහාකච්චාන තෙරුන් වහන්සේගේ ධර්මය අසා චණ්ඩපජ්ජෝත රජු තෙරුවන් සරණ ගිය බව.
- වජ්ජි රාජ්‍යයට අයත් විශාලා මහනුවර තුන් බිය දුරු කිරීමට බුදු රජාණන් වහන්සේ රතන සූත්‍රය දේශනා කළ බව.
- වජ්ජීන්ට සප්ත අපරිහානීය ධර්ම දේශනා කළ බව.
- වජ්ජීන්ගේ කූටාගාර ශාලාව බුදු රදුන් නිරන්තර වැඩ සිටි ස්ථානයක් බව.
- මල්ල රජදරුවන්ගේ අඹ වනයේ බුදු රජාණන් වහන්සේ වැඩ සිටින අතර එහි දී ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිද්ද සිදු වූ බව.
- බුදු රජාණන් වහන්සේ කුසිනාරාවේ මල්ල රජදරුවන්ගේ උපවත්තන සල් උයනට පිරිනිවන් පෑම සඳහා වැඩම කළ බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. 'සොළොස් මහා ජනපදවල ප්‍රභවය' යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතට ලිපියක් සකස් කරන්න.
2. රාජාණ්ඩු හා සමූහාණ්ඩු ක්‍රමවල සුවිශේෂ ලක්ෂණ වෙන් වෙන් ව වගුගත කරන්න.
3. බුදු රජාණන් වහන්සේ සමග පාලකයන් පැවැත්වූ සම්බන්ධතාව කරුණු වශයෙන් ගොනු කරන්න.
4. මහා රාජ්‍යයවල පාලකයන්, රාජ්‍ය හා අගනගර වෙන් වෙන් ව වගුවක් මඟින් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
5. සොළොස් මහා ජනපද හා ඒ සඳහා වර්තමානයේ භාවිත කරන නම සොයා තම සටහන් පොතෙහි සටහන් කර ගැනීමට සිසුන් යොමු කරන්න.
6. සොළොස් මහා ජනපදවල බුදුදහම ව්‍යාප්ත ව පැවති බවට පිළිගත හැකි උදාහරණ පිළිබඳ ලේඛනයක් සකස් කරන්න.

**පරිශීලනයට :**

- සාමඤ්ඤඵල සූත්‍රය - දීඝ නිකාය
- මහාපරිනිබ්බාන සූත්‍රය - දීඝ නිකාය
- ධම්මචේතිය සූත්‍රය - මජ්ඣිම නිකාය
- කෝසල සංයුත්තය - සංයුත්ත නිකාය
- උපෝසථඛන්ධකය - මහාවග්ගපාලිය
- උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය 1 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- බුද්ධ චරිතය - බළංගොඩ ආනන්දමෛත්‍රී මාහිමි (1933) කොළඹ තරුණ බෞද්ධ සංගමය
- බෞද්ධ භාරතය - රීස් ඩේවිඩ්ස් (2009), අනුවාදය ඔදම්විට ධම්මජෝති හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
- බුද්ධ ධර්මය, සමාජය හා සංස්කෘතිය - අත්තුඩාවේ රාහුල හිමි
- අසිරිමත් ඉන්දියාව - ඒ. එල්. බෂාම් (1962)
- බෞද්ධ ශිෂ්ටාචාරය මූලධර්ම හා වංශකථාව - චන්දිම විජේබණ්ඩාර, එච්.එම්.මොරටුවගම (1990) සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්
- සූත්‍ර ධර්ම අධ්‍යයනය - පී. වීරතුංග (2011) වාසනා කුමාරි දිසානායක, ස්කොට්ලන්තය

**නිපුණතාව 1.0 :** ප්‍රාග් බෞද්ධ හා බුද්ධ කාලීන ආගමික, සාමාජික, දේශපාලනික හා ආර්ථික පසුබිම විමර්ශනාත්මක ව දකියි.

**නිපුණතා මට්ටම 1.4 :** ක්‍රි. පූ. 6 වන සියවසේ ආර්ථික පසුබිම හැඳින ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 21 යි.

**ඉගෙනුම් පල:**

- ක්‍රි. පූ. හයවැනි සියවසේ ආර්ථික පසුබිම විස්තර කරයි.
- සමාජ අවශ්‍යතා අනුව විවිධ වෘත්ති බිහි වන බව පිළිගනියි.
- බුද්ධ කාලීන ජීවන වෘත්තිවල නාමාවලියක් පිළියෙල කරයි.
- අදාළ වෘත්තිවල කාර්යක්ෂම ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ක්‍රි. පූ. 6 වන සියවසේ භාරතයේ පැවැති ආර්ථික පසුබිමට පාදක වූ කෘෂි ආර්ථිකය, වෙළෙඳාම හා වෙනත් කර්මාන්ත පිළිබඳ අවබෝධයක් ලබාදීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**වාණිජකරණය හා නාගරීකරණය**

- ක්‍රි.පූ. 6 වන සියවසේ භාරතීය සමාජය ධනෝපායනයේ දී කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය, විවිධ ගෘහස්ථ කර්මාන්ත, රාජ්‍ය සේවය මෙන් ම වාණිජ්‍යය හෙවත් වෙළෙඳාම ද ප්‍රධාන මාධ්‍ය ලෙස භාවිත කළ බව.
- රාජගහ, සාකේත, කෝසම්බි, බාරාණසි යන නගර මහ නගර ලෙස නිර්මාණය වූ බව.
- මධුරා, චම්පා, වේසාලි, උජ්ජේනි ආදිය ද නාගරික පරිසරයක පැවති බව.
- රාජ්‍යයන් අතර හා ජන කොටස් අතර පැවති නිරන්තර යුද ගැටුම් නිසා වාණිජ්‍ය නිෂ්පාදන සඳහා ඉල්ලුම වැඩි වූ බව.
- දුර්වල පාලකයන් පරදවා රජවරුන් බලය ව්‍යාප්ත කිරීමේ දී යුද්ධ හමුදාවට වැදගත් ස්ථානයක් හිමි වීම, යුද්ධෝපකරණ මෙන් ම යුද්ධ සඳහා නගර ස්ථාපනය කිරීම, නගර ඇති වීමත් සමඟ ජනතාව නගර කරා ඇදී ඒම නිසා නගරාශ්‍රිත ව ජනගහනය වර්ධනය වීම හා නිෂ්පාදනයට වඩා පරිභෝජනය වැඩි වීම. ඒ අනුව ගම්වල නිපදවන පාරිභෝගික භාණ්ඩ නගර කරා ගෙන ඒම සිදු වූ බව.
- භාණ්ඩ හුවමාරු වෙනුවට මුදල් භාවිතයට ක්‍රමයෙන් හුරු වීම මඟින් මස්ස, අඩමස්ස, කහවණු වැනි ලෝහ කාසි, භාවිතය සමාජය තුළ ව්‍යාප්ත වීම හා නව වෙළෙඳ පන්තිය බිහි වූ බව.

-

- භාරතයේ දේශීය මාර්ග පද්ධතිය දියුණු වී අන්තර්ජාතික සමුද්‍ර මාර්ග හා බද්ධ වීම, ගොඩබිම් මාර්ග හා සමුද්‍ර මාර්ග ඔස්සේ වෙළෙඳාම් කටයුතු සිදුකිරීම, සුප්පාරක, භාරුකච්ච හා තාම්‍රලිප්ති වැනි වෙළෙඳ වරාය බිහිවීම, සුළු හා මහා පරිමාණ වෙළෙඳාම් කටයුතු දියුණු වීම ක්‍රමයෙන් වර්ධනය වූ බව.
- උත්සව සැණකෙළි මෙන් ම සුරාසැල් ද ගණිකා වෘත්තිය වැනි කටයුතු ද ව්‍යාප්ත වූ බව.
- වෙළෙඳාමෙන් ධනය උපයාගත් වෛශ්‍යයන් වෙළෙඳ ශ්‍රේණි වශයෙන් සංවිධානය වී එහි නායකයා සිටු තත්ත්වයට පත්වූ බව.
- සංචාරක වෙළෙඳාම, පදික වෙළෙඳාම, ස්ථාවර වෙළෙඳාම, දේශීය හා විදේශීය වෙළෙඳාම සුළු, මධ්‍ය හා මහා පරිමාණ වෙළෙඳාම වශයෙන් වෙළෙඳ කටයුතු දියුණු වූ අතර වෙළෙඳුන් වෘත්තීය වශයෙන් සංවිධානගත වීම තෙක් වර්ධනය වූ බව.
- සැවැත් නුවර සිට සාකේත, කොසඹෑ, විදිසා, උදේනි හරහා එක් වෙළෙඳ මාවතක් ද සැවැත් නුවර සිට රජගහ නුවර තෙක් කපිලවස්තුව, කුසිනාරාව, විසාලාව, පැළලුප් නුවර හරහා තවත් වෙළෙඳ මාවතක් ද බරණැස සිට වේරංජාව තෙක් තවත් වෙළෙඳ මාවතක් ද වශයෙන් වෙළෙඳ මාවත් තුනක් තිබූ බව.

**කෘෂිකර්මය :**

- ආර්ය ජනාවාස ආරම්භයට පෙර සිට ම කෘෂිකර්මාන්තය ප්‍රබල ජීවන වෘත්තියක් ව පැවති බව.
- බෞද්ධ සාහිත්‍යාගත මූලාශ්‍රය අනුව 'බත' භාරතීය ජනයාගේ ප්‍රධාන ආහාරය වූ බව.
- 'බත' ඕදන නාමයෙන් හැඳින්වූ බව.
- පුද්ගල නාමවලට පවා ඕදන යන්න ඇතුළත් වූ බව.
- කසීභාරද්වාජ සූත්‍රය ඇතුළු බොහෝ සූත්‍රවල කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ව සඳහන් වී ඇති බව.
- කූටදන්ත සූත්‍රයෙහි සඳහන් වන ආකාරයට කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්ට රාජානුග්‍රහය ලබාදිය යුතු බව.
- රජු සහභාගි වන වැදගත් උත්සවයක් ලෙස වප්මඟුල සිදු කරන ලද බව.
- කෙත්වතුවලට අධිපති වූ රජ කුලය 'ඛත්තිය' නමින් හැඳින් වූ බව.
- මගධ කෙත්යායේ ආකෘතියට අනුව බෞද්ධ භික්ෂූන්ගේ සිවුරු සකසා ගත් බව.
- බුද්ධ කාලීන භාරතයේ දියුණු වාරිමාර්ග පද්ධති පැවති බව හා ජලය පිළිබඳ ව ඇති වූ ගැටලුවල දී බුදු රජාණන් වහන්සේ මැදිහත් වූ බව.

**වෙළෙඳාම :**

- මෙහි වාණිජකරණය හා නාගරිකකරණය යන සිරස්තල යටතේ වෙළෙඳාමට අදාළ තොරතුරු රාශියක් ඉහතින් සඳහන් කොට ඇති බව.
- බුද්ධ කාලීන භාරතයේ ප්‍රධාන ධනෝපායන මාර්ගයක් ලෙස වෙළෙඳාම පැවති බව.
- වෙළෙඳාම දේශීය හා විදේශීය වශයෙන් පැවති බව.
- වෙළෙඳාමෙන් විශාල ධනයක් උපදවා ගත් අය සෙට්ඨී හෙවත් සිටුවරුන් නමින් හඳුන්වා දුන් බව
- බුදු සසුනට විශාල වශයෙන් සිටුවර වෙළෙඳ පන්තියෙන් අනුග්‍රහ ලැබී ඇති බව.

**වෙනත් කර්මාන්ත :**

- කෘෂිකර්මාන්තය හා වෙළෙඳාම හැරුණු විට ජීවිකා වෘත්ති වශයෙන් වෙනත් විවිධ කර්මාන්ත පැවති බව.
- සාමඤ්ඤඵල සූත්‍රයේ දී එකල සමාජයෙහි පැවැති කර්මාන්ත රාශියක් පිළිබඳ ව සඳහන් ව ඇති බව.
- හස්ති ශිල්ප, අශ්ව ශිල්ප, ධනු ශිල්ප, මල් කර්මාන්තය, කුඹල් කර්මාන්තය, පේෂකාර, ස්වර්ණකාර, දණ්ඩකම්ම, දාරුකම්ම යනාදිය එයින් කිහිපයක් බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. බුද්ධ කාලීන ජීවන වෘත්ති පිළිබඳ නාමාවලියක් සකස් කරන්න.
2. බුද්ධ කාලීන භාරතයේ පැවති වෙළෙඳාම පිළිබඳ ව පන්ති කාමරයේ දී කරන කතාවක පිටපතක් සකසන්න.
3. නාගරිකරණයේ හා වාණිජකරණයේ වාසි හා අවාසි වගුගත කරන්න.
4. බුද්ධ කාලීන භාරතයේ වාණිජකරණය හා නාගරිකකරණය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක ලේඛනගත කරන්න.
5. බුද්ධ කාලීන භාරතයේ දියුණු කෘෂි ආර්ථික ජීවන රටාවක් පැවතුණු බවට හැකි තාක් කරුණු රැස් කරවා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
6. 'ආර්ථික සමෘද්ධිය සඳහා සදාචාර සමෘද්ධියට හානි කර ගැනීම අනුවණකමකි' යන තේමාව ඔස්සේ ලිපියක් ලිවීමට යොමු කරන්න.

**පරිශීලනයට :**

- අග්ගඤ්ඤ සූත්‍රය - දීඝ නිකාය
- කූටදන්ත සූත්‍රය - දීඝ නිකාය
- සාමඤ්ඤඵල සූත්‍රය - දීඝ නිකාය
- කසීභාරද්වාජ සූත්‍රය - සංයුත්ත නිකාය
- රජ්ජ සූත්‍රය - සංයුත්ත නිකාය
- භාරතයේ මුල් අවස්ථාව - ජිනදාස කපුගේ
- බෞද්ධ භාරතය - රීස් ඩේවිඩ්ස්
- බෞද්ධ ශිෂ්ටාචාරය මූලධර්ම හා වංශ කථාව - චන්දිම විජේබණ්ඩාර, එම්. එම්. මොරටුවගම
- උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය 1 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

- බෞද්ධ ආර්ථික දර්ශනය - බෙලිගල්ලේ ධම්මජෝති හිමි (1993)
  රත්න ප්‍රකාශකයෝ
- මුල් බුදු සමයෙන් හෙළිවන ආර්ථික දර්ශනය - ධර්මසේන හෙට්ටිආරච්චි (1994)
  අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- බෞද්ධ ශිෂ්ටාචාරය මුල් යුගය - රෙජී වීරමන් (1985)
  එම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ.
- බුදු සමයේ දේශපාලන චින්තනය - එස් දයා ප්‍රනාන්දු (1984)
  එස්. ගොඩගේ මුද්‍රණාලය
- රාජ්‍ය පාලනයට බෞද්ධ උපදෙස් - ධර්මසේන හෙට්ටිආරච්චි
  ගුණසේන මහතන්ත්‍රිගේ
- Dictionary of pali proper names - G.P. Malalasekara.(1983)Vol-1,2
  New Dilhi Oriented Books

**නිපුණතාව 2.0** : බුදු රජාණන් වහන්සේගේ හා පරමාදර්ශී ශ්‍රාවක- ශ්‍රාවිකාවන්ගේ විශිෂ්ට චරිත ලක්ෂණ අධ්‍යයනය කර ආදර්ශයට ගනියි.

**නිපුණතා මට්ටම 2.1** : බුදු රජාණන් වහන්සේගේ සුවිශේෂ ගුණ හා විශිෂ්ට චරිත ලක්‍ෂණ අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 30 යි.

**ඉගෙනුම් පල** :

- බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හඳුනා ගනියි.
- විශිෂ්ට බුදුගුණ චරිතායනයට පෙලඹෙයි.
- බුදුගුණ ප්‍රකට වන නිර්මාණකරණයෙහි යෙදෙයි.
- සැදැහැ සිතින් ආමිස හා ප්‍රතිපත්ති පූජාවල නියැළෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු රජාණන් වහන්සේගේ උතුම් නව අරහාදි බුදු ගුණ මෙන්ම මහා කරුණාව මහා ප්‍රඥාව ආදි සෙසු ගුණාංගයන් ද උන් වහන්සේගේ විශිෂ්ට චරිත ලක්‍ෂණ ද විස්තරාත්මක අධ්‍යයනයකට යොමු කරවමින්, ඒවා පුද්ගල චරිත හැඩගස්වාලීමෙහි ලා උපකාර කර ගැනීමට අවකාශ සැලසීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**නව අරහාදී බුදු ගුණ**

''ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ
විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ
අනුත්තරෝ පුරිසදම්මසාරථී
සත්ථා දේව මනුස්සානං බුද්ධෝ භගවා''

- බුද්ධ කාලීන භාරතීය සමාජය තුළ බුදු රජාණන් වහන්සේ පිළිබඳ මහත් කීර්තියක් පැතිර තිබූ බව.
- බොහෝ සූත්‍රවල ඇතුළත් මෙම සුවිශේෂ ගුණ නව අරහාදි බුදු ගුණ ලෙස ව්‍යවහාරයට පැමිණ ඇති බව.
- අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණසම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තර පුරිසදම්ම සාරථී, සත්ථාදේවමනුස්සානං, බුද්ධෝ, භගවා යනු ඒ බුදු ගුණ නවය බව.

**අරහං**

- සියලු කෙලෙස්වලින් දුරු වූ බැවින් ද, සංසාර චක්‍රයේ අර සිඳලූ බැවින් ද කෙලෙස් සතුරන් නැසූ බැවින් ද රහස් නොමැති බැවින් (න රහං යස්ස සො අරහං) එනම් රහසින් හෝ පව් නො කරන බැවින් ද සියලු පූජාවන්ට සුදුසු වූ හෙයින් ද බුදු රජාණන් වහන්සේ 'අරහං' යනුවෙන් හඳුන්වනු ලබන බව.

- රහසත් පව් නොකොට
  කෙලෙසරයනුත් දුරු කොට
  නිසි වූයෙන් පුදට
  අරහ යයි නම කියති මුනිඳුට

(බුදුගුණ අලංකාරය)

යනුවෙන් අරහං බුදුගුණය විස්තර කෙරෙන බව.

**සම්මා සම්බුද්ධ**

- මැනවින් තමා ම අවබෝධ කළේ ය, අවබෝධ කරයි, අවබෝධ කරන්නේය, (සම්මා සයමෙව අබුජ්ඣි, බුජ්ඣති, බුජ්ඣිස්සතීති සම්මාසම්බුද්ධො) යන අරුතින් බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධ වන බව.

- දැනගත යුතු සියලු ධර්ම දැන ගෙන අවබෝධ කළ බැවින් ද, සාක්ෂාත් කළ යුතු සියලු ධර්ම සාක්ෂාත් කළ බැවින් ද, වැඩිය යුතු සියලු ධර්ම වැඩිය යුතු ධර්ම ලෙස වැඩූ බැවින් ද, ප්‍රහීණ කළ යුතු සියලු ධර්ම, ප්‍රහීණ කළ යුතු ධර්ම ලෙස ප්‍රහීණ කළ බැවින් ද 'බුද්ධ' නම් වන බව හා ඒවා තමා විසින් ම සිදු කරන ලද බැවින් සම්මා සම්බුද්ධ යැයි කියන බව.

තුන් කල්හි ම පැවති
පදරුත් සියල් ලොව ඇති
අතැඹුල සෙ දැන ගති
එයින් සම්මා සම්බුදුන යෙති

(බුදුගුණ අලංකාරය)

**විජ්ජාචරණ සම්පන්න**

- අෂ්ට විද්‍යාවෙන් ද, පසළොස් චරණ ධර්මයෙන් ද යුක්ත වූ බැවින් බුදු රජාණන් වහන්සේ 'විජ්ජාචරණ සම්පන්න' නාමයෙන් හඳුන්වනු ලබන බව.

අෂ්ට විද්‍යා යනු

විපස්සනාඤාණය
මනෝමයඉද්ධිඤාණය
ඉද්ධිවිධඤාණය
දිබ්බසෝතඤාණය
පරචිත්තවිජානනඤාණය
පුබ්බේනිවාසානුස්සතිඤාණය
දිබ්බචක්ඛුඤාණය
ආසවක්ඛයඤාණය

ලෙස දක්වා ඇති බව

(අම්බට්ඨ සූත්‍රය, දී.නි)

පසළොස් චරණ ධර්ම යනු

සීල සම්පන්න වීම
වැසුණු ඉන්ද්‍රියද්වාර තිබීම
භෝජනයෙහි පමණ දැනීම
නිදි වැරීමෙහි යෙදීම
ශ්‍රද්ධාව
හිරි
ඔත්තප්ප
බහුශ්‍රැත බව
වීර්යය
සිහි ඇති බව
ප්‍රඥාව (උදයත්ථගාමිණී)
ප්‍රථමධ්‍යානය
ද්විතීයධ්‍යානය
තෘතීයධ්‍යානය
චතුර්ථධ්‍යානය බව

(සේඛ සූත්‍රය ම.නි)

විද්දෑ නැණ අට ද
පසළොස් චරණ ගුණය ද
ඇතියෙන් එ මුනි සඳ
පිරුණු විජ්ජාචරණ නම් ලද

(බුදුගුණ අලංකාරය)

**සුගත**

බුදු රජාණන් වහන්සේ ශාස්වත හා අශාස්වත යන අන්තද්වයට නො පැමිණ සුන්දර වූ නිවනට ගිය බැවින් ද එම නිවනට යහපත් ආකාරයෙන් ගිය බැවින් ද, සුදුසු තැන, සුදුසු වචන යහපත් ව කියන බැවින් ද 'සුගත' නාමයෙන් හැඳින්වෙන බව.

යහපත් කොට යෙතැ යි
සුන්දර තැනට සැපතැ යි
සොඳුරු බස් කියතැ යි
කියති ඒ මුනි රජුට සුගතැ යි

(බුදුගුණ අලංකාරය)

**ලෝකවිදූ**

- බුදු රදුන් ලෝකය ස්වභාව වශයෙන් ද ලෝක සමුදය වශයෙන් ද ලෝක නිරෝධ වශයෙන් ද නිරෝධය පිණිස උපාය වශයෙන් ද (මාර්ගය වශයෙන්) යන සියලු ආකාරයෙන් ලෝකය දන්නා බැවින් ද අවබෝධ කළ බැවින් ද ලෝකවිදූ නම් වන බව. තව ද සංඛාර ලෝක, සත්තලෝක, ඕකාසලෝක යන තුන්ලෝකය සැම අයුරින් ම මැනවින් දන්නා බැවින් ලෝකවිදූ වන බව.

| | |
|---|---|
| තුන් ලොව තතු | ලෙසට |
| දැන ගෙන නොදත් මෙ | ලොවට |
| දෙසුයෙන් නියම | කොට |
| ලෝකවිදූ යැ යි කියති | මුනිඳුට |

(බුදුගුණ අලංකාරය)

**අනුත්තර පුරිසදම්මසාරථි**

- අනුත්තර පුරිසදම්මසාරථී බුදුගුණය ඇතැම් පොත්වල අනුත්තර එක් බුදුගුණයක් ලෙස ද, පුරිසදම්මසාරථී තවත් බුදුගුණයක් ලෙස ද විස්තර වන බව.

- බුදු රදුන්ට වඩා උසස් කෙනකු ලොව නැති බැවින් ද සියල්ලන්ට ම වඩා ශ්‍රේෂ්ඨ යන අරුතින් ද, එයට වඩා වැඩි දෙයක් නැති උසස් ම වූ නිවන අවබෝධ කළ හෙයින් ද ශ්‍රේෂ්ඨ අසදෘෂවූ යන අරුතින් ද පසේබුදු, අරහත් ආදි කිසිවකුට සාධාරණ නො වන බැවින් ද, බුදු රජාණන් වහන්සේ අනුත්තර නම් වන බව.

| | |
|---|---|
| හැම ගුණයෙන් | නඳා |
| සම වැඩි සතකු හැම | දා |
| දියතෙහි නැති | සඳා |
| අනුත්තර යැ යි කියති | මුනිඳා |

(බුදුගුණ අලංකාරය)

- දමනය නොවූ, නො හික්මුණා වූ පුරුෂයන්,එනම් තිරිසන් වේවා, මනුෂ්‍ය වේවා, අමනුෂ්‍ය වේවා සත්ත්වයන් දමනය කිරීමෙහි හැකියාව පුරිසදම්ම සාරථි බුදුගුණයෙන් කියැවෙන බව.

- බුදු රදුන් නො දැමුණු පුරුෂයන් දමනයේ දී විවිධ උපාය උපක්‍රම භාවිත කළ බව
- තුන් බෑ ජටිලයන්, සච්චක, සෝණදණ්ඩ, අක්කෝසක වැනි මිනිස් පුරුෂයන් ද, ආලවක, සුචිරෝම, ඛරරෝම ආදි අමනුෂ්‍ය පුරුෂයන් ද, නාලාගිරි, අග්ගිසිඛ, ධූමසිඛ, අපලාලනාගරාජ ආදි තිරිසන් ගත පුරුෂයන් ද වශයෙන් මෙසේ විශාල පිරිසක් දමනය කර ඇති බව.

- නො දැමුණු විවිධ පුද්ගලයන් දමනය කිරීමට බුදු රදුන්ට තිබූ අසමසම හැකියාව නිසා උන් වහන්සේ 'අනුත්තර පුරිසදම්මසාරථී' යනුවෙන් හැඳින්වෙන බව.

| | |
|---|---|
| බඹ සුර යකුන් | තද |
| දමනය කර තමන් | ලද |
| සෙත් දී මුනිඳු | සඳ |
| පුරිසදම් සාරතී නම් | ලද |

(බුදුගුණ අලංකාරය)

**සත්ථාදේවමනුස්සානං**

- දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික සම්පරායික යන උභයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා කරන බැවින් ද (සදෙවකෙ ලොකෙ සාසතීති සත්ථා) දෙව් මිනිසුන්ට ශාස්තෘවරයා මෙන් ම ගුරුවරයා වන බැවින් ද, බුදු රජාණන් වහන්සේ 'සත්ථා' (සත්ථාදෙවමනුස්සානං) යනුවෙන් හැඳින්වෙන බව.

| | |
|---|---|
| බව කතරින් | එතර |
| ලනුයෙන් සතන් හැම | වර |
| තිලෝගුරු | මුනිවර |
| වී ය සත්තා නමින් | පුවතර |

(බුදුගුණ අලංකාරය)

**බුද්ධ**

- සියලු සංඛත ධර්ම හා අසංඛත ධර්ම අවබෝධ කළේ ය, අවබෝධ කරයි, අවබෝධ කරන්නේ යන අර්ථයෙන් බුදු රජාණන් වහන්සේ 'බුද්ධ' යනුවෙන් හඳුන්වනු ලබන බව. (සබ්බේ සංඛතාසංඛත ධම්මෙ අබුජ්ඣි, බුජ්ඣති, බුජ්ඣිස්සතීති බුද්ධෝ)

- දත යුතු සියල්ල අවබෝධ කළ බැවින් ද, චතුරාර්ය සත්‍යය තමන් වහන්සේ ම අවබෝධ කොට අන්‍යයන්ට ද අවබෝධ කරවන හෙයින් ද උන් වහන්සේ 'බුද්ධ' නම් වන බව

- සියල්ල දන්නා බැවින් ද, සර්වඥ බැවින් ද, වෙනෙකකු විසින් අවබෝධ නො කරවිය යුතු නිසා ද, ක්ෂීණාශ්‍රව නිසා ද, වීතරාගී නිසා ද ආදි බොහෝ කරුණු නිසා 'බුද්ධ' නම් වන බව (චුල්ලනිද්දේසපාළි)

| | |
|---|---|
| සිවු සස් සිය | නැණින් |
| දුන දුන්වී ය | කුලුණින් |
| දුරලයි | අනුවණින් |
| එ බුදු නම් වී ය නැණ | පමණින් |

(බුදුගුණ අලංකාරය)

**භගවා**

- 'භග සංඛාතා ධම්මා අස්ස සන්තීති භගවා' යනුවෙන් අටුවාවේ දැක්වෙන බව.

- 'භග' ලක්ෂණය හෙවත්, භාග්‍යවත් බව, සමෘද්ධිය, කීර්තිය යනාදි ගුණ දරන තැනැත්තා 'භගවා'නම් වන බව.

| | |
|---|---|
| භගී භජී භාගී විභත්තවා | ඉති |
| අකාසි භග්ගන්ති ගරූහි | භාග්‍යවා |
| බහූහි ඤායෙහි | සුභාවිතත්තෝ |
| භවන්තගො සො | භගවාතිවුච්චති |

(ඛුද්දක නිකාය - අට්ඨ කථා)

- භග ධර්ම ඇත්තේ ය, පනවන ලද සේනාසනාදිය භජනය කළේ ය, අර්ථ, ධර්ම, විමුක්ති රස භාග ඇත්තේ ය, ධර්මය විභාග විශ්ලේෂණය කළේ ය, රාගාදි කෙලෙස් බිඳ දැමුවේ ය, භාග්‍ය ඇත්තේ ය, භාවනාවෙන් වඩනා ලද සිත් ඇත්තේ ය, භවයෙහි අන්තයට ගියේ ය, යන අරුතින් ද 'භගවා' නම් වන බව.
- භගවා යනු ශ්‍රේෂ්ඨ නාමයක් බැවින් ද, එය උතුම් නාමයක් බැවින් ද, උන් වහන්සේ ගරු ගෞරවයෙන් යුක්ත වන බැවින් ද 'භගවා' නම් වන්නේ යැයි ද අටුවාවේ සඳහන් බව.

බෙදුයෙන් දහම් කඳ
බජනය කෙළෙන් ගුණ කඳ
බග දහමින් සසඳ
බැවින් භගවත් වී ය මුනි සඳ

(බුදුගුණ අලංකාරය)

**මහා කරුණාව**

- අනුන්ගේ දුක දැක ගුණ හරිත හදවතක් ඇති අයකු තුළ ඇති වන දයානුකම්පාව කරුණාව බව.
  "පරදුක්ඛේ සති සාධූනං හදය කම්පනං කරෝතීති කරුණා"
  (අනුන්ගේ දුකෙහි දී සත්පුරුෂයන්ගේ හදවතෙහි ඇති කරන කම්පනය කරුණාව යි.)
  "අහිත දුක්ඛාපනයන කාමතා කරුණා"
  (අන්‍යයන්ගේ දුක් කරදර නැති කිරීමේ කැමැත්ත කරුණාව යි.)
  "කිණාතිවා පරදුක්ඛං හිංසති විනාසේතීති කරුණා"
  (අන්‍යයන්ගේ දුක් විනාශ කිරීම කරුණාව යි.)

- සතර බ්‍රහ්ම විහරණයන්ගේ දෙවැන්න කරුණාව බව.
- සසර දුකට පත් ව සිටින සත්ත්වයා දැක බුදුවරයකු තුළ ඇතිවන අනුකම්පාව මහා කරුණාව බව.
- බුදුවරයකුට හැර වෙනත් කිසිවකුට නොපිහිටන උතුම් ගුණ සමුදායයන් අතුරින් එකක් ලෙස මහා කරුණාව සැලකෙන බව හා එය බුද්ධ සමාපත්තියක් මෙන් ම බුද්ධ ඥානයක් වන බව.
- බුදුවරයා වනාහි මහා කරුණාවේ හා මහා ප්‍රඥාවේ ප්‍රතිමූර්තියක් බව.
- බුදු රජාණන් වහන්සේ දින චර්යාව ආරම්භ කරන්නේ මහා කරුණා සමාපත්තියට සමවැදි බුද්ධඥානයෙන් ලොව බැලීමෙන් බව.
- මුළු මහත් බුද්ධ චරිතය පුරාවට ම මෙම ගුණය පිළිබිඹු වන බව.
- සුනීත, සෝපාක, රජ්ජුමාලා, කිසාගෝතමී, මට්ටකුණ්ඩලී, පූතිගත්තතිස්ස තෙරුන්, හත්ථාලවක කුමරු, කෙත පාළු වූ ගොවියා, හද්‍රවතිකා ඇතින්න ආදීන්ගේ කතා පුවත් මඟින් මෙම ගුණය පිළිබිඹු වන බව.
- කාරුණික හදවතක් ඇති උදාර මිනිසුන් උත්තම පුරුෂයන් වශයෙන් ඉතිහාසගත වනවා පමණක් නොව ඒ අයගේ භවගාමී ජීවිතය ද සුවපත් වන බව.

මහා ප්‍රඥාව

- බුදු රජාණන් වහන්සේගේ කරුණාව මහා කරුණාව වන්නා සේ ම ප්‍රඥාව මහා ප්‍රඥාව වන බව.
- විදර්ශනා ඥානය හෙවත් ලෝකයේ ඇත්ත ඇති සැටියෙන් දක්නා නුවණ ප්‍රඥාව වන අතර එය ලෝකය හා ජීවිතය පිළිබඳ ව බුදු රජාණන් වහන්සේ සතු ව පැවැති ගැඹුරු වූ නුවණ බව.
- අනුපූර්ව ශික්ෂාවේ තෙවන පියවර ප්‍රඥාව බව.
- මහා ප්‍රඥාවට විෂය නොවුණු කිසිවක් ලොවෙහි නැති බව.
- බුදුරදුන් සතු ව පැවැති විවිධ ඥාන දර්ශනයන්ගෙන් ප්‍රඥා මහිමය ප්‍රකට වන බව.
- ත්‍රිවිද්‍යා ඥානය, අෂ්ට විද්‍යා ඥානය, සර්වඥතා ඥානය ආදි වශයෙන් එය විවිධාකාර වන බව.
- බුද්ධ ශරීරය කොතරම් දුර්වල වුව ද උන් වහන්සේගේ ප්‍රඥා ශක්තියෙහි කිසි දු වෙනසක් නොවේ යයි මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රයෙන් පැහැදිලි කෙරෙන බව.
- චුල්ල හත්ථිපදෝම සූත්‍රයේ දී පිලෝතික පරිබ්‍රාජක බුදුරදුන්ගේ ප්‍රඥාව වෙසෙසින් අගය කර ඇති බව.
- බුදුරදුන්ගේ මහා ප්‍රඥාව ආදර්ශයට ගෙන පුද්ගලයෙකුගේ මෙලොව ජීවිතය මෙන් ම පරලොව ජීවිතය ද අර්ථවත් එකක් බවට පත් කර ගැනීමටත් සසර දුකින් අත් මිදීමටත් හැකියාව ලැබෙන බව.
- බුදු රජාණන් වහන්සේගේ සෙසු ගුණාංගවලට වඩා මහා ප්‍රඥාව ශ්‍රේෂ්ඨ යයි උන්වහන්සේම දේශනා කර ඇති බව. (මහා සකුළුදායි සූත්‍රය).

ආදර්ශවත් නායකත්වය

- නිශ්චිත අරමුණක් කරා අනුගාමිකයන් මෙහෙයවන්නා හික්මවන්නා යන තේරුම නායක යන්නෙහි කියැවෙන බව.
- ඉහත කී අර්ථය අනුව බුදුරදුන් උදාර නායකයකු ලෙස හැඳින්වීම අතිශයින් ම යෝග්‍ය වන බව හා එයට අභියෝග කළ හැකි කිසි දු මනුෂ්‍යයකු, දෙවියකු, බ්‍රහ්මයකු මිහිමත පහළ නො වන බව.
- අන්තගාමී නොවීම, මැදහත් පිළිවෙතක් අනුගමනය කිරීම, දේශනා කෞශල්‍යය හා උපාය කෞශල්‍ය ඥානය, මහා කරුණාව හා මහා ප්‍රඥාව, ආගමික සහනශීලීත්වය ආදිය මඟින් බුදු රජාණන් වහන්සේගේ උතුම් නායකත්වය ප්‍රකට වන බව.
- බුදුරදුන්ගේ අසමසම නායකත්ව ලක්ෂණවලින් කිහිපයක් පහත සඳහන් පරිදි දැක්විය හැකි බව.
    1 දින චරියාව.
    2 සිවුවණක් පිරිස ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානු ධර්ම ප්‍රතිපන්න පිරිසක් වන තුරු තමන් වහන්සේ පිරිනිවන් නොපාන බව මාරයාට දැන්වීම.
    3 සුපිරිසිදු චරිතයකින් යුක්ත වීම .

4 යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී වීම.

5 සුදුස්සාට සුදුසු තැන ලබාදෙමින් සිවුවණක් පිරිසට අග තනතුරු ප්‍රදානය කිරීම.

6 ශ්‍රාවකයන්ගේ සුවපහසුව ගැන සොයා බැලීම.

7 විවේචනවලට බිය නොවී නිර්භීත ව ඕනම අභියෝගයකට නොසැලී මුහුණ දීම .

8 විමසීමට, ප්‍රශ්න කිරීමට, නිදහස් චින්තනයට ඉඩ ලබා දීම.

9 ශ්‍රාවකයන්ට ආදර්ශ සම්පන්න වීම.

10 තමන් වහන්සේගේ කාය වාක් සමාචාරයන් විමසා බැලීමට වුව ද ශ්‍රාවකයන්ට ඉඩකඩ සැලසීම.

11 ශ්‍රාවකයන්ගේ යහපත සඳහා ශික්ෂාපද පැනවීම හා අවශ්‍ය වූ විට ඒවා වෙනස් කිරීම යනාදිය.

**විශිෂ්ට ශාස්තෘත්වය**

- දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික, සම්පරායික යන උභයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා කරන බැවින් බුදු රජාණන් වහන්සේ ශාස්තෘවරයකු ලෙස හැඳින්වෙන බව.( සත්ථා දේව මනුස්සානං)

- ගුරුවරයා යන අර්ථය ද ශාස්තෘ යන්නෙහි ගැබ් ව ඇති අතර බුදු රජාණන් වහන්සේ තුන් ලෝකයේ ම ගුරුවරයා වන බැවින් තිලෝගුරු ලෙස හැඳින්වෙන බව.

- ශාස්තෘවරයකු, ගුරුවරයකු වශයෙන් බුදුරදුන් ශ්‍රාවකශ්‍රාවිකාවන්ගේ බුද්ධි මට්ටම, මානසික ස්වභාවය, දෘෂ්ටිමය පදනම, සාමාජික පරිසරය ආදිය සැලකිල්ලට ගනිමින් විවිධ පර්යාය අනුගමනය කරමින් උපාය කෞශල්‍යයෙන් යුතු ව දහම් දෙසූ බව.

- "නත්ථානන්ද තථාගතස්ස ධම්මේසු ආචරිය මුට්ඨි " යන දේශනාවට අනුව ගුරු මුෂ්ටි නොමැති ව විවිධ දේශනා ක්‍රම මඟින් ශ්‍රාවකයන්ට නොසඟවා දහම් දේශනා කළ බව.

- ඒ සඳහා යොදාගත් ඉගැන්වීම් ක්‍රම ගණනාවක් පැවැතුණ අතර ඍජු දේශනා ක්‍රමය, (දම්සක් පැවැතුම් සූත්‍රය) සාකච්ඡා ක්‍රමය, (කන්දරක සූත්‍රය) උපමානුසාරී දේශනා ක්‍රමය, (රාහුලෝවාද සූත්‍රය, කසීභාරද්වාජ සූත්‍රය) පැවැරුම් ක්‍රමය, (චුල්ලපන්තක, කිසාගෝතමී වැනි අයට) ආදිය ඊට නිදසුන් වන බව.

- බුදු රජාණන් වහන්සේ ප්‍රශ්න විසඳූ ක්‍රම හතරක් පෙළ දහමේ සඳහන් වන බව.

| | | | |
|---|---|---|---|
| 1 | ඒකංස ව්‍යාකරණීය | - | ඍජු පිළිතුරු සැපයීම ( ආලවක සූත්‍රය) |
| 2 | විභජ්ජ ව්‍යාකරණීය | - | විශ්ලේෂණාත්මක ව පිළිතුරු දීම (චුල්ලකම්ම විභංග සූත්‍රය) |
| 3 | පටිපුච්ඡා ව්‍යාකරණීය | - | ප්‍රතිප්‍රශ්න විමසා පිළිතුරු ලබාදීම (චුල්ලසච්චක සූත්‍රය) |
| 4 | ඨපනීය | - | ප්‍රශ්න පසෙකින් තැබීම (චුල්ලමාලුංක්‍ය සූත්‍රය) |

- අත්තජ්ඣාසය - තමන් වහන්සේගේ අදහසට අනුව සුදුසු ධර්මයක් දේශනා කිරීම, (ධම්මචක්ක සූත්‍රය)
- පරජ්ඣාසය - ශ්‍රාවකයාගේ අපේක්‍ෂාවට අනුව දහම් දෙසීම (අරිය පරියේසන සූත්‍රය)
- අට්ඨුප්පත්තික - අර්ථය පැහැදිලි කිරීම සඳහා දහම් දෙසීම. (සිගාලෝවාද සූත්‍රය)
- පුච්ඡාවසික - ප්‍රශ්නයකට පිළිතුරු දීම වශයෙන් දහම් දෙසීම (මංගල සූත්‍රය) යනුවෙන් තවත් දේශනා ක්‍රම හතරක් පැවැති බව.
- නිදහස් චින්තනයට හා විමංසනයට ඉඩ ලබා දීම, යථාවාදී තථාකාරී ගුණය, අන්‍ය ආගම් කෙරෙහි සුහද ආකල්පය, පුද්ගල ස්වාමිත්වය, තම විමුක්තිය තමාට ම පවරාදීම, කරුණාව, මෛත්‍රිය, ඉවසීම, තාදී ගුණය ආදිය බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය ප්‍රකට කරන ගුණාංග බව.
- දැඩි නීති රීති මඟින් සිය ශ්‍රාවකයන් පාලනය කිරීමට කිසි විටකත් උත්සාහ නො කළ බව.
- සදහම් අසා තුනුරුවන් සරණ ගිය ශ්‍රාවක-ශ්‍රාවිකාවන්ගේ ප්‍රකාශනවලින් සහ බුදුරදුන් පිළිබඳ කීර්ති ඝෝෂය පැන නැඟුණ ආකාරය පැවසෙන වචනවලින් ද උන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය ප්‍රකට කෙරෙන බව

**තාදි ගුණය**

- ලෝක ධර්මතා විෂයයෙහි කම්පා නොවී උපේක්‍ෂාවෙන් විඳදරා ගැනීමේ හැකියාව තාදී ගුණය බව.
- එය අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය ලෙස ද හැඳින්වෙන බව.
- අටලෝ දහමින් කම්පා නොවීම මංගල කරුණක් බව " ඵුට්ඨස්සලෝක ධම්මේහි චිත්තං යස්ස න කම්පති " යනුවෙන් එය පැහැදිලි කෙරෙන බව.
- කොසොල් මහරජතුමාගේ අසදෘශ මහා දානය මෙන් ම දුගී දුප්පත් දාසදාසීන් වෙතින් ලැබුණු රළු ආහාර දානය ද ඉවසීමෙන් තාදී ගුණය හෙළි වෙන බව.
- සේල නැමැති බමුණු පඬිවරුන්ගෙන් ද කොසොල් ආදී මහ රජවරුන්ගෙන් ද අනේපිඬු වැනි සිටුවරුන්ගෙන් ද උපාලි වැනි ගෘහපතීන්ගෙන් ද දිව්‍ය බ්‍රහ්ම ආදි විවිධ පිරිස්වලින් ද ප්‍රශංසා මෙන් ම යසස ලැබුණ ද නොසැලුණු බව.
- අග්ගික භාරද්වාජ, අක්කෝසක භාරද්වාජ වැනි බ්‍රාහ්මණයන්ගෙන්ද මාගන්දිය, චිංචාමානවිකා, සුන්දරී පරිබ්‍රාජිකා, සුප්‍රබුද්ධ, දේවදත්ත වැන්නවුන්ගෙන් ද ආක්‍රෝෂ පරිභව, නින්දා සහ අයස ලැබුණ ද නොසැලුණු බව.
- ජේතවනාරාමය, පූර්වාරාමය, රාජකාරාමය වැනි සුව පහසු ආරාමවල විසීමෙන් උද්දාමයට පත් නොවූවාක් මෙන් ම රුක් මුල් වන සෙනසුන් හා ගිරි ශිඛර ආදියෙහි ද සතුටින් විසූ බව.
- අපගේ ජීවිත හැඩගස්වා ගැනීමේ දී මෙන් ම අප සමාජගත ව කටයුතු කිරීමේ දී ද මෙම ධර්මතාවනට කොතෙකුත් මුහුණ දීමට සිදු වුවත් ඒවා උපේක්‍ෂාවෙන් විඳ දරා ගැනීම මඟින් සාමකාමී ජීවන රටාවක් ගොඩ නඟා ගත හැකි බව.
- අපගේ ජීවිතවල සාර්ථකත්වයට ඉහත කී උතුම් බුදු ගුණය ආදර්ශ කොටගත හැකි බව.

**පද්මාකාර ජීවිතය**

- පද්මාකාර ජීවිතය නම් දුසිරිතෙන් පිරි සමාජයක මඩ දියෙහි නො තැවැරී පවිත්‍ර ව විකසිත වූ නෙළුමක් මෙන් පිරිසිදු ජීවිතයක් ගත කිරීම බව.
- බුදු රජාණන් වහන්සේ පද්මාකාර ජීවිතයක් ගත කළ බව.
- මේ කරුණ ද්‍රෝණ බමුණාට තමන් වහන්සේ කවුරුදැයි හඳුන්වාදුන් ආකාරයෙන් පැහැදිලි වන බව.

*''පුණ්ඩරීකං යථා වග්ගු - තෝයේන නූපලිප්පති*
*නූපලිප්තෝම්හි ලෝකේන - තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ''*

- බුද්ධ චරිතය හා සම්බන්ධ පහත දැක්වෙන සිදුවීම් මගිනුත් මේ කරුණ සනාථ වන බව
- මාරදුහිතෘන්, මාගන්දියා ආදීන්ගේ පෙලඹවීම් හමුවේ විරාගික වූ බව හා ආලවක, අග්ගික භාරද්වාජ, අක්කෝසක භාරද්වාජ ආදි කෝප වන්නන් හමුවේ කෝප නො වූ බව.
- අටලෝ දහමින් කම්පා නොවී සිටීම, කෙලෙස්වලින් ආතුර වූවන් අතර අනාතුර ව සිටීම, වෛර කරන්නන් අතර අවෛරී ව සිටීම යන කරුණු මෙයට නිදසුන් බව.
- බුදු සිරිතේ මෙම පද්මාකාර ජීවිතය ආදර්ශයට ගෙන වැරදි බහුල සමාජයේ නිවැරදි ජීවිතයක් ගත කිරීමට අප සැම කෙනකුම යොමු වුවහොත් පිවිතුරු සමාජයක් නිර්මාණය වන බව.

**නිදහස් චින්තනය හා ආගමික සහනශීලීත්වය**

- බුදු රජාණන් වහන්සේ අන්‍යාගමිකයන් සුහදව ඇසුරු කළ ආකාරය පොට්ඨපාද, මහා සකුළුදායි වැනි සූත්‍රවලින් හෙළි වන බව.
- තමන් වහන්සේ දහම් දෙසන්නේ වෙනත් ආගමිකයන් ශ්‍රාවකත්වයට හරවා ගැනීමේ අරමුණින් නොවන්නේ යැයි උදුම්බරික සීහනාද, උපාලි වැනි සූත්‍රවල දී ප්‍රකාශ කර ඇති බව.
- බෞද්ධයකු විසින් වුව ද අන්‍යාගමිකයන්ට ගරු කිරීම හා දානාදියෙන් සංග්‍රහ කිරීම අගය කොට ඇති බව.
- කේසපුත්ත නියම්ගම වැසි කාලාම ගෝත්‍රිකයන්ට නිදහසේ සිතා විමසා තීරණ ගැනීමට අනුශාසනා කළ බව.
- තමන් වහන්සේ පිළිබඳ ව වුව ද විමසා බලා ම පිළිගැනීමට මග පෙන්වූ බව.
- තෙරුවන් ගුණ වුව ද විමසා බලා ප්‍රසාදය ඇති කර ගත යුතු යැයි ඇත් අඩි උපමාවෙන් පෙන්වා දුන් බව.
- තමන් වහන්සේ වෙත පැමිණෙන්නවුන්ට විමසීමට ඉඩකඩ ලබාදෙන උතුම් ශාස්තෘවරයකු ලෙස සභිය පිරිවැජියාගේ ඇගයීමට බුදු රජාණන් වහන්සේ ලක් වූ බව.

**බුදු රජාණන් වහන්සේ පිළිබඳ සමකාලීන හා නූතන ඇගයීම්**

- කොණ්ඩඤ්ඤ, සාරිපුත්ත, රට්ඨපාල ආදි මහ තෙරවරුන් විසින් බුදුරදුන් ඇගයීමට ලක් කරනු ලැබ ඇති බව.
- චංකී, සෝණදණ්ඩ, අස්සලායන ආදි බ්‍රාහ්මණ පඬිවරුන් ද, වච්ඡගොත්ත, පොට්ඨපාද, චූලසකුල්දායි, උපාලි ආදි වෙනත් ආගමිකයන් ද බුදු රජාණන් වහන්සේ ඇගයීමට ලක් කළ අවස්ථා සූත්‍ර ධර්මවල සඳහන් වන බව.
- කෝසල, බිම්බිසාර, අජාසත්ත වැනි මහ රජවරුන් ද සුදත්ත සිටු, අභයරාජ කුමරු වැනි පිරිස් ද විසින් බුදුරදුන් පැසසුමට ලක් කරන ලද බව.
- බුදුරදුන් මනුෂ්‍යයන්ගේ පමණක් නොව දෙවිවරුන්ගේ ද වර්ණනාවට ලක් වූ අයුරු මහා ගෝවින්ද සූත්‍රය ආදි සූත්‍රවලින් පැහැදිලි වන බව.
- පෙර අපර දෙදිග බොහෝ උගතුන්ගේ ද පැසසුමට උන් වහන්සේ ලක් වී ඇති බව.
- ජර්මන් මහාචාර්යවරයකු වූ මැක්ස් මුලර්, බර්ට්‍රන්ඩ් රසල්, ලක්ෂ්මී නරසු මහාචාර්ය තුමිය, එච්. ජී. වේල්ස්, මහාචාර්ය සෝන්ඩර්ස්, ශ්‍රීමත් එඩ්වින් ආර්නෝල්ඩ්, මහාචාර්ය රීස් ඩේවිඩ්ස්, ඇල්බර්ට් අයින්ස්ටයින් වැනි අය මෙන් ම ආචාර්ය සර්ව පල්ලි රාධ ක්‍රිෂ්ණන්, මන්මථනාත් ශාස්ත්‍රී, ශ්‍රී ජවහල්ලාල් නේරු, ආචාර්ය භීම්රාඕ රාම්ජි අම්බෙඩ්කාර් වැනි ඉන්දියානු පඬිවරුන් බුදුරදුන් පිළිබඳ ව කර ඇති ප්‍රකාශන මෙහි දී වැදගත් වන බව.
- ජර්මන් බෞද්ධ හිමිනමක වූ පූජ්‍ය ඥානාතිලෝක හිමි, වජිරාරාම වාසී නාරද හිමි වැනි උගත් යතිවරුන් විසින් බුදුරදුන් පිළිබඳ ව කරන ලද වර්ණනයන් විමසිල්ලට ගෙන උන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හඳුනා ගනිමින් බොහෝ දෙනාගේ ඇගයීමට ලක්වන උතුම් ගුණාංගයන්ගෙන් පිරිපුන් පුද්ගලයන් වීමට අප ද අධිෂ්ඨාන කරගත යුතු බව.
- ඔවුන් දැක්වූ අදහස් කිහිපයක් පහත දැක්වෙන බව.
- බුදු රජාණන් වහන්සේ වනාහි උන් වහන්සේ විසින් දේශනා කරන ලද සියලු ම ගුණධර්මයන්ගේ ප්‍රතිමූර්තිය යි. හතළිස්පස් වසරක කාලය තුළ දී තමන් විසින් ප්‍රකාශ කරන ලද වචන උන් වහන්සේ ක්‍රියාවට නැඟූහ. කිසිදු දුබලතාවක් හෝ පහත් හැඟීමක් හෝ උන් වහන්සේගෙන් කිසි විටෙකත් දෘශ්‍යමාන නොවී ය. ලෝකයට ඉතා ම පරිපූර්ණ ආචාර ධර්ම පද්ධතියක් ඉදිරිපත් කරන ලද්දේ ද බුදු රජාණන් වහන්සේ විසිනි."

- මහාචාර්ය මැක්ස් මුලර් -

- 'බුදු රජාණන් වහන්සේ ලෞකික ආසා නැමති ගිනිගත් නිවෙස තුළ දැවෙන දරුවන් බේරා ගැනීමට මාර්ග යොදන්නා වූත්, බේරා ගැනීමෙන් පසු නිර්වාණය නමැති ආරක්ෂක ස්ථානයට මඟ පෙන්වන්නා වූත් පියකු බඳු ය."

- මහාචාර්ය ලක්ෂ්මී නරසු -

- 'නූතන විද්‍යාත්මක චින්තනයට පිළිගත හැකි ආගමක් වේ නම් ඒ බුදු දහම යි.'

  \- ඇල්බට් අයින්ස්ටයින් -

- 'ලෝකයේ සුප්‍රසිද්ධ ආගම්වලින් මා බුදු දහමට, විශේෂයෙන් මුල් බුදු දහමට කැමැති වන්නේ එය කිසිවකු නොපෙළන බැවිනි '. - බර්ට්‍රන්ඩ් රසල් -

- 'බුදු රජාණන් වහන්සේ අපේ මානව වෘක්ෂයේ පිපුණු මල යි. ඒ මල පිපෙන්නේ අසීමිත ලක්ෂ සංඛ්‍යාත වසර ගණනාවකට පසු ව ය. එයින් වහනය වන ප්‍රඥා සුගන්ධයෙනුත්, ඇදහැලෙන දයාව නැමති මහා මකරන්දයෙනුත් ලෝකය පිරෙයි."

  -එඩ්වින් ආර්නෝල්ඩ් -

- "මිනිස් වර්ගයාගෙන් වැඩි ම සංඛ්‍යාවකින් පූජා ලද තැනැත්තා ලෙස ඉතා පහසුවෙන් ම වෙන් කොට දැක්විය හැක්කේ බුදු රජාණන් වහන්සේ ය."

  \- මහාචාර්ය සෝණ්ඩර්ස් -

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. නව අරහාදී බුදුගුණ අරුත් සහිත ව පහත දැක්වෙන වගුවෙහි දක්වන්න

| බුදුගුණය | අර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

2. මහා කරුණාව, මහා ප්‍රඥාව හා තාදි ගුණය හඳුන්වා දෙමින් බුදු සිරිතෙන් මෙම ගුණ ප්‍රකට වන අවස්ථාවලට උදාහරණ දක්වමින් ලේඛනගත කරන්න.

3 . බුද්ධ චරිතයෙන් ප්‍රකට කෙරෙන පහත සඳහන් විශිෂ්ට චරිත ලක්ෂණයන්ට අදාළ මාතෘකා උපකාරී කරගෙන ක්ෂණික කථික තරගයක් සංවිධානය කරන්න.

i. බුද්ධ චරිතයෙන් පිළිඹිබු වන ආදර්ශවත් චරිත ලක්ෂණ

ii. බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය

iii. බුදු රජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය.

iv. බුද්ධ චරිතයෙන් ප්‍රකට වන නිදහස් චින්තනය හා ආගමික සහනශීලිත්වය.

4 . බුදු රජාණන් වහන්සේ පිළිබඳ ව සමකාලීන ව හා නූතනයේ ඇගයීම් කළ බුද්ධිමතුන් පස්දෙනෙකු නම් කොට ඔවුන්ගේ ප්‍රකාශ වෙන වෙන ම ලියා දක්වන්න.

5 . බුද්ධ චරිතයෙන් තාදි ගුණය ප්‍රකට කළ අවස්ථා සනිදර්ශන ව දැක්වීමට සලස්වා එය පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

6. බුද්ධ චරිතයෙන් ප්‍රකට වූ නායකත්ව ලක්ෂණ පිළිබඳ ලේඛනයක් සකස් කරන්න.

**පරිශීලනයට**

- උදුම්බරික සීහනාද සූත්‍රය - දීඝ නිකාය
- මහා ගෝවින්ද සූත්‍රය - දීඝ නිකාය
- චූල සකුළුදායි සූත්‍රය - මජ්ඣිම නිකාය
- මහා සීහනාද සූත්‍රය - මජ්ඣිම නිකාය
- වීමංසක සූත්‍රය - මජ්ඣිම නිකාය
- චූල ගෝසිංග සූත්‍රය - මජ්ඣිම නිකාය
- උපාලි සූත්‍රය - මජ්ඣිම නිකාය
- කන්දරක සූත්‍රය - මජ්ඣිම නිකාය
- ධම්ම චේතිය සූත්‍රය - මජ්ඣිම නිකාය
- චූල මාලුංක්‍ය සූත්‍රය - මජ්ඣිම නිකාය
- අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය - මජ්ඣිම නිකාය
- චංකී සූත්‍රය - මජ්ඣිම නිකාය
- සුදත්ත සූත්‍රය - සංයුත්ත නිකාය
- ලාභ සක්කාර සූත්‍රය - සංයුත්ත නිකාය
- ද්‍රෝණ සූත්‍රය - අංගුත්තර නිකාය
- කාලාම සූත්‍රය - අංගුත්තර නිකාය

- චිංචාමානවිකා හා සුන්දරී පරිබ්‍රාජිකා කථා වස්තු - ධම්ම පදට්ඨ කථා
- බුදු හාමුදුරුවෝ - ගණේගම සරණංකර හිමි (1973) ඇම්.ඩී. ගුණසේන සමාගම
- සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය - බළන්ගොඩ ආනන්ද මෛත්‍රේය හිමි
- වියතුන් දුටු බුදු හාමුදුරුවෝ (සංස්කරණය) - එච්.එම්. මොරටුවගම (1995) එස්. ගොඩගේ සහෝදරයෝ
- බුදුන් දැකීම - සෙනෙවිරත්න මහලේකම (1992) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

**නිපුණතාව 2.0** : බුදු රජාණන් වහන්සේගේ හා පරමාදර්ශී ශ්‍රාවක- ශ්‍රාවිකාවන්ගේ විශිෂ්ට චරිත ලක්ෂණ අධ්‍යයනය කර ආදර්ශයට ගනියි.

**නිපුණතා මට්ටම 2.2** : බුද්ධ කාලීන පරමාදර්ශී ගිහි-පැවිදි ශ්‍රාවක- ශ්‍රාවිකා චරිත ඇගයීමට ලක් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 16 යි.

**ඉගෙනුම් පල** :

- පරමාදර්ශී චරිතයක විශිෂ්ට ලක්ෂණ පැහැදිලි කරයි.
- පරමාදර්ශී ජීවිතයක් ගත කිරීමට අධිෂ්ඨාන කර ගනියි.
- ධර්මානුකූල ජීවිතයක් ගත කරයි.
- පරමාදර්ශී චරිතවලින් පිළිබිඹු වන යහගුණ විවිධ නිර්මාණ මඟින් සමාජයට සම්ප්‍රේෂණය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු රජාණන් වහන්සේගේ සහ ගිහි පැවිදි ශ්‍රාවක- ශ්‍රාවිකා චරිතයන්හි පරමාදර්ශී විශිෂ්ට චරිත ලක්ෂණ ඇගයීමට ලක් කරමින් පරමාදර්ශී චරිතයක් බවට පත්වීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**ආනන්ද මහරහතන් වහන්සේ**

- ආනන්ද නම් වූ ශාක්‍ය කුමරා බුදු රජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කළ දින උපාලි කපුවා හා කුමාරවරුන් සමඟ පැවිදි වූ බව.
- පුණ්ණ මන්තානි පුත්ත තෙරුන් වහන්සේ ආනන්ද මහා තෙරුන් වහන්සේගේ ආචාර්යවරයාණන් වහන්සේ වූ අතර බෙල්ලට්ඨිසීය තෙරුන් වහන්සේ උපාධ්‍යයන් වහන්සේ වූ බව.
- උන් වහන්සේ සම්බුද්ධත්වයෙන් විසි වන වසරේ දී ආයාචනා හතරක් හා ප්‍රතික්ෂේප හතරක් ඉදිරිපත් කොට නිත්‍ය උපස්ථායක ධුරයට පත් වූ බව.

**ආයාචනා :**

1. මා විසින් කරනු ලබන ආරාධනා බුදු රජාණන් වහන්සේ විසින් පිළිගත යුතු වීම.
2. පිටින් පැමිණෙන කවරකු හෝ කැමති වේලාවක බුදු රජාණන් වහන්සේ මුණ ගැස්වීමට අවසර දිය යුතු වීම.
3. කවර හෝ සැකයක් මට ඇති වූ කල්හි එකෙණෙහි ම එය විචාරීමට අවසර ලැබිය යුතු වීම.
4. මා නොසිටි තැන දෙසූ ධර්මය නැවත වරක් මට දේශනා කළ යුතු වීම.

**ප්‍රතික්ෂේප:**

1. බුදු රජාණන් වහන්සේට ලැබෙන චීවර තමාට නොදිය යුතු බව.
2. බුදු රජාණන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය තමාට නොදිය යුතු බව.
3. බුදු රජාණන් වහන්සේ වසන එක ම ගඳකිළියේ තමාට විසීමට ඉඩ නො දිය යුතු බව.
4. බුදු රජාණන් වහන්සේට කෙරෙන ආරාධනාවලට තමා පිටත් කර නො හැරිය යුතු බව.

- ධර්ම භාණ්ඩාගාරික තනතුර, බහුශ්‍රැත භික්ෂූන් අතර අග තනතුර, ස්මෘතිසම්පන්න භික්ෂූන් අතර අග තනතුර, අවබෝධ ශක්තිය ඇති භික්ෂූන් අතර අග තනතුර හා වීර්ය සම්පන්න භික්ෂූන් අතර අග තනතුර ආනන්ද හිමියන්ට ලැබුණේ උන් වහන්සේ තුළ පැවැති විශිෂ්ට කුශලතා නිසා බව.
- ඉතා දුෂ්කර අවස්ථාවල දී පවා බුදුරදුන් හැර නොගොස් අවශ්‍ය උපස්ථාන මැනවින් ඉටු කළ බව.
- බුදු රජාණන් වහන්සේගේ ලෝකාර්ථ චර්යාවට නිබඳ ව ම සහය දුන් බව.
- භික්ෂුණී සංස්ථාව ඇති කිරීමට පුරෝගාමී ව කටයුතු කළ බව.
- සතර ඉරියව්වෙන් තොර ව වීර්ය වඩා පළමු සංගායනාවට පෙරදින රාත්‍රියේ රහත් ඵලයට පත් වූ බව.
- පළමු සංගායනාවේ දී ධර්මයට අදාළ සියලු ගැටලු විසඳූ බව.
- එම සංඝායනාව අවසානයේ දී මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යෑමට දීඝනිකාය ආනන්ද හිමියන් ඇතුළු පිරිසට භාර දුන් බව.

**සැරියුත් මහරහතන් වහන්සේ**

- සාරි බැමිණියගේ පුත්‍රයා වූ අතර ගිහි නමින් උපතිස්ස වූ බව.
- නාලන්දාව උපන් ගම් ප්‍රදේශය වූ බව.
- පරිබ්‍රාජකයකු ලෙස සංජය පිරිවැජියා ගුරු කොට වාසය කළ බව.
- තරුණ අවදියේ දී 'ගිරග්ග සමජ්ජ' නාට්‍ය සන්දර්ශනය නරඹා ඇති වූ කලකිරීමෙන් කල්‍යාණ මිත්‍ර කෝලිත සමග සත්‍ය සොයා ගිය බව.
- අස්සජි තෙරුන් වහන්සේ දේශනා කළ "යේ ධම්මා හේතුප්පභවා" යනාදි ධර්මය ශ්‍රවණය කිරීමෙන් සෝවාන් පලයට පත් වූ බව.

"යේ ධම්මා හේතුප්පභවා
තේසං හේතුං තථාගතෝ ආහ
තේසංච යෝ නිරෝධෝ
ඒවං වාදී මහා සමණෝ "

- පසු ව කෝලිත පිරිවැජියා සමඟ වේළුවනාරාමයට ගොස් පැවිදි වූ බව.
- සූකර කත ලෙනේ දී බුදු රජාණන් වහන්සේ 'දීඝනඛ' පරිබ්‍රාජකයාට දේශනා කළ 'වේදනා පරිග්ගහ සූත්‍රය' අසා රහත්පලයට පැමිණි බව.
- බුදු රජාණන් වහන්සේගේ දකුණත් සවු තනතුර ලැබූ බව.
- ගැඹුරු දහම් කරුණු සරල ලෙස විස්තර කිරීමේ හැකියාව ඇති බව.

  දීඝ නිකායේ සංගීති සූත්‍රය
  දීඝ නිකායේ දසුත්තර සූත්‍රය
  මජ්ඣිම නිකායේ සම්මාදිට්ඨි සූත්‍රය
  මජ්ඣිම නිකායේ ගුලිස්සානි සූත්‍රය
  මජ්ඣිම නිකායේ සච්ච විභංග සූත්‍රය
  ආදිය දේශනා කර ඇති බව.

- සම්පසාදනීය සූත්‍රය ආදිය දේශනා කිරීමෙන් බුදුරදුන්ගේ පැසසුමට ලක් වූ බව.
- ශ්‍රී සද්ධර්මය මැනවින් මතක තබා ගැනීම නිසා ධම්ම සේනාධිපති තනතුර ලැබූ බව.
- මහා ප්‍රාඥයන් අතර අග තනතුරට පත් වූ බව.
- පිරිනිවන් පාන්නට පෙර තම මෑණියන් සෝවාන් පලයෙහි පිහිටුවීමට කටයුතු කළ බව.
- ආරණ්‍යවාසි භික්ෂූන් අතුරෙන් අග්‍රස්ථානය ලැබූ ඛදිරවනිය රේවත මහ රහතන් වහන්සේ සැරියුත් තෙරුන් වහන්සේගේ ගිහි කල බාල සහෝදරයා වූ බව.
- චාලා, උපචාලා, සිසූපචාලා රහත් තෙරණින් වහන්සේලා සැරියුත් හිමියන්ගේ සහෝදරියන් වූ බව.
- ඉවසීමේ ගුණය ඇති, නිහතමානී මහා තෙරුන් වහන්සේ නමක ලෙස ප්‍රශංසා ලැබූ බව.

**මහා ප්‍රජාපතී ගෝතමී රහත් තෙරණින් වහන්සේ**

- අංජන ශාක්‍යයා හා යසෝධරා දේවිය මහා ප්‍රජාපතී ගෝතමියගේ මවුපියන් වූ බව.
- මහාමායා දේවිය කළුරිය කළ පසු ව සුද්ධෝදන මහරජු  ප්‍රජාපතී ගෝතමිය විවාහ කොට ගත් බව.
- සිදුහත් බෝසත් බිළිඳාගේ (සුළු මව) මවු තනතුරට පත් ව සිටි බව.
- නන්ද කුමරු හා රූපානන්දා කුමරිය ගෝතමී දේවියගේ දරුවන් වූ බව.
- බුදු රජාණන් වහන්සේ කිඹුල්වතට වැඩම කර පියරජතුමාට රජමැඳුරේ දී දේශනා කළ ධර්මය අසා සෝවාන් වූ බව.
- නන්ද කුමාරයා හා රාහුල කුමාරයා පැවිදි බව ලැබීමත්, සුද්ධෝදන රජතුමාගේ අභාවයත් නිසා හුදෙකලා වූ බව.
- ශාක්‍ය හා කෝලිය කුමාරවරුන් පැවිදි වීම නිසා ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු කුමාරිකාවන් 500ක් ද පැවිදි වීමට පෙලඹුණ බව.
- බුදු රජාණන් වහන්සේගෙන් තෙවරක් ම පැවිද්ද ඉල්ලා සිටිනමුත් එය ප්‍රතික්ෂේප වූ බව.
- ආනන්ද තෙරුන් වහන්සේගේ පූර්ණ අනුග්‍රහය ද ඇති ව අෂ්ට ගරුධර්ම පිළිගෙන විශාලා මහනුවර කූටාගාර ශාලාවේ දී සම්බුද්ධත්වයෙන් පස් වන වසරේ දී පැවිදි උපසම්පදාව ලත් බව.
- ධර්මඥානය හා අත්දැකීම් බහුලත්වය නිසා චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අග තනතුර හිමි කර ගත් බව.
- මවු ගුණය, පරිත්‍යාගශීලී බව, චාම් බව, අනතිමානී බව, අරමුණ ඉටු වන තුරු උත්සාහය අත්නොහැරීම, අධිෂ්ඨානය, කැප වීම, ඉවසීම එතුමියගේ ආදර්ශවත් චරිත ලක්ෂණ බව.
- බුදු රජාණන් වහන්සේගෙන් අවසර ගෙන විශාලා මහනුවර භික්ෂුණී ආරාමයේ දී ඍද්ධි ප්‍රාතිහාර්ය පා පිරිනිවන් පෑ බව.
- බුදු රජාණන් වහන්සේ බුද්ධ මාතාවට ගෞරව දැක්වීමක් ලෙස පසු ගමන් කළ බව.

**ඛේමා රහත් තෙරණින් වහන්සේ**

- මදුරට සාගල නුවර 'මද්දව' රජතුමාගේ දියණි කෙනකු වූ බව.
- බිම්බිසාර රජුගේ අගබිසව වූ බව.
- ඇය රූපයෙන් අග තැන් පත් නිසා ද, බුදු රජාණන් වහන්සේ රූපයේ දොස් දක්වන බව දන්නා නිසා ද උන් වහන්සේ මුණගැසීමට අකැමැති වූ බව.
- බිම්බිසාර රජතුමා ඛේමා බිසව බුදු රජාණන් වහන්සේ වෙත කැඳවාගෙන යාමට උපායශීලී වූ බව.
- වේළුවනාරාමය දැක බලා ගැනීමට ගිය ඛේමා බිසවට බුදුන් වහන්සේ දෘශ්‍යාධාර භාවිත කොට රූපයේ යථා තත්ත්වය අවබෝධ කරදුන් බව.
- 'මහා නිදාන සූත්‍රය' ඇසීමෙන් සෝවාන් පලයට පත් වූ බව.
- බිම්බිසාර මහජතුමාගේ අවසරය ද ලබා පසු කලෙක ශාසනයේ පැවිදි ව සිවුපිළිසිඹියා (අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන) සහිත ව රහත් භාවයට පත් වූ බව.
- කොසොල් රජතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට දක්ෂ ලෙසින් පිළිතුරු ලබා දුන් බව.
- ප්‍රඥාසම්පන්න භික්ෂුණීන් අතරින් ඛේමා රහත් තෙරණිය අග්‍ර වූ බව.

**අනාථපිණ්ඩික උපාසකතුමා**

- සුදත්ත සිටුතුමා නම් වූ මෙතුමා පසු ව අනාථපිණ්ඩික සිටුතුමා නමින් ප්‍රකට වූ බව.
- සැවැත් නුවර සුමන සිටුතුමා අනාථපිණ්ඩික සිටුතුමාගේ පියා වූ බව.
- රජගහ නුවර සිටුවරයාගේ නැඟණිය සමඟ විවාහ වීම නිසාත් ව්‍යාපාරික කටයුතු සඳහාත් නිතර රජගහ නුවරට ගිය බව හා එහි දී බුදු රජාණන් වහන්සේ හමු වූ බව.
- මෙතුමා බුදු රජාණන් වහන්සේ නිතර ඇසුරු කිරීම නිසා සැදැහැවත් බෞද්ධයකු වූ බව.
- බුදුන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේලාට ජේතවනාරාම විහාරය සකස් කොට පූජා කළ බව.
- දන් දීමේ ඇලුණු උවසුන් අතර අග තනතුර ලබා සිටි බව.
- අනතිමානීකම, නිර්ලෝභීත්වය, ශාසන ලැදියාව හා ඥාති හිතමිත්‍රාදීන් ආගම දහමට යොමු කිරීමට උත්සාහ ගැනීම ආදිය එතුමාගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ බව.

**චිත්ත ගහපති උපාසකතුමා**

- ධර්ම ඥානය කොතෙක් තිබුණ ද නිරතුරු ව බොහෝ භික්ෂූන් වහන්සේලාගෙන් ධර්ම ශ්‍රවණය කළ බව.
- ධර්ම ඥානය අඩු භික්ෂූන්ට ධර්මඥානය ලබාදීමට කටයුතු කළ බව.
- ඔහුගේ මිතුරකු වූ අන්‍ය ආගමික අචේල කස්සපට නිවැරදි මාර්ගය පෙන්වා දී ඔහු පැවිදි කරවා සිවුපසයෙන් සංග්‍රහ කළ බව.
- රූපාවචර ධ්‍යාන සතර ම ලබාගත් අනාගාමී උපාසකතුමකු බව.
- ධර්ම කථික උපාසකයන් අතර අග්‍ර වූ බව.
- චිත්ත ගහපති උපාසකතුමාට ගැරහීම නිසා සුධම්ම භික්ෂුවට බුදු රජාණන් වහන්සේ විසින් ප්‍රථම වතාවට පටිසාරණීය කර්මය පැනවූ බව.

විශාඛා මහෝපාසිකාව

- අඟු රට භද්දිය නුවර අමිතභෝගී මෙණ්ඩක සිටුවරයාගේ පුත් ධනඤ්ජය සිටුතුමාගේ හා සුමනා දේවියගේ දියණියන් වූ බව.
- බුදුන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කොට සත් හැවිරිදි වියේ දී ම සෝවාන් වූ බව.
- පංචකල්‍යාණයෙන්, ධනවත් කමෙන් හා ගුණ නුවණින් යුක්ත වූ ඇය සැවැත් නුවර මිගාර සිටුවරයාගේ පුත් පූර්ණවර්ධන කුමරා විසින් සරණ පාවා ගනු ලැබ සිටි බව.
- භික්ෂූන් වහන්සේලාට හා භික්ෂුණීන් වහන්සේලාට වැසි සළු, ආගන්තුක බත, ගමික බත, ගිලන් බත, උවටැන් බත, බෙහෙත්, කැඳ ආදියෙන් උවටැන් කිරීම නිසා උභය සංඝයාගේ මාතාව වූ බව.
- නිබඳ ව ම බුදුරදුන්ටත් , භික්ෂූන් වහන්සේලාටත්, සිවුපසයෙන් උපස්ථාන කළ ඇය කුඩා සාමණේර ස්වාමීන් වහන්සේලාට විශේෂ ළැදියාවක් දැක්වූ බව.
- පතිකුලයට යන විට පියාණන් විසින් දුන් අවවාද විශාඛාව විසින් පිළිපදින ලද බව.
- තම ස්වාමියාගේ පියාණන් වූ මිගාර සිටුතුමාට ධර්මාවබෝධය සඳහා මඟ පෙන්වූ බැවින් මිගාරමාතා නමින් ප්‍රකට වූ බව.
- දන් දීමේ ඇලුණු උපාසිකාවන් අතර අග තනතුර ලබාසිටි බව.
- තමා සන්තක ව තිබූ මහා මේල පලඳනාව නම් ආභරණය අලෙවි කොට පූර්වාරාමය තනා සඟ සතු කොට පිදූ බව.
- කුමාර කස්සප මාතාව පිළිබඳ ගැටලුව විසඳීමට බුදු රදුන් විසින් ඇය පත් කරනු ලැබූ කල්හි එය මැනවින් ඉටු කළ බව.

නකුල මාතාව

- නකුල පිතා නමින් ප්‍රසිද්ධ ව සිටි ගුණවත් උපාසකතුමාගේ භාර්යාව නකුල මාතා වූ බව.
- නව යොවුන් වියේ දී විවාහ වූ බව.
- සිතින් වත් සිය සැමියා ඉක්මවා නොයන්නියක වූ බව.
- බුද්ධ ශාසනයේ ශ්‍රාවිකාවන් අතර චිත්ත සමාධියේ ප්‍රතිඵල ලද ශ්‍රාවිකාවක වූ බව.
- ශ්‍රද්ධා, සීල, ත්‍යාග, ප්‍රඥා යන ගුණ ධර්මයන්ගෙන් නකුල පිතා හා සම වූ බව.
- සිය දරුවන් සමඟ එක් ව රෝගාතුර වූ සිය ස්වාමිපුරුෂයා සුවපත් කළ බව හා පෝෂණය කළ බව.
- බුදු රජාණන් වහන්සේ ඇතුළු මහා සංඝයා කෙරෙහි මහත් වූ සැදැහැයෙන් ක්‍රියා කළ බව.
- ඇදහිය හැකි කතා ඇති උපාසිකාවන් අතර අග්‍රස්ථානය ලැබූ බව.
- සොළොස් වසරක් තිස්සේ ගෘහස්ථ බ්‍රහ්මචර්යාව ආරක්ෂා කළ බව.
- සකෘදාගාමී උපාසිකාවක වූ බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. ඔබ අධ්‍යයනය කළ පරමාදර්ශී චරිත කීපයක් තෝරා විශිෂ්ට ලක්ෂණ වගුගත කරන්න.
2. පරමාරදර්ශී චරිතවලින් පිළිබිඹු වන යහගුණ ඇතුළත් කොට සඟරාවකට ලිපියක් සකස් කරන්න.
3. පරමාදර්ශී චරිතයක් ආදර්ශ කොට ගෙන ආගමික හා සමාජීය මෙහෙය අගය කරමින් කරන කතාවක පිටපතක් සකස් කරන්න.
4. නූතන ගෘහස්ථ සමාජයට විශාඛා සහ නකුල මාතා යන උපාසිකාවන්ගේ චරිතානුසාරයෙන් ගත හැකි පූර්වාදර්ශ පිළිබඳ ලේඛනයක් සැකසීමට යොමු කරන්න.
5. පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. එක් කණ්ඩායමකට ආනන්ද මහ රහතන් වහන්සේ පිළිබඳ වත් අනෙක් කණ්ඩායමට සැරියුත් මහ රහතන් වහන්සේ පිළිබඳ වත් තොරතුරු සෙවීමට අවස්ථාව සලසා උන් වහන්සේලාගේ චරිතයෙන් ලබාගත හැකි පරමාදර්ශයන් ගැන ලේඛනයක් සකස් කරවන්න.
6. එම ලේඛන පන්තිය ඉදිරියේ ඉදිරිපත් කිරීමට කටයුතු කර ඉන් තම ජීවිතය ඔපවත් කර ගන්නා ආකාරය විස්තර කරන්න.

**පරිශීලනයට :**

| | | |
|---|---|---|
| • නකුලපිතු සූත්‍රය | - | සංයුත්ත නිකාය |
| • අට්ඨක නිපාතය, උපොසථවග්ගො | - | අංගුත්තර නිකාය |
| • පඨම/දුතියසමජීවි සූත්‍ර | - | අංගුත්තර නිකාය |
| • නකුල සූත්‍රය | - | අංගුත්තර නිකාය |
| • ථෙර ගාථා පාලි | - | ඛුද්දක නිකාය |
| • ථෙරිපාලි අපදාන | - | චුල්ලවග්ග පාළි |
| • ආනන්ද හාමුදුරුවෝ | - | ගණේගම සරණංකර හිමි (1977)<br>ඇම්.ඩී.ගුණසේන සහ සමාගම |
| • විශාඛා කුමාරිකාවෝ | - | නරමානේ බුද්ධරක්ඛිත හිමි (1998)<br>අයිඩියල් මුද්‍රණාලය, කොළඹ |
| • අසූමහා ශ්‍රාවකයෝ | - | නිවන්දම ධර්මකීර්ති හිමි (1977)<br>බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය |
| • මහා ශ්‍රාවිකා චරිත | - | ගයාන් චානුක විදානපතිරණ |

**නිපුණතාව 3.0** : පුද්ගලයා, සමාජය හා දේශපාලන සංවිධාන පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වටහාගෙන ඒ අනුව පෞරුෂය ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 3.1** : පුද්ගලයාගේ ස්වාමිත්වය හා ශක්‍යතා පිළිබඳ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 16 යි.

**ඉගෙනුම් පල** :

- පුද්ගල ස්වාමිත්වය, ශක්‍යතාව හා වගකීම පිළිබඳ ව තුලනාත්මක ව අවබෝධ කර ගනියි.
- සදාචාරාත්මක ශික්ෂණයට පෙලඹෙයි.
- අභියෝග ජය ගනිමින් ක්‍රියා කරයි.
- ආත්ම විශ්වාසයෙන් කටයුතු කිරීමේ වැදගත්කම ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම පිළිබඳ සමකාලීන ආගමික ඉගැන්වීම් වල දක්නට නොතිබූ බව හා බුදු සමයෙහි මේ සියල්ල මනා ව අන්තර්ගත ව පැවති බව අධ්‍යයනය කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම පිළිබඳ සමකාලීන ඉගැන්වීම.**

- ස්වාමිත්වය යනු තමාට තමා හැර වෙනත් ස්වාමියකු හෝ තමා පාලනය කරන අදෘශ්‍යමාන බලයක් හෝ නොපවතින බව.
- ස්වාධීනත්වය යනු නිදහස් ව සිය කැමැත්ත පරිදි කටයුතු කළ හැකි බව.
- ස්වච්ඡන්දතාව යනු සිය කැමැත්තට අනුව හොඳ නරක තමා විසින් ම තීරණය කොට ක්‍රියා කළ හැකි බව.
- ස්වාධීනත්වය හා ස්වච්ඡන්දතාව යන පද දෙක බොහෝ විට සමීපාර්ථයෙන් භාවිත වන බව.
- වගකීම යනු සචේතන ක්‍රියාවේ වගකීම කර්තෘ වෙතට පැවරෙන බව, එනම් තමා විසින් සිතාමතා කරනු ලබන හොඳ හෝ නරක හෝ ක්‍රියාවේ වගකීම මෙන් ම එහි විපාකය ද තමාටම පැවරෙන බව.
- බුද්ධකාලීන භාරතයේ මහා බ්‍රහ්ම, මහා පුරුෂ, ඊශ්වර වැනි ඊශ්වර නිර්මාණවාදී සංකල්ප හා ජගදාත්ම, පරමාත්ම, විශ්ව ආත්ම වැනි පාරභෞතික සංකල්ප ප්‍රාමාණිකත්වයෙන් ගත් මහණ බමුණන් විසූ බව.
- පුබ්බේකතහේතුවාදය, අහේතුඅප්පච්චවාදය පිළිගත් ශාස්තෘවරුන් සිටි බව.
- ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් අනුව සර්ව බලධාරී ඊශ්වරයකු විසින් සත්ත්වයා හා ලෝකය ම පාලනය කරනු ලැබේ යැයි පිළිගන්නා බව.
- ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය හා නියතිවාදය ආදි ඉගැන්වීම් මඟින් පුද්ගල ස්වාධීනත්වයට, ස්වාමිත්වයට, ස්වච්ඡන්දතාවට හා වගකීමට හානි සිදු වන බව.

**පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම පිළිබඳ බෞද්ධ විග්‍රහය**

- බෞද්ධ හේතුඵල ධර්මයෙන් ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය හා නියතිවාදය බැහැර වන බව.
- මිනිසාගේ ස්වාධීනත්වය මිනිසාට පවරා ඇති බව හා බාහිර ගැලවුම්කරුවකු මත රඳවා නොමැති බව.
- තම සුගතිය මෙන් ම දුගතිය ද විමුක්තිය මෙන් ම බන්ධනය ද තමාගේ ම ක්‍රියාකාරිත්වය මත රඳා පවතින්නේ යැයි බුදු දහමේ උගන්වන බව.
- අත්තකාර, පරකාර, ආරම්භක ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, ථාම ධාතු, ඨිති ධාතු, උපක්කම ධාතු යන ඉගැන්වීම් මඟින් පුද්ගල ශක්තිය අර්ථවත් කෙරෙන බව.
- කවර හෝ අදෘශ්‍යමාන නියතියකට පුද්ගල පෞරුෂය යටත් නොකොට ස්වාමිත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම අර්ථවත් කොට ඇති බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

(1) බුද්ධකාලීන ව ප්‍රචලිත ව පැවති පුද්ගල ස්වාධීනත්වයට හානිකර වූ ඉගැන්වීම් 2ක් හඳුන්වා දෙන්න.

(2) එම ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරන්න.

(3) අත්තකාර, පරකාර, ආරම්භක ධාතු වීතික්කම ධාතු, පරක්කම ධාතු, ථාම ධාතු, ඨිති ධාතු, උපක්කම ධාතු යන ඉගැන්වීම්වල අර්ථය පැහැදිලි කරන වගුවක් සකස් කරන්න.

(4) පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. අනතුරු ව 'පුද්ගල ස්වාමිත්වය බුදුදහමින් අවධාරණය කර ඇති බව පළමු කණ්ඩායමට ද පුද්ගල ස්වාධීනත්වය බුදුදහමින් අවධාරණය කර ඇති බව ' දෙවන කණ්ඩායමට ද ලබා දෙන්න. මේ අදහස සනාථ කිරීමට ඒ ඒ කණ්ඩායම්වලට පවරා එම කරුණු පන්තියට ඉදිරිපත් කිරීමට සලසන්න.

(5) 'පුද්ගල ස්වාමීත්වය පුද්ගල පෞරුෂය කෙරෙහි බලපායි' යන තේමාව පාදක කරගෙන රචනාමය ප්‍රශ්නයක් සඳහා පිළිතුරු ලිවීමට යොමු කරන්න.

(6) 'තමන් හිසට තම අතමය සෙවණැල්ල'' යන මාතෘකාව ඔස්සේ බිත්ති පුවත්පතක පළ කිරීම සඳහා සුදුසු ලිපියක් සකස් කරන්න.

**පරිශීලනයට :**

- දේවදහ සූත්‍රය - මජ්ඣිම නිකාය
- චූල්ලකම්ම විභංග සූත්‍රය - මජ්ඣිම නිකාය
- අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය - මජ්ඣිම නිකාය
- අත්තකාර සූත්‍රය - අංගුත්තර නිකාය
- කාලාම සූත්‍රය - අංගුත්තර නිකාය
- ධම්මපදය 160, 161 ගාථා - ඛුද්දක නිකාය

- මුල් බුදුසමය හා විවරණ ගැටලු - පාතේගම ඥානාරාම හිමි (1996)
  සිංගප්පූරු භාවනා මධ්‍යස්ථානය

- උසස් පෙළ බුද්ධ ධර්මය - කොස්වත්තේ අරියවිමල හිමි (2010)
  සමයවර්ධන මුද්‍රණාලය

- බෞද්ධ සංස්කෘතිය පසුබිම හා මූලධර්ම - දේවාලේගම මේධානන්ද හිමි
  තැඹිලේ ධම්මරතන හිමි
  ඩබ්. ඒ. ගාමිණී වීරසිංහ (2011) කර්තෘ ප්‍රකාශන

**නිපුණතාව 3.0** : පුද්ගලයා, සමාජය හා දේශපාලන සංවිධාන පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වටහාගෙන ඒ අනුව පෞරුෂය ගොඩනඟා ගනියි.

**නිපුණතා මට්ටම 3.2** : සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ විග්‍රහය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 18 යි.

**ඉගෙනුම් පල** :

- සමාජ ප්‍රභවය හා විකාශය පාරභෞතික ප්‍රස්තුතවලින් බැහැර වූවක් බව ප්‍රත්‍යක්ෂ කරගනියි.
- සමාජ ප්‍රභවය හා විකාශය හේතුඵලවාදී ව සිදු වූවක් බව පෙන්වා දෙයි.
- සමාජ විවිධත්වය හා විචිත්‍රත්වය අවබෝධ කොටගෙන ක්‍රියා කරයි.
- සමාජ සංකීර්ණතා නිසා පැන නඟින අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ඊශ්වර නිර්මාණවාදය බැහැර කොට බුදු රජාණන් වහන්සේ විසින් හේතුඵලවාදී ව ලෝකය හා සමාජය ආරම්භ වූ ආකාරය පිළිබඳ දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ දක්වන ලද කරුණු පැහැදිලි කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්**

- බුද්ධකාලීන භාරතීය ආගමික ඉගැන්වීම් අනුව සමාජ ප්‍රභවය හා විකාශය ඊශ්වර නිර්මාණවාදය මත පදනම් ව පැවති බව.
- සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පටිච්චසමුප්පාද මූලධර්මය මත පදනම් ව විග්‍රහ කෙරෙන බව.
- එහි ලා පාරිසරික ආර්ථික, දේශපාලන, ආචාර විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක සාධක බලපා ඇති බව.
- බුදුසමය සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය, පරිණාමය හා විකාශය හේතුප්‍රත්‍යයාකාර ව විග්‍රහ කරන බව.
- පුද්ගලයා සිය ගැටලුවලට පිළියම් සෙවීම නිසා ආර්ථික, දේශපාලන, ආගමික හා ගෘහස්ථ සමාජ සංස්ථා නිර්මාණය වී ඇති බව.
- පටිච්චසමුප්පාදය මත පදනම් ව විග්‍රහ කෙරෙන සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මඟින් නිර්මාණවාදී සංකල්ප බැහැර වන බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පැහැදිලි කරමින් විචාරාත්මක ව පාසල් පුවත්පතට ලිපියක් සකස් කරන්න.
2. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සංකල්ප අනුසාරයෙන් ඉදිරිපත් කිරීමට (Presentation - ප්‍රස්තුතිකරණය) උපදෙස් දෙන්න.
3. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මාතෘකා කොට පන්ති කාල පරිච්ඡේදයක් තුළ මිනිත්තු 20ක ව්‍යුහගත රචනා ප්‍රශ්නයට පිළිතුරු ලිවීමට සලස්වන්න.
4. සමාජ ප්‍රභවය හා විකාශනය පිළිබඳ බ්‍රාහ්මණ මතය හා බෞද්ධ මතය වගුවක් මගින් ගෙනහැර දක්වන්න.
5. සමාජ සම්භවය පිළිබඳ විවිධ මතවාද පිළිබඳ ලේඛනයක් සකසන්න.
6. බෞද්ධ රාජ්‍යත්වයේ ප්‍රභවය ප්‍රජාතාන්ත්‍රීය හා ජනහිතකාමී ලක්ෂණවලින් යුතු බව පෙන්වා දෙන්න.

**පරිශීලනයට :**

- අග්ගඤ්ඤ සූත්‍රය - දීඝ නිකාය
- බෞද්ධ ශිෂ්ටාචාරය උසස් පෙළ 1 කොටස - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- බෞද්ධ දර්ශනය හා සංස්කෘතිය - චන්දිම විජයබණ්ඩාර
  එච්. එම්. මොරටුවගම (1977)
  ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
- බෞද්ධ සදාචාරයේ මූලධර්ම - ගුණපාල ධර්මසිරි (1988)
  සර්වෝදය, රත්මලාන.
- බෞද්ධ දර්ශනය හා සමාජ දර්ශනය - උඩගලදෙණියේ සෝමරංසි හිමි
- බෞද්ධ සංස්කෘතිය පසුබිම හා මූලධර්ම - දේවාලේගම මේධානන්ද හිමි
  තැරැලේ ධම්මරතන හිමි
  ඩබ්.ඒ. ගාමිණී විජේසිංහ (2011)
  කර්තෘ මුද්‍රණ

**නිපුණතාව 3.0** : පුද්ගලයා, සමාජය හා දේශපාලන සංවිධාන පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වටහාගෙන ඒ අනුව පෞරුෂය ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 3.3** : බෞද්ධ දේශපාලන මූලධර්ම විචාරශීලී ව අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20 යි.

**ඉගෙනුම් පල** :

- පරමාදර්ශී පාලන තන්ත්‍රයක් සඳහා වූ බෞද්ධ දේශපාලන මූලධර්ම විශ්ලේෂණය කරයි.
- බෞද්ධ දේශපාලන මූලධර්ම මත පදනම් ව යහපාලනයක් ගොඩ නැඟීමට උත්සුක වෙයි.
- ආදර්ශවත් ප්‍රජා නායකයකු ලෙස ක්‍රියා කරයි.
- සමාජ සුභසාධනය හා සාධාරණත්වය උදෙසා කැප වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බෞද්ධ දේශපාලන මූලධර්ම පිළිබඳ න්‍යායාත්මක අවබෝධයක් ලබාදෙමින් සමාජ සුභසාධනය මත පදනම් වූ යහපත් පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීම හා ඉන් ලබාගත හැකි ආදර්ශ පිළිබඳ ප්‍රමාණාත්මක අවබෝධයක් ලබාදීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**පංචසීල ප්‍රතිපදාව**

- පාලකයා පස්පවින් වැළකී සිටිමින්, ප්‍රජාව ද ඉන් වළක්වාලීමට ක්‍රියා කළ යුතු බව
- පංචසීලය හෙවත් බුදුදහමෙහි දැක්වෙන ගේහසික සීලය ආරක්ෂා කිරීම රජුගේ වගකීමක් වන බව.
- පන්සිල් රැකීම නිසා රජු අනුන්ගේ ජීවිතවලට ගරු කරන, අනුන්ට අභය දානය දෙන, අනුන්ගේ දේපළ අයිතියට ගරු කරන, අනුන්ගේ පවුල් ජීවිත සුරකින, එහි ස්වාධීනත්වයට ගරු කරන, පුද්ගලාන්තර විශ්වාසය සුරකින, අනුන් රැවටීමෙන් තොර, මද්‍යසාර භාවිතයෙන් වළකින, සාමය, සෞඛ්‍යය, රැක ගැනීමට කැප වන පුද්ගලයකු සේ ක්‍රියා කරන බව.
- මෙම පංචසීල ප්‍රතිපදාව සක්විති රජකු විසින් අනුගමනය කළ යුතු යැයි බුදුදහමේ දැක්වෙන බව.
- සක්විති රජු විදේශයන්හි පාලකයන් ද පස්පවින් වළක්වා, පන්සිල් රකින පුද්ගලයන් බවට පත් කර ගන්නා බව.

**දශ රාජ ධර්ම**

- බෞද්ධ ජාතක කථා සාහිත්‍යයෙහි දැහැමින් රට පාලනය කරන රජකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් 10ක් සඳහන් වන අතර හා ඒවා දශරාජ ධර්ම නමින් ප්‍රකට වන බව.
- දානය - ප්‍රජා සුභසාධනය, රජු විසින් ප්‍රජා අවශ්‍යතා සපුරාලීම.
- සීලය - ප්‍රතිපත්ති ගරුක බව, රජු සදාචාර සම්පන්න ව ක්‍රියා කළ යුතු බව.

- පරිත්‍යාගය - මහජනයා වෙනුවෙන් කාලය, ශ්‍රමය හා භෞතික සම්පත් කැප කළ යුතු බව.
- ඍජු බව - රජු අගතිගාමී නොවී අවංක ව ක්‍රියා කළ යුතු බව.
- මෘදු බව - පාලකයා, මහජනයාගේ දුක් පීඩාවන් කෙරෙහි සංවේදී ව ක්‍රියා කළ යුතු බව.
- තපස - ඉන්ද්‍රිය දමනය, පවිටු සිතිවිලිවලට වහල් නො විය යුතු බව.
- ක්‍රෝධ නො කිරීම - ප්‍රජාව කෙරෙහි ක්‍රෝධයෙන් තොර ව මෛත්‍රියෙන් කටයුතුකළ යුතු බව.
- අවිහිංසාව - මහජනයාට හිංසා පීඩා නො කළ යුතු බව.
- ඉවසීම - විරුද්ධ අදහස් මතවාද හා ක්‍රියාකාරකම් කෙරෙහි ඉවසීමෙන් කටයුතු කළ යුතු බව.
- විරුද්ධ නො වීම - මහජනයා සමඟත් විදේශ රජුන් සමඟත් නො ගැටී සහයෝගයෙන් ක්‍රියා කළ යුතු බව

**දස සක්විති වත්**

- සක්විති රජතුමා පළමු ව තමා ධාර්මික වී දස වැදැරුම් ප්‍රතිපත්තියක පිහිටා සියලු දෙනා ම ආරක්ෂා කළ යුතු බව. ඒ අනුව

1. තම පවුලට අයත් පිරිසට දැහැමි රැකවරණය සැලසීම.
2. බළසෙනඟට දැහැමි රැකවරණය සැලසීම.
3. මැතිඇමතින්ට දැහැමි රැකවරණය සැලසීම.
4. බ්‍රාහ්මණ ගෘහපතියන්ට දැහැමි රැකවරණය සැලසීම.
5. ගම් නිගමගම් ජනපද වාසීන්ට දැහැමි රැකවරණය සැලසීම.
6. මහණ බමුණන් සහිත පූජක උතුමන්ට දැහැමි රැකවරණය සැලසීම.
7. මෘග පක්ෂීන් සහිත සත්ත්ව ප්‍රජාවට දැහැමි රැකවරණය සැලසීම.
8. නිර්ධනයන්ට තමා අභිමත කර්මාන්ත ආදිය සඳහා ධනය ලබාදීම.
9. අපරාධ මර්දනය කරමින් අපරාධ මැඬපැවැත්වීම.
10. මදයෙන් හා ප්‍රමාදයෙන් තොර බහුශ්‍රැත මහණ බමුණන් වෙත එළඹ අවවාද අනුශාසනා ලබා රට පාලනය කිරීම.

ඉහත කරුණු දහය සිවුපාවුන්, පක්ෂීන් සහිත සියලු ජනතාවට දැහැමි රැකවරණය සැලසීමත්. අපරාධ මර්දනය කිරීමත්, ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීමත්, පූජනීය විශාරදයන්ගෙන් උපදෙස් ලබා ගැනීමත් වශයෙන් සිවුවැදැරුම් වේ. එය ජාතික ප්‍රතිපදාවක් වශයෙන් සංක්ෂේපයෙන් දැක්විය හැකි බව.

සප්ත අපරිහානීය ධර්ම

1. නිතර රැස්වීම.
   (අභිණ්හසන්නිපාතා සන්නිපාතබහුලා)
2. සමඟිව එක්රැස් ව, සමගි ව කටයුතු කොට සමගි ව විසිර යාම.
   (සමග්ගා සන්නිපාතන්ති, සමග්ගා වුට්ඨහන්ති, සමග්ගා වජ්ජිකරණියානි කරොන්ති)
3. පෙර නො පැනවූ නීති නො පැනවීම පැනවූ නීති කඩ නො කිරීම හා පැරණි වජ්ජි ධර්ම අනුගමනය කිරීම. (අපඤ්ඤත්තං න පඤ්ඤපෙන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දන්ති.........)
4. වැඩිහිටියන්ට ගරුබුහුමන් කිරීම හා ඔවුන්ගේ වචනවලට සවන් දිය යුතු බව පිළිගැනීම.
   (යෙ තෙ වජ්ජිනං වජ්ජි මහල්ලකාතෙ සක්කරොන්ති ගරු කරොන්ති මානෙන්ති පූජෙන්ති)
5. විවාහක හා අවිවාහක කාන්තාවන්ට කරදර නො කිරීම හා බලහත්කාරයෙන් වාසය නො කිරීම. (යා තා කුලිත්ථියෝ, කුල කුමාරියෝ තා න ඔක්කස්ස පසයිහ වාසෙන්ති)
6. වජ්ජි රාජ්‍යය ඇතුළත හා පිටත පිහිටි පූජනීය ස්ථානවලට ගරු සත්කාර කිරීම හා ඒවා නඩත්තු කිරීම. (යානි තානි වජ්ජිනං, වජ්ජ චේතියානි අබ්භන්තරානි චේව බාහිරානි ච තානි සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති)
7. රහතුන්ට පහසුකම් සැලසීම, රටට පැමිණි රහතුන් හට එහි සුව සේ විසීමට සැලැස්වීම හා නොපැමිණි රහතුන් එහි පැමිණවීම. (අරහන්තේසු ධම්මිකා රක්ඛාවරණ ගුත්තිං සුසංවිහිතා)

- මෙම පිළිවෙත් අනුව ක්‍රියා කරන කල්හි රාජ්‍යයක අභිවෘද්ධිය සැලසෙන බව හා පිරිහීමක් නොවන බව.
- මෙමඟින් එක්රැස් ව සමඟියෙන් පාලන කටයුතු කිරීම ද නීතිය නිසිලෙස ක්‍රියාවට නැංවීම ද සමාජ සම්ප්‍රදාය ගරුකත්වය ද කාන්තා රැකවරණය ද ආගමික සංස්කෘතික මෙහෙවර ද ඉටු කිරීමට රාජ්‍ය පාලකයන් පොලඹවා ඇති බව.

**සතර සංග්‍රහ වස්තු**

- දානය, ප්‍රියවචනය ඔස්සේ අර්ථචරියාව හා සමානාත්මතාව යනු සතර සංග්‍රහ වස්තුන් බව.
- එම ක්‍රියාමාර්ග ඔස්සේ ප්‍රජාවට සංග්‍රහ කිරීම පාලකයාගෙන් අපේක්ෂා කෙරෙන බව.
- දානය නම් ප්‍රජා සුභසාධනය යි. එය පළමු වන සංග්‍රහ වස්තු බව.
- ප්‍රිය වචනය නම්, සුහද හා ප්‍රියමනාප සන්නිවේදනය බව.
- අර්ථචර්යා නම් අනුන්ගේ දියුණුව සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග බව.
- සමානාත්මතා නම් ජාති කුල ගෝත්‍ර ආදිය නොසලකා සැමට සමාන ව සැලකීම බව.
- රිය සකට කඩ ඇණය මෙන් සමාජයේ යහපැවැත්මට මෙම සතර සංග්‍රහ වස්තු උපයෝගී වන බව.

**සතර අගති විරතිය**

- ඡන්දය, ද්වේශය, භය, මෝහය යනුවෙන් සතර අගතිය හැඳින්වෙන බව.
- ඡන්ද අගතිය යනු සිය කැමැත්ත මුල් කොට ගෙන අගතිගාමී ව හිමියන් අහිමියන් කිරීම බව.

- ද්වේශ අගතිය යනු තරහවෙන් අගතියට ගොස් වැරදි ක්‍රියාවන් කිරීම වන බව.
- භය අගතිය යනු, අනෙකෙකුගේ බලයට ඇති භය නිසා අගතිගාමී ව ක්‍රියා කිරීම බව.
- මෝහ අගතිය යනු, අනවබෝධය නිසා වැරදි ක්‍රියාවල නිරත වීම බව.
- මෙම කරුණු සතරෙන් අගතියට යාමෙන් අවපක්ෂයේ සඳ මෙන් පිරිහීම් ද අගතියට නොයාමෙන් පුර පක්ෂයේ සඳ මෙන් දියුණුව ද සිදුවන බව.

**ලෝක පාලන ධර්ම**

- හිරි ඔතප් දෙක ලෝකපාලන ධර්ම වන බව.
- ඒවා දේව ධර්ම ලෙස හැඳින්වෙන බව.
- එසේ ම සප්තාර්ය ධනයට ඇතුළත් වන බව.
- බෞද්ධ පාලකයකු අවශ්‍යයෙන් ම ලෝක පාලන ධර්මයන්ට අනුගත ව ක්‍රියා කළ යුතු බව.

**කූටදන්ත සූත්‍රාගත දේශපාලන මූලධර්ම**

- කූටදන්ත සූත්‍රය අනුව සාර්ථක රාජ්‍ය පාලකයකු වීමට අවශ්‍ය සුදුසුකම් මාලාවක් දැක්විය හැකි බව.

1. මවුපිය දෙපසින් අභිජාත පිළිගත් තැනැත්තකු වීම.
2. ධන ධාන්‍ය ඇති ඉසුරුමත් පුද්ගලයකු වීම.
3. මහා දැන උගත්කමකින් යුක්ත වීම.
4. ප්‍රසාදය එළවන සුලු තැනැත්තකු වීම.
5. සිල්වත් වීම.
6. යහපත් තෙපුල් ඇත්තකු වීම.
7. බලවත් වූ අණ පිළිපදින සිවුරඟ සෙනඟක් ඇත්තකු වීම.
8. ශ්‍රද්ධාවන්ත දානපතියකු වීම.
9. නුවණැත්තකු හා උගතකු වීම.
10. පාලකයා විසින් සිය රාජ්‍යයේ අපරාධ වළක්වා ආර්ථික සංවර්ධනය ඇති කිරීමට ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වීම.

**පාලන තන්ත්‍රය විෂයයෙහි ප්‍රජා වගකීම්**

- පාලකයා විසින් ජනතා ශුභ සිද්ධිය පිණිස ඉටු කළ යුතු වගකීම් හා කාර්යභාරය සුවිශාල ය. රටක් යහපත් ආකාරයෙන් දියුණුව කරා ගමන් කිරීම හුදෙක් පාලක පක්ෂය විසින් පමණක් සිදු කළ හැකි කරුණක් නොවේ. ඒ සඳහා ජනතාවගෙන් ද ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු විය යුතු බව.
- රජතුමා පත් කිරීම පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රාගත පළමු සම්මුතියෙන් ම ජනතාව පොරොන්දු වී ඇත්තේ 'අම්හාකං සාලීනං භාගං අනුප්පදස්සාම' යනුවෙනි. එයින් කියවෙන්නේ ජනතාව නිසි පරිදි බදු ගෙවිය යුතු බව යි. රටක් සමාජ සුභසාධනය ඇතුළු පාලන තන්ත්‍රයේ යාන්ත්‍රණය ක්‍රියාත්මක වන්නේ ජනතාවගෙන් එකතු කර ගන්නා බදු මුදල්වලිනි. එහෙයින් නිසි පරිදි බදු ගෙවීම ජනතාවගේ යුතුකමක් බව.

- ජනතාවගේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සැලසීම, පාලක පක්ෂයේ වගකීමක් වුවද සියල්ල රජයකින් කරදෙන තෙක් බලා නොසිට තමාගේ ආර්ථික ස්වයංපෝෂණය පිණිස උත්සාහයෙන් අධිෂ්ඨානශීලී ව කටයුතු කිරීම ජනතාවගේ වගකීමක් බව.
- පොදු දේපළ රජයේ යැයි සලකා නොසැලකිලිමත් ලෙස පරිහරණය කිරීමත්, ඒවා විනාශ වීමට ඉඩදීමත් නොකළ යුතු ය. රාජ්‍ය දේපළ මහජන දේපළ බැවින් තමාගේ වස්තුව සේ සලකා රැකගත යුතු බව.
- රජයේ කාර්යාලයීය භෞතික සම්පත් (යාන වාහන, මුදල්, යන්ත්‍ර සූත්‍ර, ලිපිද්‍රව්‍ය ආදිය) අවභාවිත නොකළ යුතු බව.
- රාජ්‍ය සේවයේ වේවා, පෞද්ගලික සේවයේ වේවා කාලය අපතේ නොයවා වැඩ අතපසු නොකොට කාලය නිකරුණේ ගෙවා නොදමා වගකීමෙන් රට වෙනුවෙන් සිය රාජකාරිය ඉටු කළ යුතු බව.
- පෞද්ගලික සම්පත් වුව ද අධිපරිභෝජනයෙන් වැළකී, සම්පත් ආරක්ෂා කිරීමට ක්‍රියා කළ යුතු බව.
- ජනතාවගේ ශුභ සිද්ධිය උදෙසා පනවා ඇති නීතිරීති නොකඩ කොට ආරක්ෂා කළ යුතු බව.
- ආපදාපන්න අවස්ථාවල දී අපහසුතා විඳ දරා ගෙන ඉවසීමෙන් කටයුතු කළ යුතු බව.
- ආත්මාර්ථයෙන් තොර ව සමාජ ශුභ සිද්ධිය ගැන ද සලකා කටයුතු කළ යුතු බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. 'යහපත් පාලනයක් උදෙසා බෞද්ධ දේශපාලන මූලධර්ම යොදාගත හැකි ය' යන මාතෘකාව යටතේ කතාවක් පැවැත්වීමට සිසුවා යොමු කරන්න.
2. යහපත් පාලනයකට බෞද්ධ දේශපාලන මූලධර්ම උපයෝගි වන ආකාරය පෙන්වා දෙමින් බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීමට යොමු කරන්න.
3. යහපත් පරිපාලන තන්ත්‍රයක් ගොඩනැඟීමෙහි ලා ජන සම්මතය ප්‍රබල සාධකයක් වන ආකාරය පෙන්වාදීමට සූත්‍ර අනුසාරයෙන් කරුණු ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
4. 'නිතර රැස්වීම' නම් අපරිහානීය ධර්මය නූතන රාජ්‍ය පාලනයෙහි ලා වැදගත් වන මූලධර්මයක් බව පෙන්වාදීමට, කතාවක පිටපතක් සකස් කරන්න.
5. දසරාජ ධර්මය, සතර සංග්‍රහ වස්තුව, දසසක්විති වත් ආදි බෞද්ධ දේශපාලන මූලධර්ම උපයෝගී කරගෙන, සිසුන් කණ්ඩායම් තුනකට යොදා ප්‍රහේලිකාවක් සකස් කරන්න.
6. 'සතර සංග්‍රහ වස්තුව මඟින් ප්‍රජාවට සංග්‍රහ කරන පාලකයා අපරාජිත පාලකයෙකි.' මෙය විමසන්න.

**පරිශීලනයට :**

- අග්ගඤ්ඤ සූත්‍රය - දීඝ නිකාය
- චක්කවත්ති සීහනාද සූත්‍රය - දීඝ නිකාය
- කූටදන්ත සූත්‍රය - දීඝ නිකාය
- මහාපරිනිබ්බාන සූත්‍රය - දීඝ නිකාය
- රජ්ජ සූත්‍රය - සංයුක්ත නිකාය
- සාරන්දද සූත්‍රය - අංගුත්තර නිකාය
- සංගහවත්ථු සූත්‍රය - අංගුත්තර නිකාය
- අගතිනාගත සූත්‍රය - අංගුත්තර නිකාය
- චක්කානුවත්තන සූත්‍රය - අංගුත්තර නිකාය
- අධම්මික සූත්‍රය - අංගුත්තර නිකාය

- බෞද්ධ ශිෂ්ටාචාරය මූලධර්ම හා වංශ කථාව - චන්දිම විජේබණ්ඩාර, එච්.එම්. මොරටුවගම

- බුදුසමයේ දේශපාලන චින්තනය - එස්. දයා ප්‍රනාන්දු (1984) ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ
- බුදුසමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය - ධර්මසේන හෙට්ටිආරච්චි (1991) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

- රාජ්‍ය පාලනයට බෞද්ධ උපදෙස් - ගුණසේන මහතන්ත්‍රි

- මිනිස් ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය - තිස්ස ඥාණතිලක (1984) ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

- බෞද්ධ සංස්කෘතිය (සමාජ චින්තනය පුද සිරිත් හා උත්සව) - දේවාලෙගම මේධානන්ද හිමි, තැඹලේ ධම්මරතන හිමි, ඩබ්. ඒ. ගාමිණී විජයසිංහ (2011) කර්තෘ ප්‍රකාශන

**නිපුණතාව 4.0** : පුද්ගලයාගේ හා සමාජයේ යහපැවැත්මට උපයෝග වන බෞද්ධ ආචාර ධර්ම අධ්‍යයනය කර උභයාර්ථ සාධනයට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 4.1** : පින්පව් කුසල් අකුසල් හැඳින ගනිමින් හොඳ නරක විනිශ්චය කිරීමෙහි ලා භාවිත බෞද්ධ නිර්ණායක පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 18 යි.

**ඉගෙනුම් පල** :

- හොඳ නරක නිශ්චය කිරීමෙහි ලා භාවිත නිර්ණායක නිරවුල් ව හඳුනා ගනියි.
- සදාචාරාත්මක ව ජීවත් වීමට අධිෂ්ඨාන කර ගනියි.
- පව් බැහැර කොට කුසල් දහම් වඩයි.
- කුසල් දහම් සඳහා සමාජය පොලඹවයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

කළ යුතු හා නො කළ යුතු හොඳ නරක ක්‍රියා තීරණය කළ යුතු මිනුම් දඬු හඳුන්වාදෙමින් ස්වාර්ථය හා පරාර්ථය පිණිස හේතු වන සාධුචර්යාවලට ශිෂ්‍යයා නැඹුරු කිරීමත් තමාට හා මෙරමාට හානිකර අසාධුචර්යාවලින් ශිෂ්‍යයා ඈත් කිරීමට යොමු කිරීමත් මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**හොඳ නරක නිශ්චය කිරීමෙහි ලා භාවිත බෞද්ධ නිර්ණායක.**

- බුදුසමයේ පුද්ගල චර්යාවන් ඇගයුම් කරණයට ලක් කරන බෞද්ධ ව්‍යවහාර, හොඳ-නරක පුඤ්ඤ-පාප, කුසල-අකුසල, සාධු-අසාධු, සම්මා-මිච්ඡා, කරණීය- අකරණීය, විඤ්ඤූපසත්ථ, විඤ්ඤූපගරහිත, යෙදුම් ආදියෙන් පිළිබිඹු වන බව.
- චරිත ඇගයුම් කරණයට භාවිත බෞද්ධ ව්‍යවහාර බාල-පණ්ඩිත, සප්පුරිස-අසප්පුරිස, පුඤ්ඤවා-පාපිවා ආදි වශයෙන් දැක්විය හැකි බව.
- මෙම ඇගයුම් කරණය සිදු කොට ඇත්තේ යම් යම් නිර්ණායක පදනම් කරගෙන බව.
- එම නිර්ණායක ප්‍රධාන වශයෙන් චේතනාව හා විපාකය පදනම් කොට ඇති බව.
- ලෝභ, ද්වේෂ, මෝහ, යන චේතනා මුල් කොට ගත් ක්‍රියා අකුශල කර්ම බව.
- අලෝභ, අදෝෂ, අමෝහ, යන චේතනා මුල් කොට ගත් ක්‍රියා කුශල ක්‍රියා වන බව.
- ධම්ම පදය යමක වග්ගයේ 'මනෝ පුබ්බංගමා ධම්මා.....' යන පළමු හා දෙවන ගාථාවලින් ක්‍රියා තීරණය කිරීමෙහි ලා චේතනාව සහ විපාකය පාදක කොට ගැනීමට උගන්වා ඇති බව.
- 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමී....' ආදි දේශනාවෙන් ද කර්ම නිශ්චයෙහි ලා චේතනාව ම පාදක කොට ගත හැකි අයුරු පැහැදිලි වන බව.
- කාලාම සූත්‍රයේ දී ද චේතනාව හා විපාකය අනුව කුශල අකුශල කර්ම නිශ්චය කිරීමට මඟ පෙන්වා ඇති බව.
- යම් ක්‍රියාවක් කොට පසුතැවිල්ලට පත්වෙමින් කඳුළු පිරි දෙනෙතින් විපාක විඳීමට සිදු වේ නම් එවැනි දෑ නරක ක්‍රියා වන බව.
- යම් ක්‍රියාවක් කොට පසුතැවීමට සිදු නොවේ නම් සිනාමුසු මුහුණින් විපාක විඳීමට හැකි වේ නම් එවැනි දෑ හොඳ ක්‍රියා වන බව.

- ඉධ තප්පති පෙච්ච තප්පති, ඉධ නන්දති පෙච්ච නන්දති ආදි ධම්ම පද දේශනාවල ද මෙලොව හා පරලොව වශයෙන් විපාකය මුල් කොට පින්-පව් තීරණය කිරීමට උගන්වා ඇති බව.
- අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී ද තමාට හා අනුන්ට මෙන් ම දෙපක්ෂයට ම අයහපතක් වන ක්‍රියා නරක ක්‍රියා ලෙසත් යහපතක් වන ක්‍රියා හොඳ ක්‍රියා ලෙසත් පෙන්වා දී ඇති බව.
- තමා පිළිබඳ ව ද ලෝකයා පිළිබඳ ව ද ධර්මය පිළිබඳ ව ද අධිපති කොට සිතා හොඳ නරක නිශ්චය කළ හැකි බව.
- කැඩපතකින් තමා ම තම සිරුර නිරීක්ෂණය කරන්නා සේ තම කායික, වාචසික හා මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළ යුතු බව.
- අත්තානං උපමංකත්වා ආදි වශයෙන් දැක්වෙන අත්තූපනායික ධර්මය අනුව ද හොඳ නරක නිශ්චය කළ හැකි බව.
- රාග, ද්වේශ, මෝහ සහගත ක්‍රියා නොකළ යුතු අසාධු පාප ක්‍රියා ලෙස දක්වන කාලාම සූත්‍රය තමා විසින් ම ස්වාධීන ව සිතා බලා තීරණය කළ යුතු යයි දක්වන බව.

**දස පින් කිරියවත්**

- දාන සීලංච භාවනා - පත්තිපත්තානුමෝදනා
  වෙය්‍යාවච්චාපචායංච දේසනා සුති දිට්ඨිජු
  යනුවෙන් දස පින් කිරියවතක් බුදුසමයෙහි ඉගැන්වෙන බව.

- දස පින් කිරියවත්වල නිරත වීමෙන් ගුණගරුක සමාජයක් ගොඩනැගෙන බව.

**දස කුසල් හා දස අකුසල්**

- ලෝභ, දෝෂ, මෝහ, චේතනා පූර්වාංගම ක්‍රියා අකුසල් යනුවෙන් හැඳින්වෙන බව.
- එවැනි අකුසල් දහයක් බෞද්ධ සාහිත්‍යයෙහි සුවිශේෂ කොට දක්වා ඇති බව හා ඒවා දස අකුසල් නාමයෙන් හැඳින්වෙන බව එය,
  පාණඝාත පරද්ධබ්බං - පරදාරංච කායතෝ
  මුසාපේසුඤ්ඤ ඵරුසා- සම්ඵප්පලාපා වාචතෝ
  අභිජ්ඣාචේව ව්‍යාපාදෝ - මිච්ඡා දිට්ඨිච මානසෝ
  යනුවෙන් දැක්වෙන බව.
- ඒ අනුව ප්‍රාණඝාතය, අදත්තාදානය, පරදාර සේවනය, මුසාවාදය, පෙසුඤ්ඤ හෙවත් කේළාම් කීම, පරුෂ වචනය, හිස් වචනය, අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය, දසඅකුසල් නම් වන බව.
- මෙම දස අකුසල්, කායික ව, වාචසික ව මෙන් ම මානසික ව ද සිදු වන බව.
- දස අකුසලයෙන් වෙන් ව කටයුතු කිරීම දස කුසලය ලෙස හැඳින්වෙන බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1 හොඳ නරක විනිශ්චය පිළිබඳ බෞද්ධ නිර්ණායක යන තේමාව යටතේ බුදුසරණ පුවත්පතට ලිපියක් සකස් කරන්න.

2 බුදු සමයට අනුව පව් බැහැර කොට කුසල් දහම් වඩන්නේ කෙසේ ද? යන්න මාතෘකා කර ගනිමින් බෞද්ධ සංගම් මහා සභා රැස්වීමේ දී කිරීමට සුදුසු කථාවක් සකස් කරන්න.

3. දස කුසල් හා දස අකුසල් පිළිබඳ වගුවක් නිර්මාණය කරන්න.

4. 'දන් දීම, වතාවත් කිරීම, ධර්ම දේශනා' යන තේමාවන් ඔස්සේ ප්‍රායෝගික වැඩමුළුවක් සකසන්න.

5. දස කුසල් නම් කිරීමට සලස්වා ඒවා කායික වාචසික, මානසික වශයෙන් ප්‍රභේද වන අයුරු වර්ගීකරණය කිරීමට යොමු කරන්න.

6. කේසපුත්තයේ කාලාමයන්ට හොඳ නරක තෝරා ගැනීම සඳහා ලබා දෙන මිනුම් දඬු උපයෝගී කරගෙන වාචික පරීක්ෂණයක් සකසන්න.

**පරිශීලනයට :**

- අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය - මජ්ඣිම නිකාය
- වේළුද්වාර සූත්‍රය - සංයුක්ත නිකාය
- කාලාම සූත්‍රය - අංගුත්තර නිකාය
- නිබ්බේදික සූත්‍රය - අංගුත්තර නිකාය
- කුසල සූත්‍රය - අංගුත්තර නිකාය
- ආධිපතෙය්‍ය සූත්‍රය - අංගුත්තර නිකාය
- ධම්ම පදය - ඛුද්දක නිකාය
- නිර්වාණය හා සදාචාරය - දීගල්ලේ මහින්ද හිමි
- බෞද්ධ සදාචාරයේ මූලධර්ම - ගුණපාල ධර්මසිරි (1988) සර්වෝදය, රත්මලාන

**නිපුණතාව 4.0** : පුද්ගලයාගේ හා සමාජයේ යහපැවැත්මට උපයෝග වන බෞද්ධ ආචාර ධර්ම අධ්‍යයනය කර උභයාර්ථ සාධනයට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 4.2** : පුද්ගල හා සමාජ සංවර්ධනයට අදළ බෞද්ධ ආචාර ධර්ම හැඳින ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 18 යි.

**ඉගෙනුම් පල** :

- බෞද්ධ සාරධර්ම නිවැරදි ව විස්තර කරයි.
- සහජීවනයෙන් ජීවත් වීමට හුරු වෙයි.
- බෞද්ධ සාරධර්මානුකූල ව දිවි ගෙවයි.
- යහගුණ වර්ධනයට අනුබල දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පුද්ගලයා බෞද්ධ සාරධර්මවලින් පෝෂණය කොට, ඒ මඟින් සදාචාරසම්පන්න බෞද්ධ සමාජයක් නිර්මාණය කිරීමට අවශ්‍ය මූලික ගුණ ධර්ම පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබාදෙමින් එම සාරධර්ම ප්‍රායෝගික ව භාවිතයට යොමු කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**ශ්‍රද්ධාව :**

- අමූලිකා ශ්‍රද්ධාව හා ආකාරවතී ශ්‍රද්ධාව යනුවෙන් බෞද්ධ ශ්‍රද්ධාව දෙයාකාර වන බව.
- අමූලිකා ශ්‍රද්ධාව හුදු විශ්වාසය, භක්තිය, පැහැදීම ආදි මනෝභාවයන් හා සම වන බව.
- අමූලිකා ශ්‍රද්ධාව බුදුසමය මඟින් අගය නොකෙරෙන බව.
- බුද්ධාදි රත්නත්‍රයයේ ගුණ දැක දැන එය අවබෝධය මත ඇති කරගන්නා පැහැදීම ආකාරවතී ශ්‍රද්ධාව වන බව.
- අවශ්‍යයෙන් ම බෞද්ධයකු තුළ තෙරුවන් පිළිබඳ ශ්‍රද්ධාව පැවතිය යුතු බව.
- ශ්‍රද්ධාව බෞද්ධ ප්‍රතිපදාව අනුගමනය කිරීමටත්, ඥාන ප්‍රතිලාභය පිණිසත් පුද්ගලයා පොලඹවන මනෝභාවයක් වන බව.
- බෞද්ධ ශ්‍රද්ධාව ප්‍රඥාවෙන් තොර වූවක් නොවන බව.

**පන්සිල් හා අටසිල්**

- ගෘහස්ථ ප්‍රතිපදාවේ පදනම පංචසීලය වන බව.
- එය නිත්‍ය සීලය ලෙසත් ගේහසිබ සීලය ලෙසත් හැඳින්වෙන බව.
- පංචසීල ප්‍රතිපදාවෙන් තම අයිතිය මෙන්ම අනුන්ගේ අයිතිය ද සුරක්ෂිත වන බව.
- පන්සිල් සුරැකීම මඟින් සුරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න, අන්‍යෝන්‍ය විශ්වාසයෙන් යුත් ශිෂ්ට සම්පන්න සමාජයක් බිහි වන බව.
- පංචසීල ප්‍රතිපදාව මඟින් මානව අයිතීන් සුරක්ෂිත වී සමාජ සහජීවනය සැලසෙන බව.
- ගෘහස්ථයකු විසින් සතර පෝයට අෂ්ටාංග සීලය රැකිය යුතු යැයි උගන්වා ඇති බව.
- එම සීලය ආධ්‍යාත්මික සංවර්ධනය පිණිස ද වඩාත් වේගයෙන් නිර්වාණ මාර්ගය දෙසට පුද්ගලයා යොමු කිරීම පිණිස ද ඉවහල් වන බව.
- අෂ්ටාංග සීලය ආරක්ෂා කරන්නා, නො කළ යුත්ත නො කර පවින් වළකින බව හා කළ යුත්ත කරමින් අල්පේච්ඡ ආකාරයට කටයුතු කළ යුතු බව.

**සිවුබඹ විහරණ**

- මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනු සිවුබඹ විහරණ වන බව.
- බ්‍රහ්ම විහාර සියලු සත්ත්වයන් විෂයයෙහි පැතිර විය යුතු චින්තාවන් වන බව.
- ගිහිපැවිදි දෙපක්ෂය විසින් ම ශක්ති ප්‍රමාණයෙන් මෙම බ්‍රහ්ම විහාර ධර්ම ප්‍රගුණ කළ යුතු බව.
- සිවුබඹ විහරණ සීමාවකින් තොර ව වැඩිය යුතු බැවින් අප්පමඤ්ඤා නම් වන බව.
- සමාජ සහජීවනයට බ්‍රහ්ම විහාර බෙහෙවින් උපකාර වන බව.

**සතර සංග්‍රහ වස්තු**

- මතු බලාපොරොත්තු කිසිවක් නැති ව, දීම හෙවත් දානය, ප්‍රියශීලී කතාබහ හෙවත් ප්‍රිය වචනය, අනුන්ගේ යහපතට ක්‍රියා කිරීම හෙවත් අර්ථ චර්යාව, උස්මිටිකම් නොසැලකීම හෙවත් සමානාත්මතාව යනු සතර සංග්‍රහ වස්තුව බව.
- සිගාලෝවාද සූත්‍රයේ ද සතර සංග්‍රහ වස්තු ගිහි ජීවිතයක් තුළ තිබිය යුතු යැයි උගන්වා ඇති බව.
- රියසකට කඩ ඇණය මෙන් සමාජයේ යහපැවැත්මට සතර සංග්‍රහ වස්තු උපයෝගී වන බව
- විශේෂයෙන් ම රාජ්‍ය පාලකයකු විසින් ප්‍රජාවට මෙම සතර කරුණින් සංග්‍රහ කළ යුතු යැයි දැක්වෙන බව.

**හිරි ඔතප්**

- පව්කම් හෙවත් ළාමක ක්‍රියා විෂයෙහි ලජ්ජාව සහ බිය හිරි ඔතප් නම් වන බව.
- සමාජයක යහපැවැත්මට එම සාරධර්ම අත්‍යවශ්‍ය වන බව.
- ලෝකපාලක ධර්ම හෙවත් දේවධර්මය ලෙස ද හිරි ඔතප් හඳුන්වා ඇති බව.

**අල්පේච්ඡතාව**

- ලද පමණින් සතුටු වීම, පහසුවෙන් පෝෂණය කළ හැකි වීම, කටයුතු බහුල නො වීම, සැහැල්ලු දිවි පෙවෙතක් ගත කිරීම, ඉන්ද්‍රිය සංවරය, සරල පැවැත්ම මඟින් අල්පේච්ඡතාව අර්ථවත් වන බව.
- බොහෝ සැප සම්පත් අපේක්ෂා නො කිරීම, අවම පරිභෝජනයෙන් තෘප්තිමත් වීම අල්පේච්ඡතාව බව.
- බෞද්ධ භික්ෂූන් වහන්සේගේ ජීවිතය අල්පේච්ඡතාව නිරූපණය කරන බව.
- සෑම පුද්ගලයකුගේ ම ජීවිතය අල්පේච්ඡතාවට අනුව සකසා ගත යුතු බව.
- මහිච්ඡතාව නිසා ඇති වන සමාජ ප්‍රශ්න මෙන් ම පුද්ගල පරිහානිය ද පාලනය කර ගැනීමට අල්පේච්ඡතාව ඉවහල් වන බව.

**සන්තුෂ්ටිතාව**

- දැහැමි වූත් ශිෂ්ටසම්පන්න වූත් මානසික තෘප්තිය සන්තුෂ්ටිතා නමින් හැඳින්වෙන බව.
- සන්තුට්ඨී පරමං ධනං යන්නෙන් සතුට ජීවිතයේ උතුම් ධනය ලෙස බුදුසමය සලකන බව.
- අන් අය තළා පෙළා දුකට පත් කොට හිංසාවාදී ව ලබන සතුට උතුම් සතුටක් නොවන බව.

**සුභරතාව**

- පහසුවෙන් පෝෂණය කළ හැකි ය යන්න සුභරතාවෙන් අර්ථ ගැන්වෙන බව.
- භික්ෂු ජීවිතය මඟින් එම ආදර්ශය ලැබෙන බව.
- ශිෂ්‍ය ජීවිතය ද සුභරතාවෙන් යුක්ත විය යුතු බව.
- සුභරතාව නිසා තමාට මෙන් ම අනුන්ට ද යහපතක් වන බව.

**නීති ගරුකත්වය හා සහජීවනය**

- නීති ගරුකත්වය අපරිහානීය ධර්මයක් ලෙස දැක්වෙන බව.
- සාමූහික ජීවිතයේ දී නීතිගරුකත්වයේ අවශ්‍යතාව ශික්ෂාපද පැනවීමේ පරමාර්ථ ඔස්සේ පැහැදිලි වන බව.
- බුදුදහම මඟින් දඬුවම ප්‍රතික්ෂේප නොවන නමුදු එය අපරාධ වැළැක්වීමේ එක ම පිළියම ලෙස පිළිගෙන නැති බව.
- නීතිය සමාජ සම්මතයක් බව හා එම සම්මතයන් නො ඉක්මවා ක්‍රියා කළ යුතු යැයි ඉගැන්වෙන බව.
- මිනිසා වරදට පෙලඹෙන හේතු නැති කොට අපරාධ නැති කිරීම බෞද්ධ පිළිවෙත බව.
- නීති ගරුක වීම සාමූහික පැවැත්මට හා සමඟියට මඟපාදන බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. පුද්ගල හා සමාජ සංවර්ධනයට අදාළ බෞද්ධ ආචාර ධර්ම නම් කර ඒ එක් එක් සංකල්ප විස්තර කරන පොත් පිංචක් නිර්මාණය කරන්න.
2. පුද්ගල හා සමාජ සංවර්ධනයට අදාළ බෞද්ධ ආචාර ධර්ම භික්ෂූන් වහන්සේට සේ ම ගිහියාට ද ඉතා වැදගත් ය. ඒ පිළිබඳ ව ළමයින් පෙරදැරි කරගෙන සංවාදයක් ගොඩනගන්න.
3. බෞද්ධ ආචාර ධර්ම මඟින් ගිහි ජීවිතය යථාර්ථවත් කර ගන්නා ආකාරය පැහැදිලි වන මාතෘකා කීපයක් නම් කොට ක්ෂණික කථා වාරයක් පවත්වන්න.
4. සතර සංග්‍රහ වස්තු බුද්ධ චරිතයෙන් ප්‍රකට වූ අවස්ථා පිළිබඳ ලේඛනයක් සකසන්න.
5. 'පුද්ගල හා සමාජ සංවර්ධනය සඳහා දේවධර්මය අත්‍යවශ්‍ය වේ' යන තේමාව ඔස්සේ ලිපියක් සකස් කරන්න.
6. නීතිගරුක දිවි පෙවෙතක් උදෙසා බුදු දහමින් ලබාගත හැකි ආදර්ශ පෙළ ගස්වන්න.

**පරිශීලනයට :**

- චක්කවත්ති සීහනාද සූත්‍රය - දීඝ නිකාය
- කූටදන්ත සූත්‍රය - දීඝ නිකාය
- මහා පරිනිබ්බාන සූත්‍රය - දීඝ නිකාය
- සිගාලෝවාද සූත්‍රය - දීඝ නිකාය
- බ්‍රහ්මවිහාර සූත්‍රය - අංගුත්තර නිකාය
- ධම්මික සූත්‍රය - සුත්ත නිපාතය
- මෙත්ත සූත්‍රය - සුත්ත නිපාතය
- දේව ධර්ම ජාතකය - පන්සිය පනස් ජාතකය

**නිපුණතාව 5.0 :** පරිසරය, ආර්ථිකය හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගික ව භාවිත කරමින් අර්ථවත් හා තෘප්තිමත් ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 5.1 :** පරිසරය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 19 යි.

**ඉගෙනුම් පල :**

- පරිසරය හා සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය අනාවරණය කර ගනියි.
- පරිසර සංරක්ෂණයට හා සෞන්දර්ය රසාස්වාදයට පෙලඹෙයි.
- ජීවිතය සංවේදී ව හා යථාර්ථවාදී ව ගත කරයි.
- සත්ත්ව ප්‍රජාවගේ යහපැවැත්ම උදෙසා කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදුසමය හා පරිසරය අතර පවත්නා සමීප සබඳතාවත් පරිසර සංරක්ෂණය පිළිබඳ ව බුදුදහමේ අවධානයත් අධ්‍යයනය කරමින් පරිසර හිතකාමී, සෞන්දර්ය රසාස්වාදය අගය කරන සංවේදීතාවන් දරුවන් තුළ ඇති කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**බුදුසමය හා පරිසරය**

- ශාක හා සත්ත්ව ප්‍රජාව ද, ජලය, වාතය ආදි ස්වාභාවික වස්තූන් ද පරිසරයට අයත් අංග වන බව.
- බුදුසමය ස්වාභාවික සම්පත් විෂයයෙහි සුහද මිත්‍රශීලී අවධානයක් යොමු කොට ඇති බව.
- සත්ත්ව ප්‍රජාව ආරක්ෂා කිරීමටත් වෘක්ෂලතා රෝපණයට හා රක්ෂණයටත්, ජල දූෂණය, වායු දූෂණය ශබ්ද දූෂණය ආදි පරිසරයට අහිතකර දෑ වැළැක්වීමටත් බෞද්ධ ඉගැන්වීම් මගින් විශේෂ අවධානයක් යොමු කර ඇති බව.
- බුදුසිරිත, භික්ෂු ජීවිතය හා පරිසරය අතර සමීප සබඳතාවක් පැවති බව.

**පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්**

- පරිසර සංරක්ෂණය සඳහා අදාළ කරගත හැකි අගනා උපදෙස් රැසක් බුදුසමයෙහි ඇතුළත් බව.
- බුදු රජාණන් වහන්සේ මෙන් ම ශ්‍රාවක භික්ෂූන් ද පිවිතුරු සුන්දර පරිසරයට ඇලුම් කළ බව හා සමීප වූ බව.
- සංයුක්ත නිකායේ වනරෝප සූත්‍රයේ වෘක්ෂලතා හා පරිසරය සංරක්ෂණයට අදාළ ඉගැන්වීම් ඉදිරිපත් කොට ඇති බව.

ආරාම රෝපා වන රෝපා
යේ ජනා සේතු කාරකා
පපඤ්ච උදපානංච
යේ දදන්ති උපස්සයං
තේසං දිවාච රත්තෝච
සදා පුඤ්ඤං පවඩ්ඪති
ධම්මට්ඨා සීල සම්පන්නා
තේ ජනා සග්ගගාමිනෝ

- විනය ශික්ෂාවන්හි මෙන් ම සේඛියාවල ද පරිසර සංරක්ෂණයට අදාළ කරුණු ඇතුළත් වන බව.
- ගස්වැල් සිඳීම, සියලු ආකාරයේ පැළ වන බීජ සිඳීම භික්ෂූන්ට ආපත්ති ලෙස දක්වා ඇති බව.
- වර්තමාන මිනිසාගේ ඇතැම් ක්‍රියාකාරකම් පරිසරයට අහිතකර ලෙස බලපා ඇති බව සහ එය මිනිසා සහිත සත්ත්ව හා ශාක ප්‍රජාවේ යහපැවැත්මට තර්ජනයක් වී ඇති බව.
- ජලයට මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම භික්ෂූන්ට තහනම් කොට ඇති බව.
- නිල් තණ පිට්ටනිවල මුත්‍රා කිරීම , මලපහ කිරීම, කෙළ ගැසීම භික්ෂූන්ට තහනම් කොට ඇති බව.

**සෞන්දර්ය රසාස්වාදනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්**

- සෞන්දර්ය රසාස්වාදනය බුදුදහම තුළ අවතක්සේරු කර නැති බව.
- බුදුරදුන් උසස් රස වින්දනය අගය කර ඇති බව.
- බුද්ධ ශ්‍රාවක - ශ්‍රාවිකාවන් භාවනාව මඟින් ලැබූ කායික හා මානසික සැහැල්ලුව ද ඇති ව නිකෙලෙස් ඇසින් සුන්දරත්වය වින්දනය කොට ඇති බව.
- ස්වභාව සෞන්දර්යය හා නිර්මාණ සෞන්දර්යය ඇගයීමට ලක් කොට ඇති අවස්ථා මූලික සූත්‍රවල පවා බහුල ව දැකිය හැකි බව.
- විවේකය ධාර්මික ව ගත කිරීමේ දී උසස් කාව්‍ය, චිත්‍ර, මූර්ති වැනි කලා මාධ්‍ය මඟින් සිය අත්දැකීම් සන්නිවේදනය කළ හැකි බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. පරිසර සංරක්ෂණය සඳහා අදාළ කරගත හැකි අගනා උපදෙස් රැසක් බුදුසමයේ ඇතුළත් වේ. ඒවා විස්තර කරන්න.
2. බුදු රජාණන් වහන්සේ මෙන් ම ශ්‍රාවකයන් වහන්සේලා ද සුන්දර පරිසරය අගය කළ ආකාරය පිළිබඳ කරුණු ගවේෂණයට සිසුන් යොමු කරන්න.
3. 'පාරිසරික රමණීයත්වය බුදුදහමින් ඇගයීමට ලක් වේ' යන මාතෘකාව යටතේ සාකච්ඡා මණ්ඩපයක් පවත්වන්න.
4. බුදුදහමින් ඇගයීමට ලක් කර ඇති ස්වභාව සෞන්දර්යය හා නිර්මාණ සෞන්දර්යය පිළිබඳව කරුණු ඇතුළත් සූත්‍ර හා එම සූත්‍රවලින් ලබාගත් කරුණු වෙන් වෙන් ව දක්වා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
5. සාමූහික ව වින්දනය කළ හැකි ධාර්මික විනෝදාස්වාද පිළිබඳ ලේඛනයක් සකස් කරන්න.
6. රහතන් වහන්සේලා ස්වභාව සෞන්දර්යය විඳගත් ආකාරය දැක්වෙන ථේරගාථා හා ඒවායේ අදහස් ඇතුළත් කුඩා පොතක් පිළියෙළ කරන්න.

**පරිශීලනයට :**

| | | |
|---|---|---|
| • සක්කපඤ්හ සූත්‍රය | - | දීඝ නිකාය |
| • මහාපරිනිබ්බාණ සූත්‍රය | - | දීඝ නිකාය |
| • චක්කවත්තී සීහනාද සූත්‍රය | - | දීඝ නිකාය |
| • වංගීස සංයුත්තය | - | සංයුත්ත නිකාය |
| • වනරෝප සූත්‍රය | - | සංයුත්ත නිකාය |
| • දේවතා සංයුත්තය | - | සංයුත්ත නිකාය |
| • ඒතදග්ගපාලිය | - | අංගුත්තර නිකාය |
| • ථෙර ථෙරී ගාථා | - | ඛුද්දක නිකාය |
| • ධම්ම පදය (204 ගාථාව) | - | ඛුද්දක නිකාය |
| • ජාතක පාළි (84 ගාථාව) | - | ඛුද්දක නිකාය |
| • මෙත්ත සූත්‍රය | - | සුත්ත නිපාතය |
| • සේඛියා ධම්ම | - | පාචිත්තිය පාලි |
| • භූතගාම වග්ගය | - | පාචිත්තිය පාලි |
| • බුදුදහම හා පරිසරය | - | දේවාලේගම මේධානන්ද හිමි |
| • පාලි - ත්‍රිපිටකයේ එන සෞන්දර්ය වර්ණනා | - | සෙනෙවිරත්න මහලේකම් |

**නිපුණතාව 5.0** : පරිසරය, ආර්ථිකය හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගික ව භාවිත කරමින් අර්ථවත් හා තෘප්තිමත් ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 5.2** : ආර්ථිකය පිළිබඳ බෞද්ධ චින්තනය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 17 යි.

**ඉගෙනුම් පල** :

- ආර්ථිකය සම්බන්ධ බෞද්ධ ආකල්පය මූලාශ්‍රයානුසාරයෙන් පැහැදිලි කරයි.
- විධිමත් ආර්ථික සමෘද්ධියක් ඇති කර ගැනීමට උනන්දු වෙයි.
- ධාර්මික ආර්ථික ප්‍රතිපදාවකට අනුගත ව ක්‍රියා කරයි.
- විධිමත් හා දැහැමි ආර්ථික සංවර්ධන සැලසුම් සකස් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ශ්‍රමය හා ධනය අතර පවත්නා සම්බන්ධය අවධාරණය කරමින් දැහැමි ධනෝපායන මාර්ගයකට සිසු මනස යොමු කිරීමත් සමාජ සහජීවනය සැලසෙන පරිභෝජන රටාවකට හුරු කිරීමත් ධන සම්පත් සුරක්ෂිත කිරීමට යොමු කිරීමත් මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**ධනෝපායනය, ධන පරිහරණය හා ආර්ථික සුරක්ෂිතතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම**

- දිළිඳුකම කාමභෝගී ගිහියාට දුකක් ලෙස බුදුසමය උගන්වන බව.
- ධන සම්පත් නොමැති වීම සමාජ ව්‍යසනයන්ට හේතු වන බව.
- ආර්ථික සමෘද්ධිය ඇති කර ගැනීම ගෘහස්ථ ජීවිතයේ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය සාධකයක් ලෙස බුදුසමය අවධාරණය කරන බව.
- ධාර්මික ව ධනය ඉපැයිය යුතු යැයි බුදුසමය උගන්වා ඇති බව.
- සම්පත් පරිභෝජනයෙහි ලා බුදුසමය පරිභෝජන දර්ශනයක් ඉදිරිපත් කර ඇති බව හා අගථිතෝ, අමුච්ඡිතෝ, අනජ්ඣාපන්නෝ ආදීනව දස්සාවී, නිස්සරණ පඤ්ඤා ආදි වශයෙන් එය දක්වෙන බව.
- නොකළ යුතු වෙළෙඳාම් මෙන් ම තුලාකූට, කංසකූට, මානකූට, උක්කෝටන, නිකති ආදි විවිධ වාංචනික කටයුතුවලින් මුදල් ඉපයීම නොකළ යුතු යැයි දැක්වෙන බව.
- ධනය ඉපයීම දැහැමි ව හා අසාහසික ව සිදු කළ යුතු බව.
- රාසිය ගාමිණී සූත්‍රයේ දී ධන පරිහරණය පිළිබඳ උපදෙස් 4ක් පෙන්වා දී ඇති බව.
- ඒවා දැහැමින් ඉපයීම, තමා සැපවත් වීම, පරිත්‍යාග කිරීම හා ගිජුකමින් තොර ව ධනය පරිහරණය කිරීම ආදි වශයෙන් දැක්විය හැකි බව.
- පත්තකම්ම සූත්‍රයේ දී හා අපුත්තක සූත්‍රයේ තමා මෙන් ම මවුපිය, අඹුදරු, සේවක සේවිකා ආදීන් සැපවත් කිරීම පිණිස සිය ධනය පරිහරණය කළ යුතු යැයි දේශනා කොට ඇති බව.

- ඤාතිබලි, අතිථිබලි, පුබ්බපේතබලි, රාජබලි, දේවතාබලි වශයෙන් ධනයෙන් සිදු කළ යුතු යුතුකම් පඤ්චබලි සංකල්පයෙහි ඇතුළත් බව.
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන සමජීවිකතාවෙන් මනා කළමනාකාරිත්වයෙන් යුතු ව ධනය පරිහරණය කිරීමට උගන්වා ඇති බව.
- සිගාලෝවාද සූත්‍රයේ ''ඒකේනභෝගේ භුඤ්ජෙය්‍ය.......'' ආදි ගාථාවෙන් සම්පත් කළමනාකරණය පිළිබඳ වටිනා ධර්මෝපදේශයක් දක්වා ඇති බව.

**ශ්‍රමය, ධනය හා සමාජ සුභසිද්ධිය අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම**

- ධනය පිණිස ශ්‍රමය වැය කිරිම අනිවාර්ය බැවින් අනලස් ව උත්සාහයෙන් හා වීර්යයෙන් ක්‍රියා කළ යුතු බව.
- තම ශ්‍රමය ධාර්මික ජීවිකා වෘත්තීන්හි යෙදවිය යුතු බව සහ ධනය පිණිස කිසි දු ආකාරයක අධාර්මික ක්‍රියාවක උත්සාහවත් නොවිය යුතු බව.
- දැහැමි ව ඉපයූ ධනය සුරක්ෂිත කර ගැනීම පිණිස උපායශීලී ව ධන පරිහානි මුඛ වසා දැමිය යුතු බව.
- පවිටු මිතුරන්ගෙන් දුරු ව, කල්‍යාණ මිත්‍ර සේවනය ඇති ව ක්‍රියා කළ යුතු බව.
- ධනය පසුපස හඹාගෙන යාමත්, ධන සම්පත් ජීවිතයේ නිෂ්ඨාව ලෙස නොසැලකීමත් සම්පත් ගොඩ ගසා නො ගෙන සංසරණයට හා පරිහරණයට ඉඩ හැරීමත් කළ යුතු බව.
- යුතුකම් හා වගකීම් වෙනුවෙන් තම දැහැමි ධනය කැප කළ යුතු බව.
- ලෞකික සම්පත්වල යථාර්ථය දැක අතෘප්තිකර භාවයෙන් හා තණ්හාදාස භාවයෙන් මිදී පරිහරණය කිරීම සමාජ සුභසිද්ධියට හේතු වන බව.
- සප්ත ආර්ය ධනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ආධ්‍යාත්මික හා සමාජීය යහපතට සෘජු ව බලපාන බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. බෞද්ධ මූලාශ්‍රයයන්හි ධනය ඉපයීම, පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ඇතුළත් වන බැවින් එම ඉගැන්වීම සොයා ලේඛනගත කරන්නට සිසුන් ගවේෂණයේ යොදවන්න.
2. සිසුන් එක්රැස් කරගත් කරුණු ගොනු කරන්නට උපදෙස් දෙන්න. ඒ කරුණු ලෞකික ලෝකෝත්තර වශයෙන් වර්ග කරන්නට සිසුන් මෙහෙයවන්න.
3. 'ලෝකෝත්තර සැපය උසස් වන අතර එය ලෞකික සැප සාදා ගැනීමට බාධා නොවිය යුතුය' යන අදහස යටතේ කෙටි ලිපියක් සකස් කරන්න.
4. උපයා ගන්නා ධනය අනුවණකමින් ඇතැම්හු විනාශ කර ගනිති. එසේ අනුවණකමින් ධනය විනාශ කර ගන්නා ලද ක්‍රම පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න.

5. 'ණයගැති බව පුද්ගල පරිහානියට බලපායි'
   මේ මාතෘකාව යටතේ බිත්ති පුවත්පතක පළ කිරීම සඳහා ලිපියක් සකස් කරන්න.
6. 'දුරාචාරයට හේතුව දරිද්‍රතාව යි, දුරාචාරයට හේතුව දරිද්‍රතාව ම නොවේ' යන තේමාව ඔස්සේ පන්ති කාමරයේ විවාදයක් සූදානම් කරන්න.

**පරිශීලනයට :**

- සිගාලක සූත්‍රය - දීඝ නිකාය
- කූටදන්ත සූත්‍රය - දීඝ නිකාය
- චක්කවත්ති සීහනාද සූත්‍රය - දීඝ නිකාය
- රාසිය සූත්‍රය - සංයුත්ත නිකාය
- පඨම හා දුතිය අපුත්තක සූත්‍ර - සංයුත්ත නිකාය
- කුල සූත්‍රය - අංගුත්තර නිකාය
- ඉණ සූත්‍රය - අංගුත්තර නිකාය
- අනණ සූත්‍රය - අංගුත්තර නිකාය
- අන්ධ සූත්‍රය - අංගුත්තර නිකාය
- අරියවංස සූත්‍රය - අංගුත්තර නිකාය
- කාමභෝගි සූත්‍රය - අංගුත්තර නිකාය
- වණිජ්ජ සූත්‍රය - අංගුත්තර නිකාය
- පාපණික සූත්‍රය - අංගුත්තර නිකාය
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රය - අංගුත්තර නිකාය
- පත්තකම්ම සූත්‍රය - අංගුත්තර නිකාය
- ධම්මපදය 49 ගාථාව - ඛුද්දක නිකාය
- මුල් බුදුසමයෙන් හෙළි වන බෞද්ධ ආර්ථික දර්ශනය - ධර්මසේන හෙට්ටිආරච්චි
- බෞද්ධ ආර්ථික දර්ශනය - බෙලිගල්ලේ ධම්මජෝති හිමි.
- උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
  (පළමු වන කොටස)
- බෞද්ධ සංස්කෘතිය (සමාජ චින්තනය පුදසිරිත් හා උත්සව) -
  - දේවාලේගම මේධානන්ද හිමි.
  - තැරැලේ ධම්මරතන හිමි.
  - ඩබ්. ඒ. ගාමිණී විජයසිංහ.

**නිපුණතාව 5.0 :** පරිසරය, ආර්ථිකය හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගික ව භාවිත කරමින් අර්ථවත් හා තෘප්තිමත් ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 5.3 :** භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ චින්තනය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 15 යි

**ඉගෙනුම් පල :**

- භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනය කරයි.
- භෞතික සම්පත් ඵලදයි ලෙසත්, කාර්යක්ෂම ලෙසත් යොදගැනීමට හුරු වෙයි.
- විධිමත් කළමනාකාරිත්වයකින් යුතු ව දෛනික ජීවිතය ගත කරයි.
- භෞතික සම්පත් විධිමත්ව කළමනාකරණය කිරීමේ අගය පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හැඳින පෞද්ගලික හා සමාජ ජීවිතයේ දී එම කළමනාකරණ ඉගැන්වීම් භාවිතයට ගැනීමට යොමු කිරීමත් එමඟින් වර්තමානයේ භෞතික හා මානව සම්පත් භාවිතය සම්බන්ධ ව ඇති ගැටලු නිරාකරණය කිරීමට මඟපෙන්වීමත් මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්**

- භෞතික සම්පත් ඵලදායි ලෙස යොදා ගැනීම පිණිස කළමනාකරණය අත්‍යවශ්‍ය සාධකයක් වන බව.
- සම්පත් නිසි පරිදි කළමනාකරණය කර ගැනීම ගෘහස්ථ ජීවිතයේ දියුණුවට අත්‍යවශ්‍ය සාධකයක් බව.
- භෞතික සම්පත් කළමනාකරණය සඳහා විනය පිටකය මඟින් උසස් මඟ පෙන්වීමක් කර ඇති බව.
- කළමනාකරණය විෂයයෙහි අවශ්‍ය නිසි නායකත්වය බුදු රදුන්ගෙන් හා ශ්‍රාවක භික්ෂූන්ගෙන් සමාජයට ලබාගත හැකි බව.
- සිගාලෝවාද සූත්‍රය, කුල සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය ආදි දේශනාවන්හි භෞතික සම්පත් කළමනාකරණයට අදාළ ප්‍රායෝගික උපදෙස් ඇතුළත් වන බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. සම්පත් යනු මොනවා දැයි සිසුන්ගෙන් විමසා ඔවුන් සමාජ සම්පත් සුරැකීම පිළිබඳ දක්වන ආකල්ප විමසන්න.
2. භෞතික සම්පත් හා මානව සම්පත් ඵලදායක ව යොදා ගැනීමට අදාළ බෞද්ධ ඉගැන්වීම් වෙන් වෙන් ව සටහන් කරන්න.
3. කළමනාකරණය පුද්ගලයාගේ ලෞකික දියුණුවට හේතු වන බවට ඇති සාධක සමීක්ෂණයට සිසුන් යොමු කරන්න.
4. 'සම්පත් කළමනාකරණය පිළිබඳ ව බෞද්ධ ඉගැන්වීම් පුද්ගල දියුණුවට බාධාවක් නොවේ.' යන මාතෘකාව යටතේ සාකච්ඡා මණ්ඩපයක් පවත්වන්න.
5. භෞතික සම්පත් කළමනාකරණය ගැන බුදුදහමින් ලබා දී ඇති පූර්වාදර්ශ පිළිබඳ ලේඛනයක් සකස් කර, පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
6. ' ගුණ ජාතකය ' පරිශීලනය සඳහා සිසුන් යොමු කර, කොසොල් රජු හා ආනන්ද හිමි අතර පැවැති චීවර පරිහරණය පිළිබඳ සංවාදය අධ්‍යයනය කිරීමට සලස්වන්න. පැවිදි ජීවිතයේ දී සම්පත් කළමනාකරණය සිදු කරන අයුරු එමගින් අවබෝධ කර ගැනීමට සිසුන් යොමු කරන්න

**පරිශීලනයට :**

- සිගාලෝවාද සූත්‍රය - දීඝ නිකාය
- චූලගෝසිංග සූත්‍රය - මජ්ඣිම නිකාය
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රය - අංගුත්තර නිකාය
- කුල සූත්‍රය - අංගුත්තර නිකාය
- අන්ධ සූත්‍රය - අංගුත්තර නිකාය
- චම්පෙය්‍යක්ඛන්ධකය - මහාවග්ගපාළි
- බුද්ධකාලීන බෞද්ධ පැවිදි දිවිය සහා විනය (සිංහල පරිවර්තනය) - සුකුමාර දත්, ආනන්ද හේරත් (1984), සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ
- නිවන් මඟ (බෞද්ධ කළමනාකරණය 2002) - රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය.
- කළමනාකරණ සංකල්ප බෞද්ධ ප්‍රවේශයක් - ඉන්ද්‍රාණි පෙරේරා (2006), කර්තෘ ප්‍රකාශන, බොරලැස්ගමුව

**නිපුණතාව 5.0** : පරිසරය, ආර්ථිකය හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගික ව භාවිත කරමින් අර්ථවත් හා තෘප්තිමත් ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 5.4** : ලෞකික සැප පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හැඳින ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 13 යි.

**ඉගෙනුම් පල** :

- ලෞකික සැපය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විස්තර කරයි.
- ඉඳුරන් පිනවීම සීමා කළ යුතු බව පිළිගනියි.
- ධාර්මික ව කම්සැප විඳිමින් තෘප්තිමත් ගෘහ ජීවිතයක් ගත කරයි.
- අන්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

දැහැමි ඉන්ද්‍රිය පීනනය මඟින් ලැබෙන දැහැමි සැපය සතුට දනවන්නක් වන අතර, එය ලබා ගැනීමට උත්සාහ කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

- මිනිසා සුඛකාමී සත්ත්වයකු ලෙස බුදුසමය පිළිගන්නා නමුදු කාමසුඛල්ලිකානු යෝගය බැහැර කරන බව.
- සසර දුක් සහිත යැයි බුදුසමය අවධාරණය කරන නමුදු එහි සැපයක් නැතැයි ඉන් අදහස් නොවන බව සහ සදාචාරාත්මක සීමාවන් තුළ ගිහි බෞද්ධයා ලෞකික වූ පස්කම් සුව විඳීම බෞද්ධ ඉගැන්වීම්වලට විරුද්ධ නොවන බව.
- ගිහිසුඛ, පබ්බජ්ජා සුඛ ආදි වශයෙන් බෞද්ධ ඉගැන්වීම්වල සැපය පිළිබඳ විවිධාකාර වර්ගීකරණයන් දැකිය හැකි බව.
- අත්ථි, භෝග, අනණ, අනවජ්ජ යන සුඛයන් ගිහි සැපය සම්බන්ධයෙන් වැදගත් වන අතර ගෘහස්ථ ජීවිතයට අදාළ ව එම සැප බුදු සමයෙහි අගය කොට ඇති බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

නිපුණතා මට්ටම අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. දැහැමි කම්සුව විඳීමේ සතුට හා අධාර්මික කම්සුව විඳීමේ විපාක පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
2. ණයගැති වීමේ ආදීනව පිළිබඳ ව පන්ති කාමරයේ දී කතාවක් පවත්වන්න.
3. අධාර්මික ක්‍රම මඟින් සැප සොයායාම නිසා පුද්ගලයා දුකට පත්වන අවස්ථා සාකච්ඡා කරන්න.

4. තිරිසන් යෝනිගත සතුන් පවා  සැපයට කැමති බව ප්‍රකට වන අවස්ථාවක් අත්දැකීමක් ඇසුරින් පන්තියට ඉදිරිපත් කරන්න.
5. 'සැප' පිළිබඳ විවිධ ප්‍රභේද ඇතුළත් චාට් සටහනක් සකස් කරන්න.
6. 'පසිඳුරන් පිනවීම පරම සැපය නොවේ' යන මාතෘකාව සඳහා ලිපියක් සකස් කරන්න. සාර්ථක ම ලිපිය පන්ති කාමරයේ බිත්ති පුවත්පතෙහි ප්‍රසිද්ධ කරන්න.

**පරිශීලනයට** :

| | | |
|---|---|---|
| සක්කපඤ්හ සූත්‍රය | - | දීඝ නිකාය |
| පායාසි සූත්‍රය | - | දීඝ නිකාය |
| ඉණ සූත්‍රය | - | දීඝ නිකාය |
| අනණ සූත්‍රය | - | අංගුත්තර නිකාය |
| ව්‍යග්ඝපජ්ජ සූත්‍රය | - | අංගුත්තර නිකාය |
| සුඛවග්ග (ධම්ම පදය) | - | ඛුද්දක නිකාය |

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම් - ඉගැන්වීම් සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගැයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍යය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවර්ධනාත්මක සැලැස්මක් යොදාගත යුතු ය.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩිදියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. තව ද මෙය ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝ කිරීමක් වශයෙන් ද හැඳින්විය හැකි ය. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක් විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරුණු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මඟින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුභවතාගේ වගකීමකි. ඇගයීමේ (තක්සේරු කිරීමේ ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබාදිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයෙන් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයක් ලබාදීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම්

වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශ්වවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතුය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් ක්‍රියාවලිය සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්-ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේ ය.

| | |
|---|---|
| 1. පැවරුම් | 2. ව්‍යාපෘති |
| 3. සමීක්ෂණ | 4. ගවේෂණ |
| 5. නිරීක්ෂණ | 6. ප්‍රදර්ශන /ඉදිරිපත් කිරීම |
| 7. ක්ෂේත්‍ර චාරිකා | 8. කෙටි ලිඛිත පරීක්ෂණ |
| 9. ව්‍යූහගත රචනා | 10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. ශ්‍රවණ පරීක්ෂණ |
| 13. ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. කථනය |
| 15. ස්ව නිර්මාණ | 16. කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. සංකල්ප සිතියම් | 18. ද්විත්ව සටහන් ජර්නල |
| 19. බිත්ති පුවත්පත් | 20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21. ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. විවාද |
| 23. සාකච්ඡා මණ්ඩල | 24. සම්මන්ත්‍රණ |
| 25. ක්ෂණික කථා | 26. භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක් ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, නිපුණතා මට්ටමට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වගබලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශවල ගුරවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්වීම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

# ඇගයීම

**වාරය** : 1
**උපකරණ අංක** : 1
**නිපුණතාව** : 1.0
**නිපුණතා මට්ටම** : 1.1
**උපකරණයේ ස්වභාවය** : ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන

**ක්‍රියාවලිය** : 12 ශ්‍රේණියේ බෞද්ධ ශිෂ්ටාචාරය විෂය ඉගෙන ගන්නා සියලු ම සිසුන් සංඛ්‍යාව අනුව කේවල වශයෙන් හෝ කාණ්ඩ වශයෙන් යොදාගෙන ගුරු භවතා විසින් නිපුණතා මට්ටම ආවරණය වන පරිදි සකස් කරගත් ප්‍රශ්න වලට අදාළ පිළිතුරු සිසුන්ගෙන් විමසීම. මෙහිදී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන සඳහා පහත ආකෘතිය භාවිතයට ගන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | පිළිතුරු ඉදිරිපත් කිරීමට දක්වන උනන්දුව | නිවැරදිව පිළිතුරු ඉදිරිපත් කිරීම | තරඟයේ නීතිරීතිවලට දක්වන අනුකූලතාවය | තමන්ට හිමි කාලය පිළිබඳ ව සැළකිලිමත් ව පිළිතුරු ලබාදීම | පූර්ව සූදානම හා ස්මරණ ශක්තිය | ලකුණු එකතුව (20 න්) | මුළු ලකුණු / 2 අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| **තත්වය** | **ලකුණු** |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

# ඇගයීම

වාරය : 1
උපකරණ අංක : 2
නිපුණතාව : 1.0
නිපුණතා මට්ටම : 1.2
උපකරණයේ ස්වභාවය : බිත්ති පුවත්පතක් සැකැසීම

ක්‍රියාවලිය : නිගණ්ඨ, ආජීවක, ජටිල, පරිබ්‍රාජක යන ශ්‍රමණ ගුරුකුල, පූර්ණකාශ්‍යප, මක්ඛලීගෝසාල ආදී ෂට් ශාස්තෘන්ගේ ඉගැන්වීම් වෙන වෙන ම බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ සුවිශේෂතා හා ශ්‍රමණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ යන මාතෘකා යටතේ ලිපි නිර්මාණය කිරීමට උපදෙස් ලබාදීම

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඇති සම්බන්ධතාව | සංවිධානාත්මක බව, ආකර්ෂණීය බව හා ප්‍රමාණාත්මක බව | අලංකරණය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායේ යෝග්‍ය බව | අන්තර්ගතයේ ඇති නිර්මාණශීලී බව හා තර්කානුකූල බව | බිත්ති පුවත්පතේ නිර්මාණාත්මක බව | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

**වාරය** : 1
**උපකරණ අංක** : 3
**නිපුණතාව** : 1.0
**නිපුණතා මට්ටම** : 1.3
**උපකරණයේ ස්වභාවය** : ගවේෂණය

**ක්‍රියාවලිය** : බුද්ධකාලීන භාරතයේ පැවැති සොළොස් මහා ජනපද පාලන ක්‍රම, බුදුරදුන් හා පාලකයන් අතර පැවැති සබඳතා යන කාරණාවන්ට අදාළ තොරතුරු රැස් කරන්න. තොරතුරු රැස්කිරීමට භාවිත ග්‍රන්ථ නාමාවලිය ද ඉදිරිපත් කරන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | මාතෘකාවට අදාළ බව | කරුණු රැස් කිරීමේ නිර්මාණශීලී බව | ඉදිරිපත් කරන ලද කරුණුවල නිරවද්‍යතාව | සංවිධානාත්මක බව හා නිර්මාණාත්මක බව | ක්‍රමවත්ව ඉදිරිපත් කිරීම හා නියමිත දිනයට ලබාදීම | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

**වාරය** : 2
**උපකරණ අංක** : 4
**නිපුණතාව** : 2.0
**නිපුණතා මට්ටම** : 2.1
**උපකරණයේ ස්වභාවය** : ප්‍රශ්න සහ පිළිතුරු පොත්

**ක්‍රියාවලිය** : බුදු රජාණන් වහන්සේගේ නවඅරහාදී බුදුගුණ, මහාකරුණාව, මහා ප්‍රඥාව, ආදර්ශවත් නායකත්වය, විශිෂ්ට ශාස්තෘත්වය, තාදිගුණය, පද්මාකාර ජීවිතය, නිදහස් චින්තනය, ආගමික සහනශීලී බව හා බුදු රජාණන් වහන්සේ පිළිබඳ සමකාලීන හා නූතන ඇගැයීම් යන තේමාවන්ට අදාළව ප්‍රශ්න 50ක් සහ ඒවාට පිළිතුරු ඇතුළත් පොතක් නිර්මාණය කරන්න. ඉදිරිපත් කිරීමට නියමිත කාලයක් ලබා දෙන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | මාතෘකාවට අදාළ පරිදි ප්‍රශ්න සකස් කිරීම | නිවැරදි පිළිතුරු සකස් කිරීම | ලේඛන කුසලතාව | අන්තර්ගතයේ නිර්මාණශීලී බව | කාලානුකූල බව, නිමාව හා නියමිත කාලයට ඉදිරිපත් කිරීම | මුළු ලකුණු (20 න්) | මුළු ලකුණු / 2 අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය** :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

වාරය : 2
උපකරණ අංක : 5
නිපුණතාව : 3.0
නිපුණතා මට්ටම : 3.1
උපකරණයේ ස්වභාවය : සාකච්ඡා මණ්ඩල

**ක්‍රියාවලිය** : ''ස්වච්ඡන්දතාව පුද්ගලයාගේ හා සමාජයේ අභිවෘද්ධිය සඳහා හේතු වේ''. යන මාතෘකාව යටතේ සාකච්ඡා මණ්ඩලයක් සංවිධානය කිරීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ප්‍රවේශය මාතෘකාව හඳුන්වීම හා එහි උචිත බව | මාතෘකාවට අදාළ ව කරුණු ඉදිරිපත් කිරීම හා සංවිධානාත්මක බව | අදහස් නිර්මාණශීලීව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීම | උචිත ලෙස විනය පවත්වා ගැනීම හා කාල කළමනාකරණය | සම්පිණ්ඩනය, නිගමන හා නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

වාරය : 2
උපකරණ අංක : 6
නිපුණතාව : 3.0
නිපුණතා මට්ටම : 3.3
උපකරණයේ ස්වභාවය : කථනය

**ක්‍රියාවලිය** : බෞද්ධ දේශපාලන මූලධර්මයන්ට අදාළ ව ගොනුකරගත් මාතෘකා ලැයිස්තුවෙන් කුසපත් ක්‍රමයට සිසුන්ට මාතෘකා තෝරා ගැනීමට සලස්වන්න. තෝරාගත් මාතෘකාව යටතේ විනාඩි 04ක කතාවක් පැවැත්වීමට යොමු කරන්න. මුල්ම තරඟකරුට මාතෘකාව විනාඩි 5 කට කලින් ලබාදී ඉන්පසුව තරඟ වැදීමට ඉඩ සලස්වන්න. ඒ අනුව සෑම තරඟකරුවකුටම විනාඩි 5 බැගින් සූදානම්වීමට කාලයක් ලබා දෙන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ප්‍රවේශය, මාතෘකාව මැනවින් හැඳින්වීම හා එහි උචිත බව | මාතෘකාවට අදාළ ව කරුණු ගොනුකොට නිර්මාණශීලීව හා සංවිධානාත්මකව කරුණු ඉදිරිපත් කිරීම | විශේෂිත කරුණු ඉදිරිපත් කිරීම හා ඒවායේ ඇති සුවිශේෂී බව තහවුරු කිරීම | හඬ පාලනය, ආංගික අභිනය හා කාල කළමනාකරණය | කරුණු ගොනු කිරීම හා නිගමන ඉදිරිපත් කිරීම | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

වාරය : 3
උපකරණ අංක : 7
නිපුණතාව : 4.0
නිපුණතා මට්ටම : 4.2
උපකරණයේ ස්වභාවය : ව්‍යුහගත රචනා

**ක්‍රියාවලිය** : 4.2 නිපුණතා මට්ටමට අදාළ ව විෂය අන්තර්ගතයේ ඇතුළත් තේමාවන් සම්බන්ධව ව්‍යුහගත රචනාවක් ලිවීමට හැකි මාතෘකා පහක් ලබා දී ඉන් දෙකකට කාලච්ඡේදයන් දෙකක දී පිළිතුරු ලිවීමට සැලැස්වීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ඉදිරිපත් කර ඇති තොරතුරු තේමාවට අදාළ වීම | ප්‍රමාණවත් පරිදි තොරතුරු විස්තර කිරීම | තර්කානුකූලව අර්ථාන්විතව හා නිවැරදිව තොරතුරු ඉදිරිපත් කිරීම | නිරවුල්ව භාෂාව හැසිරවීම | නියමිත කාලය තුළ කාල කළමනාකරණයෙන් යුතුව පිළිතුරු සපයා තිබීම. | ලකුණු එකතුව (20 න්) | මුළු ලකුණු / 2 අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

වාරය : 3

**උපකරණ අංක** : 8

**නිපුණතාව** : 5.0

**නිපුණතා මට්ටම** : **5.1**

**උපකරණයේ ස්වභාවය** : පැවැරුම

**ක්‍රියාවලිය** : බුදුසමය හා පරිසරය අතර පවත්නා සමීප සබඳතාවත්, පරිසර සංරක්ෂණයේ ඇති කාලීන අවශ්‍යතාවත්, සෞන්දර්ය රසාස්වාදයෙන් අපට විවේකය ධාර්මිකව හා ඵලදායීව ගත කළ හැකි බවට කරුණු දක්වමින් '' සත්ත්ව ප්‍රජාවේ පැවැත්ම පරිසර හිතකාමී බවයි'' යන තේමාව ඔස්සේ කරුණු ගොනු කරන්න. (කරුණු ලබාගත් මූලාශ්‍ර සටහන් කරන්න.)

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | මාතෘකාව හැඳින්වීම | මාතෘකාවට අදාළව නිර්මාණශීලීව කරුණු ගොනු කිරීම | කරුණු ඉදිරිපත් කිරීමේ සංවිධානය හා පෙළගැස්ම | කරුණුවල ප්‍රමාණාත්මක බව | මූලාශ්‍රයන්ට අදාළව තොරතුරු ඉදිරිපත් කිරීම | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

වාරය : 3
උපකරණ අංක : 9
නිපුණතාව : 5.0
නිපුණතා මට්ටම : 5.2
උපකරණයේ ස්වභාවය : භූමිකා රංගන

**ක්‍රියාවලිය** : 5.2 නිපුණතා මට්ටමට අදාළ විෂය අන්තර්ගතය ශිෂ්‍යයන්ට ලබා දී දැහැමි ධනෝපායන මාර්ගයන්හි නියැලීමෙන් පුද්ගලයාට හා සමාජයට සිදුවන සේවයත් ඒවායින් බැහැරව ක්‍රියා කිරීමට යොමුවීම නිසා සිදුවන හානිකර තත්ත්වයන් පිළිබිඹු වන කතා වස්තුවක් නිර්මානය කොට නාට්‍යයනුසාරයෙන් රඟ දැක්වීම

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | විෂය අන්තර්ගතය කතා වස්තුව තුළ ගැබ් කිරීම | නිර්මාණය සඳහා භාවිත මාධ්‍යයේ උචිත බව | සංවිධානය, ඉදිරිපත් කිරීම, නිර්මාණශීලී බව හා කාල කළමනාකරණය | අරමුණ රංගනය තුළින් මූර්තිමත් බව | අලංකරණය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායේ සාර්ථකත්වය | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය** :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |